# ශ්‍රී ලංකාව තුළ ප්‍රජා අවකාශයෙහි තත්ත්වය අවබෝධ කර ගැනීම

ශ්‍රී ලංකාව තුළ තෝරා ගත් දිස්ත්‍රික්ක 12 ක මහජන සහභාගිත්වය සහ සමාගමයේ නිදහස පිළිබඳ අධ්‍යයනයක්



ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය

# ශ්‍රී ලංකාව තුළ ප්‍රජා අවකාශයෙහි තත්ත්වය අවබෝධ කර ගැනීම

## ශ්‍රී ලංකාව තුළ තෝරා ගත් දිස්ත්‍රික්ක 12 ක මහජන සහභාගිත්වය සහ සමාගමයේ නිදහස පිළිබඳ අධ්‍යයනයක්

2022 දෙසැම්බර්

මෙම අධ්‍යයනය සමාජ විද්‍යාඥයින්ගේ සංගමය විසින් ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය වෙනුවෙන් සිදු කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා වූ පර්යේෂණ කණ්ඩායම ශෂික් ද සිල්වා, කෞෂිනී දම්මලගේ, ඉෂාන් වීරපුර, සහ අම්මාරා නිලෆ්ඩීන් යන අයගෙන් සමන්විත විය.

# පටුන

**හැඳින්වීම** .................................................................................................... **02**

**අධ්‍යයනයෙහි අරමුණු** ........................................................................................ **04**

**ක්‍රමවේදය** .................................................................................................... **04**

1 සිද්ධි අධ්‍යයන ........................................................................................ 04

2 ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා ................................................................... 05

**විශ්ලේෂණය** .................................................................................................... **06**

**1 පුරවැසියන්ගේ කේන්ද්‍රීය ගොඩනැගීම** ......................................................... **06**

1 පුරවැසි සහභාගිත්වය පදනම් වනුයේ සාමූහික අවශ්‍යතා සපුරාලීම මත ය ............................ 07

2 ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජාව අවබෝධ කර ගැනීම සහ ඔවුන්ගේ ගැටලු මත පදනම් වූ සහභාගිත්වය ......... 08

3 පුරවැසි සහභාගිත්වය පුද්ගල අවශ්‍යතා සපුරාලීම මත පදනම් විය හැක ........................... 09

4 විසඳුම් ලබාගැනීමට තමන්ට ඇති හැකියාව සම්බන්ධයෙන් කණ්ඩායම තුළ ඇති විශ්වාසය .................. 11

5 සහභාගිත්වයේ පිරිවැය ........................................................................ 11

6 අන්තර්-ප්‍රජා අභියෝග ........................................................................ 13

7 ආගමික නායකයින්ගේ කාර්යභාරය ....................................................... 14

8 රජයේ නිලධාරීන්ගේ සහ සිවිල් සේවකයින්ගේ කාර්යභාරය ............................................ 15

9 විශ්ව විද්‍යාල සිසුන් ශක්තියෙහි මූලාශ්‍රයක් ලෙස ............................................ 15

10 දේශපාලනඥයින්ගේ බලය ................................................................ 16

11 අධෛර්යය කිරීමක් ලෙස හමුදාවේ සහ පොලීසියේ සෝදිසි කිරීම් ....................................... 17

12 යහපත් නායකත්වයක් තිබීමේ වැදගත්කම ............................................ 17

13 භාෂාව ගැටලුවක් ලෙස ........................................................................ 18

14 කම්කරු සංගම් හරහා පුරවැසි සහභාගිත්වය ........................................ 19

15 මලෙයියාහා දෙමළ ප්‍රජාවගේ ගැටලු ................................................. 19

16 පෞද්ගලික ජාල ශක්තියෙහි මූලාශ්‍රයක් ලෙස ........................................ 20

17 කාන්තාවන්ගේ මහජන සහභාගිත්වය .................................................. 20

**2 ප්‍රාදේශීය සංවිධාන මගින් අන්තර්-වාර්ගික මුලපිරීම්** ......................................... **21**

1 ඉල්ලුමක් නොමැති විට අවකාශයක් නිර්මාණය කිරීම ........................................ 22

2 සහභාගිත්වය සඳහා පෙළඹවීම ........................................................... 23

3 අන්තර්-වාර්ගික මුලපිරීම් පිළිබඳව මහජන මතය ..................................... 24

4 අන්තර්-ආගමික කටයුතු සඳහා ජාතික මට්ටමේ පිළිගැනීම ධනාත්මක සාධකයක් ලෙස ........................ 25

5 අන්තර්-ආගමික සමගිය ප්‍රගමනය කිරීමට රාජ්‍ය නිලධාරීන් අතර සැබෑ උනන්දුවක් නොමැති වීම ............ 25

6 සුළුතර ජනවාර්ගික-ආගමික ප්‍රජාවන්ගේ සහභාගිත්වය නිර්ණය කරන සාදක ................................ 26

7 ජාලයන්හි වැදගත්කම ........................................................................ 27

8 ප්‍රාදේශීය ආගමික නායකයින් සමඟ සබඳතාව නිර්ණය කිරීමේ සාධකයක් ලෙස ................................ 29

9 තම අනුගාමිකයින් වෙත ආගමික නායකයින්ගේ වෙනස්වන බලපෑම් ..................................... 30

10 සිදුවීම් සෝදිසි කිරීම බාධාවක් ලෙස ....................................................... 30

11 උනන්දුවක් දක්වන ආගමික නායකයින් සහ රජයේ නිලධාරීන් සහයෝගයෙහි ශක්තිමත් මූලාශ්‍රයක් ලෙස 30

12 වෙනත් ආගම් පිළිබඳව පූර්ව සංකල්පිත අදහස් සහ අගතීන් ....................................... 31

13 ජනවිකාශ සංයුතිය මුලපිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා නිර්ණය කිරීමේ සාධකයක් ලෙස ........................ 32

14 කුලය සහභාගිත්වය සඳහා වන බාධකයක් ලෙස ......................................... 33

**නිර්දේශ** .................................................................................................... **34**

පුරවැසියන් ඓන්ද්‍රියව ගොඩනැගීමේ සිද්ධි වලට සහාය වීමට බලාපොරොත්තු වන විභවයක් ඇති තෙවැනි පාර්ශව මුලපිරීම් සඳහා ........................................................................ 34

ප්‍රාදේශීය සංවිධාන මගින් අන්තර්-වාර්ගික මුලපිරීම් සඳහා ....................................... 36

**නිගමනය** .................................................................................................... **38**

**හැඳින්වීම**

වර්තමානයේ ආර්ථික අර්බුදයක ග්‍රහණයේ සිටින ශ්‍රී ලංකාව තුළ ප්‍රජා අවකාශය සම්බන්ධ සංවාද ජනප්‍රිය වී ඇත.[1] ක්‍රියාකාරී මහජන සහභාගිත්වය ප්‍රදර්ශනය කිරීම සඳහා මහජනතාව කුපිත කරවමින් දූෂණයට හා පාලනයට (ආණ්ඩුකරණයට) සම්බන්ධ අක්‍රමිකතා වලට අභියෝග කිරීමට සාමාන්‍ය මහජනතාව ඉදිරියට පැමිණ ඇත. එය උච්චතම අවස්ථාවට ළඟා වූයේ 2023 ජූලි 9 වෙනි දින ගෝඨාභය රාජපක්ෂ බලයෙන් පහකිරීමත් සමග ය. මෙය ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාය සඳහා සාධනීය වර්ධනයක් ලෙස බොහෝ දෙනා දුටුවහ.[2] අනෙක් අතට, සහභාගිත්වය වැඩිවීම ද සමාගමයේනිදහස සීමා කිරීම් වැනි දුෂ්කරතා වලින් පිරී ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වැනි දැනට පවතින නීති මෙන්ම, වෙනත් අවිධිමත් එහෙත් සංවිධානාත්මක කණ්ඩායම් එවන් සහභාගිත්වය මර්දනය කිරීමට භාවිතා කර ඇත. ශ්‍රී ලංකාව මෑත කාලීනව ජාතික මට්ටමින් දුටු වඩාත්ම ක්‍රියාකාරී මහජන සහභාගිත්වය මෙය වුවද, ප්‍රාදේශීය මට්ටමින් තමන්ගේම ප්‍රජාවන් තුළ විටින් විට ඔවුන්ගේ ගැටළු ප්‍රකාශ කිරීමට ජනතාව ද ප්‍රජා අවකාශය ඵලදායී ලෙස භාවිතා කර ඇත.

ශ්‍රී ලාංකිකයෝ ප්‍රජා මූල සංවිධාන හරහා සාම්ප්‍රදායිකව ප්‍රජා අවකාශ භාවිතා කර ඇත.[3] අවමංගල්‍ය සමිති සහ ආගමික කමිටු රට පුරා දක්නට ලැබෙන පුළුල්ව පැතිරී ඇති ප්‍රජා මූල සංවිධාන සඳහා උදාහරණ දෙකකි.[4] මෙම සාම්ප්‍රදායයික ප්‍රජා මූල සංවිධාන වලට අමතරව, ජාතික මට්ටමේ අරගලයක් දක්වා වර්ධනය වී නොමැති නමුත්, ප්‍රාදේශීය මට්ටමේ විශේෂිත අසාධාරණයක් කෙරෙහි බොහෝ දුරට අවධානය යොමු කර ඇති විශේෂිත අසාධාරණයන්ට එරෙහිව සටන් කිරීම සඳහා සමාජ ව්‍යාපාර/සාමුහික හෝ ප්‍රජා මූල සංවිධාන ලෙස ජනතාව කණ්ඩායම් ලෙස එක් වන අවස්ථාද තිබී ඇත. කෙසේවෙතත්, මෙම සාමුහිකයන්ගෙන් සමහරක් සහ ඔවුන් හෙළි දරව් කර ඇති අසාධාරණයන් ජාතික මට්ටමේ දේශපාලනය සමග ඔවුන්ට ඇති සමීප සංගමයෙහි ප්‍රතිඵලයක් ලෙස ජාතික අවධානයට ලක්ව ඇත. සමහර උදාහරණ ලෙස මීතොටමුල්ල කසළ කන්දට[5] එරෙහි ජනතා ව්‍යාපාරය, ජල දූෂණයට එරෙහි රතුපස්වල ව්‍යාපාරය,[6] උමා ඔය අරගලය[7] සහ වෙනත් ඒවා ඇතුළත් වේ. ඊට සමගාමීව ජාතික මට්ටමේ අවධානයට ලක් නොවන තවත් බොහෝ ව්‍යාපාර ප්‍රජා අවකාශය තුළ පවතී. මෙම සාමුහිකයන් ඉඩම් අයිතිය වෙනුවෙන්, රාජ්‍ය සම්පත් අසමානව බෙදා දීමට එරෙහිව, අලි මිනිස් ගැටුමට විසඳුම් සඳහා, පිරිසිදු ජලය, යනාදිය සඳහා සටන් කළ හැකිය. මෙම සමහර අරගල වල ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ ඉල්ලීම් පූර්ණ හෝ අර්ධ වශයෙන් ඉටුවේ. සමහර සාමුහිකයන් ද විසඳුමක් නොලබා අත්හැර දමති. එවැනි කේන්ද්‍රීයව ගොඩනැගුණු සාමුහික වල සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය නිර්ණය වන්නේ ඔවුන්ගේ අදාළ ප්‍රජාවන්හි ප්‍රජා අවකාශයෙහි ස්වභාවය අනුව ය.

---

1 "Civic space is the environment that enables people and groups – or 'civic space actors' – to participate meaningfully in the political, economic, social and cultural life in their societies. Vibrant civic space requires an open, secure and safe environment that is free from all acts of intimidation, harassment and reprisals, whether online or offline. Any restrictions on such a space must comply with international human rights law." (UN Guidance Note on Protection and Promotion of Civic Space). Extracted from: https://fra.europa.eu/nl/cooperation/civil-society/civil-society-space#:~:text=%E2%80%9CCivic%20space%20is%20the%20environment,cultural%20life%20in%20their%20societies.

2 Uyangoda, J. (2022a, July 19). Taking Aragalaya Ideas Seriously. Groundviews. https://groundviews.org/2022/07/19/taking-aragalaya-ideas-seriously/
Uyangoda, J. (2022b, August 16). Bringing Democracy Back Through People's Power. Groundviews. https://groundviews.org/2022/08/16/bringing-democracy-back-through-peoples-power/

3 Uyangoda, J. (2020). *Civil Society: What is it? For whom? For what?* (3rd ed.). Social Scientists' Association.

4 Ibid.
Findings from "Youth as a Catalyst for Political Change", study conducted by the Social Scientists' Association between February to April 2022. Report Unpublished.

5 *Meethotamulla tragedy: Consequences of negligence and lethargy?* (2017). Daily News. https://dailynews.lk/2017/04/17/features/113310/meethotamulla-tragedy-consequences-negligence-and-lethargy

6 *Sri Lanka: Investigate "Clean Water" Protest Deaths*. (2013, August 9). Human Rights Watch. https://www.hrw.org/news/2013/08/09/sri-lanka-investigate-clean-water-protest-deaths

7 *Uma Oya boils over with protests*. (2017). Lankainformation.lk. https://lankainformation.lk/news/latest-news/item/16281-uma-oya-boils-over-with-protests

මෙම සන්දර්භය සැලකිල්ලට ගෙන, මෙම සාමුහිකයන් සෑදීම හරහා අපේක්ෂිත අරමුණු සපුරා තිබේ ද, සහ එසේ නොවේ නම්, ඒවා සපුරා නොගැනීමට හේතු මොනවා දැයි අනුව ඒවායේ පැන නැගීම නිර්ණය කිරීම සඳහා ප්‍රාදේශීය ප්‍රජා අවකාශය තුළ මෙම ඓන්ද්‍රියව ගොඩ නගා ඇති සාමුහිකයන් විමර්ශනය කිරීම ඉතා වැදගත් වේ. මෙය ශ්‍රී ලංකාව තුළ ප්‍රජා අවකාශය ක්‍රියාකරන්නේ කෙසේද යන්න පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට ඉඩ සලසයි. හුදකලාව පරීක්ෂා කළ ද, වඩා පුළුල් ක්‍රමවේදයෙහි වෙනසක් ළඟා කර ගැනීමට ප්‍රාදේශීය සිද්ධි උපකාරී නොවනු ඇත. එවැනි සාමුහික තිබීම සහ ඒවායින් ලැබෙන පාඩම් මගින්, අවශ්‍ය විශ්වාසය, දැනුම සහ ප්‍රජා අවකාශය ඵලදායී ලෙස භාවිතා කරන ක්‍රියාකාරී පුරවැසියන් වීමට ජනතාව සඳහා පුහුණුව ලබා දිය හැකිය. ශ්‍රී ලාංකිකයන් අතර පුරවැසිභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා දිගුකාලීනව මෙය වැදගත් වේ. තවද, ශ්‍රී ලංකාව තුළ ප්‍රජා අවකාශය ශක්තිමත් කිරීමට ක්‍රියා කරන සංවිධාන බිම් මට්ටමේ සිටම ආරම්භ කිරීම ඉතා වැදගත් වේ.

ප්‍රාදේශීය මට්ටමේ පුරවැසි අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීම සඳහා පිහිටුවා ඇති ඉහත කී සාමුහිකයන් හැරුණු විට, ප්‍රජා අවකාශය තුළ අන්තර්-ප්‍රජා මුලපිරීම් ද[8] සිදුවේ. කෙසේවෙතත්, එවැනි ක්‍රියාකාරකම් වල මහජන සහභාගිත්වයේ සහ සමාගමයේනිදහසෙහි ස්වභාවය ඉහත සාකච්ඡා කළ ඓන්ද්‍රියව පිහිටුවා ගත් ඒවායේ ස්වභාවයට වඩා වෙනස් විය හැක. මෙවැනි ක්‍රියාකාරකම් බෙහෙවින්ම සිදු කරනු ලබන්නේ රජයේ[9] සහ රාජ්‍ය නොවන සංවිධාන[10] වල සහාය ඇතිව ය. එවැනි අන්තර්වාර්ගික මුලපිරීම් වල වැදගත්කමේ වර්ග දෙකක් පවතී. එක් අතකට, ප්‍රජා අවකාශය සුළුතර කණ්ඩායම් වලට වඩාත් ගැලපෙන පරිදි සකස් කිරීම අවශ්‍ය විය හැක.[11] අනෙක් අතට, සුළුතර ජනවාර්ගික-ආගමික කණ්ඩායම් වලට බලපෑම් කරන අසාධාරණයන්ට ප්‍රාදේශීය ප්‍රජාවන් සංවේදී කිරීම අවශ්‍ය විය හැක.[12] ඒ අනුව, සමස්තය ඇතුළත් කිරීමට ඉඩ සැලසීම, සමාගමයේනිදහස සහතික කිරීම සහ ජනවාර්ගික- ආගමික සුළුතර ප්‍රජාවන්ට සහභාගි වීමට අවකාශයක් නිර්මාණය කිරීම සඳහා අන්තර්වාර්ගික මුලපිරීම් ශක්තිමත් කළ යුතු ය.

[8] 'Inter-communal initiatives' is the collective term used to refer to programmatic interventions to advance areas of peacebuilding, inter-religious harmony, prevention of hate speech and pluralism.

[9] For example, the Office of National Unity and Reconciliation (ONUR). ONUR is an entity under the Ministry of Justice with the goal of promoting harmony and unity among people in Sri Lanka while celebrating diversity. ONUR is committed to creating a society where everyone respects the fundamental rights, freedom, and equality of all communities.

[10] For example, organizations such as the National Peace Council, Search for Common Ground and MinorMatters

[11] Prevalence of hate speech at the local level in Sri Lanka: An expert opinion poll with selected religious and community leaders from 12 districts. (2022). National Peace Council.

[12] A Review of the State of Religious Freedom in Sri Lanka. (2022). MinorMatters. https://www.minormatters.org/storage/app/uploads/public/632/ad8/cad/632ad8cad2ca0916665134.pdf

**අධ්‍යයනයෙහි අරමුණු**

මෙම පර්යේෂණය ශාස්ත්‍රීය සහ ප්‍රායෝගික පරමාර්ථ යන දෙකම ඉෂ්ට කිරීමට අදහස් කරයි. එක් අතකට, එය මිනිසුන් ප්‍රජා අවකාශයන් තුළ නිරත වන්නේ කෙසේද යන්න තේරුම් ගැනීමට උත්සාහ දරයි. මෙය ශ්‍රී ලංකාවේ සමාජීය, දේශපාලනික, සංස්කෘතික, සහ ආර්ථික සන්දර්භය තුළ ප්‍රජා අවකාශයෙහි කාර්යය අධ්‍යයනය කිරීමට උනන්දුවක් දක්වන අයට ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වේ. කෙසේවෙතත්, මෙම අධ්‍යයනය ප්‍රාථමිකව සැලසුම් කර අවධානය යොමුකර ඇත්තේ ප්‍රායෝගික අභිමතාර්ථයක් කෙරෙහි ය. එනම් ශ්‍රී ලංකාව තුළ ප්‍රජා අවකාශය ශක්තිමත් කිරීම සඳහා මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමේ දී සලකා බැලිය යුතු සාධක පිළිබඳව අවබෝධයක් ලබා දීම ය. මෙම අධ්‍යයනය ඉදිරියේදී ජාතික සාම මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන අන්තර්වාර්ගික මුලපිරීම් වලට අධ්‍යයනය වඩාත් උචිත කිරීම සඳහා අන්තර්වාර්ගික මුලපිරීම් සිදු කිරීමට පුරවැසි සහභාගිත්වය සහ සමාගමයේනිදහස සඳහා පවතින ප්‍රජා අවකාශය පරීක්ෂා කරන ලදී.

ඉහත කී කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා අධ්‍යයනය මගින් පහත ලැයිස්තු ගත කර ඇති විශේෂිත පර්යේෂණ ප්‍රශ්න කෙරෙහි අවධානය යොමු කරන ලදී.

1. තෝරාගත් ශ්‍රී ලංකීය දිස්ත්‍රික් වල ප්‍රජා අවකාශය තුළ පුරවැසි සහභාගිත්වයෙහි ස්වභාවය කුමක්ද?
2. තෝරාගත් ශ්‍රී ලාංකීය දිස්ත්‍රික්ක වල ප්‍රජා අවකාශ තුළ සමාගමයේනිදහසෙහි ස්වභාවය කුමක්ද?
3. ඓන්ද්‍රියව පිහිටුවන ලද ජනතා ව්‍යාපාර සහ අන්තර්වාර්ගික ක්‍රියාකාරකම් වල පුරවැසි සහභාගිත්වය සහ සමාගමයේනිදහස අතර පවතින වෙනස්කම් මොනවාද?
4. ප්‍රාදේශීය මට්ටමේ පුරවැසි සහභාගිත්වය වැඩි කිරීමට සහ සමාගමයේනිදහස ස්ථාපිත කිරීමට තෙවැනි පාර්ශව මැදිහත් වීම් හරහා කළ හැක්කේ මොනවාද?

**ක්‍රමවේදය**

අධ්‍යයනයේ ක්‍රමවේදය ප්‍රධාන සංරචක දෙකකින් සමන්විත විය.

**1. සිද්ධි අධ්‍යයන (ඓන්ද්‍රියව පිහිටුවන ලද සාමූහිකයන් සමග සිදු කරන ලදී)**

- මෙම අධ්‍යයනයෙහි සිද්ධි අධ්‍යයන, බදුල්ල, මොනරාගල, මාතර, යාපනය සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක 5 තුළ සිදු කරන ලදී.
- සිද්ධි අධ්‍යයන, තම ප්‍රජාවන් තුළ අයිතීන් සම්බන්ධ ගැටළු පිළිබඳව කටයුතු කරන ප්‍රජා මූල සංවිධාන/ප්‍රාදේශීය කණ්ඩායම්/සාමූහිකයන් සමග සිදු කරන ලදී.
- සිද්ධි අධ්‍යයන සඳහා දත්ත එක්රැස් කරනු ලැබුවේ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා (පිරිමි කණ්ඩායම් 10-5 ක් සහ කාන්තා කණ්ඩායම් 5) සහ සහභාගිත්ව නිරීක්ෂණ (1) හරහා ය.
- සමාජ විද්‍යාඥයින්ගේ සංගමයෙහි පර්යේෂණ කණ්ඩායම විසින් සිද්ධි අධ්‍යයන සංරචකය සිදු කරන ලදී.
- සිද්ධි අධ්‍යයන සඳහා දත්ත 2022 සැප්තැම්බර් අග සිට නොවැම්බර් දක්වා එක්රැස් කරන ලදී.
- මෙම අධ්‍යයනය සඳහා සම්පූර්ණයෙන් සිද්ධි අධ්‍යයන 6 ක් සිදු කරන ලදී.

**සිද්ධි අධ්‍යයන 6 හි සාරාංශය**

➢ වැල්ලවායේ ඉඩම් ගැටළුව

ප්‍රජා සාමාජිකයින් පවසන පරිදි, තම ගම්මානයේ ඉඩම් අක්කර දහස් ගණනක් කෘෂිකාර්මික සමාගමකට බදු දී ඇත. මෙහිදී වගා කිරීම් සඳහා එක් පවුලක් සඳහා ආසන්න වශයෙන් අක්කර 4.5 ක් ද එම ජනතාවට පදිංචි වීමට අවශ්‍යය නිවස සාදා ගැනීම සඳහා වෙනම අක්කර භාගයක පමණ කොටසක් ද වෙන් කර ඇත. ප්‍රදේශවාසීන් මෙම ඉඩමෙහි නිවාස ඉදිකර තිබියදී වුවද, ඔවුන්ට මෙම ඉඩමට හෝ දේපළ වලට අයිතිය හෝ ඔප්පු නොමැත. මෙම සමාගම ජනාවාස පාලනය කරන අතර, අවශ්‍ය කරන ලියකියවිලි නොමැති වීම

හේතුවෙන් රාජ්‍ය සේවාවන් වෙත ප්‍රවේශ වීමේදී ගැටළු ඇති කිරීමට හේතු වී ඇත. 2016 වසරේ සිට එක් සාමූහිකයක් ඔවුන්ගේ ඉඩම් අයිතිය වෙනුවෙන් සටන් කර ඇත. ඔවුන්ගේ අරගලයේ ප්‍රතිඵලයක් ලෙස ජනාවාස තුනක පවුල් 152 කට නේවාසික බලපත්‍ර ලැබී ඇති අතර, සාමූහිකය මේ වන විට ඔවුන්ගේ ඉඩම් ඔප්පු අත්කර ගැනීමට කටයුතු කරමින් සිටී.

- මාතර ගොවීන්ගේ ගැටළුව

ප්‍රජා සාමාජිකයින් පවසන පරිදි, 2012 වසරේදී, පානීය ජලයට මුහුදු ජලය මිශ්‍රවීම වැළැක්වීම සඳහා නිල්වලා ගඟ හරහා ලවණ බාධකයක් ඉදි කිරීමට යෝජනා කර තිබුණි. යෝජිත ඉදිකිරීමෙන් පසුව, 2017 වසරේ, වී වගා ඉඩම් අක්කර 5500 ක් පමණ නිරන්තරව ගංවතුරට යටවීම හේතුවෙන් වගා කිරීමේදී ගැටළු ඇතිවිය. විපතට පත් විවිධ ප්‍රදේශ වල ගොවීහු කණ්ඩායමක් මෙම ගැටළුවට විසඳුම් ලබාදෙන ලෙස අදාළ බලධාරීන්ට බලකිරීමට එක්ව සිටිති.

- මඩකලපුවේ ඉඩම් ගැටළුව

ප්‍රජා සාමාජිකයින් පවසන පරිදි, 1990 දශකයේදී, මඩකලපුවේ ප්‍රදේශයක පවුල් 72 ක් ඉවත් කර හමුදා කඳවුරක් ඉදි කර ඇත. මෙම ඉඩම කඳවුරක් ලෙස අත්පත් කර ගැනීම වෙනුවෙන් හමුදාව විසින් ඉවත් කළ පවුල් වලට වන්දි ලබා දී ඇත. වන්දි මුදල ගැන සෑහීමකට පත් නොවූ ජනතාව ඉඩම් ආපසු ලබාදෙන ලෙස ඉල්ලති. තවද, විනාශ වූ තම නිවාස යළි ඉදිකර දෙන ලෙෂ ද ඔවුහු ඉල්ලා සිටිති.

- යාපනය ඉඩම් ගැටළුව

ප්‍රජාවේ සාමාජිකයින් පවසන පරිදි, යුද්ධය අතරතුර යාපනයේ ප්‍රදේශයක ඉඩම් අක්කර දහස් ගණනක් " අධි ආරක්ෂිත කලාප, ලෙස ප්‍රකාශ කරන ලදී. එම ප්‍රදේශයේ ජීවත් වූ ජනතාව වෙනත් තැන්වල පදිංචි කර ඇත. යුද්ධය අවසන් වීමෙන් පසු, අවස්ථා කිහිපයකදී මුළු ප්‍රදේශයෙන් කොටස් වශයෙන් ඉඩම් නිදහස් කරන ලදී. කෙසේනමුත්, ප්‍රදේශවාසීන් පවසන පරිදි, ආසන්න වශයෙන් අක්කර 3000-4000 ක් පමණ තවමත් හමුදා පාලනය යටතේ පවතී. ප්‍රදේශවාසීන් පවසන්නේ හමුදාව මෙම ඉඩම් වල අනීතික ලෙස වගා කිරීම සහ බෞද්ධ විහාරස්ථාන ඉදි කරන බව ය. අධි ආරක්ෂිත කලාප ගැසට් පත්‍රය ඉවත් කර ඉඩම් නිදහස් කරදෙන ලෙස ඉල්ලා ප්‍රජාවක් එක්වී සිටිති.

- මහියංගනයේ අලි - මිනිස් ගැටුම

අලි-මිනිස් ගැටුමට විසඳුමක් ලබා ගැනීම සඳහා මහියංගනය ප්‍රදේශයේ උනන්දුවක් දැක්වූ කණ්ඩායමක් එකතුවී සාමූහිකයක් පිහිටුවා ගත්හ. අලි ඇතුන් නිරන්තරයෙන්ම ඔවුන්ගේ වගාවන්ට හා දේපළ වලට හානි කර ඇත. බලධාරීන්ගෙන් සෑහීමකට පත්විය හැකි කිසිදු ප්‍රතිකාරයක් නොලැබීම හේතුවෙන් ඔවුහු විරෝධතාවයක් පැවැත්වීමට තීරණය කළහ.

- ඇටම්පිටිය ඉඩම් ගැටළුව

ඇටම්පිටියේ ප්‍රජාවක් අමතර තේ වගා කිරීම සඳහා අතහැර දමා තිබුණු වතු ඉඩම් භාවිතා කර ඇත. මෙම ප්‍රජාවේ බොහෝ සාමාජිකයෝ වත්තේ වැඩ කරති. ඔවුන් තේ වගා කළ ඉඩම් වල පාලනය වතු කළමනාකාරිත්වය විසින් යළි පවරා ගෙන ඇතැයි පැවසේ. තවද, ප්‍රජාවේ සාමාජිකයින්ට නොදී, පිටස්තර පුද්ගලයින්ට ඉඩම් පරිහරණය කිරීමට අවසර දී ඇති බවට ප්‍රජාවෝ පැමිණිලි කරති. මේ වෙනුවෙන් යුක්තිය පතා දැන් ඔවුහු එක් වී සිටිති.

## 2. ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා (අන්තර්-වාර්ගික මුලපිරීම් වලට සම්බන්ධ වී සිටින පුද්ගලයින් සමග පවත්වා ඇත)

- මෙම අධ්‍යයනය සඳහා ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා තෝරා ගත් දිස්ත්‍රික්ක 12 ක් හරහා පවත්වන ලදී (පහත 1 වන වගුව බලන්න).
- ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා සංරචකය මූලික වශයෙන් අන්තර්-වාර්ගික මුලපිරීම් පිළිබඳ සංවිධානයික කටයුතු සම්බන්ධයෙන් උනන්දුවක් දැක්වීය. ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා පවත්වනු ලැබුවේ ඔවුන්ගේ පෙදෙස් වල ජාතික සාම මණ්ඩලයෙහි බිම් මට්ටමේ හවුල්කාර සංවිධානය මගින් සංවිධානය කරන ලද විවිධ අන්තර්-වාර්ගික මුලපිරීම් වලට සහභාගි වූ මහජනතාව සමග ය.
- තෝරාගත් දිස්ත්‍රික්ක 12 න් පහක ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා පවත්වන ලද්දේ සමාජ විද්‍යාඥයින්ගේ සමාගමයේපර්යේෂණ කණ්ඩායම විසිනි. ඉතිරි දිස්ත්‍රික්ක 7 තුළ ඉලක්ක කණ්ඩායම්

සාකච්ඡා පවත්වන ලද්දේ, සාමය ගොඩනැගීම සහ සමාජ ඒකාබද්ධතාවය යන ක්ෂේත්‍ර වල වැඩ කරන තමන්ගේ ප්‍රජා සම්පත් සංචිතයේ කොටසක් ලෙස කලාපීය මට්ටමේ දී ජාතික සාම මණ්ඩලයට අනුබද්ධ ප්‍රධාන පුහුණුකරුවන් විසිනි. (දිස්ත්‍රික් මට්ටමේ විස්තර සඳහා 1 වැනි වගුව බලන්න).

- ක්ෂේත්‍ර කාර්යයන් ඉටු කිරීමට පෙර, ගුණාත්මක විමර්ශනයක් කරන අන්දම, ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා සිදු කිරීමේදී මතක තබාගත යුතු ප්‍රධාන කරුණු, සහ සදාචාරාත්මක සලකා බැලීම් පිළිබඳව පර්යේෂණ කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකයකු විසින් ප්‍රධාන පුහුණුකරුවන්ට එක් දිනක පුහුණුවක් ලබා දෙන ලදී. ප්‍රධාන පුහුණුකරුවෝ තමන්ගේ අදාල දිස්ත්‍රික්ක වල ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා සුමටව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා පර්යේෂණ කණ්ඩායම සමඟ සමීපව සහයෝගයෙන් කටයුතු කළහ.
- ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා ආගම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සමස්තය ඇතුළත් කිරීම සඳහා විශේෂ සැලකිල්ලක් සහිතව රචනා කරන ලදී.
- 2022 ඔක්තෝබර් සහ නොවැම්බර් මාස තුළ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා පවත්වන ලදී.

| සමාජ විද්‍යාඥයින්ගේ සංගමය | ජාතික සාම මණ්ඩලයේ ප්‍රධාන පුහුණුකරුවෝ |
|---|---|
| 1. බදුල්ල<br>2. මොනරාගල<br>3. මාතර<br>4. යාපනය<br>5. මඩකලපුව | 1. අනුරාධපුරය<br>2. කුරුණෑගල<br>3. පොලොන්නරුව<br>4. මහනුවර<br>5. කලුතර<br>6. කෑගල්ල<br>7. රත්නපුර |

*1 වන වගුව : සමාජ විද්‍යාඥයින්ගේ සංගමය සහ ප්‍රධාන පුහුණුකරුවන් විසින් පවත්වන ලද ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා වල දිස්ත්‍රික්ක අනුව විස්තර*

- සමාජ විද්‍යාඥයින්ගේ සමාගමයේපර්යේෂණ කණ්ඩායම තෝරාගත් දිස්ත්‍රික්ක 5 ක ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා 18 ක් පවත්වන ලදී. ඉතිරි දිස්ත්‍රික්ක 7 තුළ ප්‍රධාන පුහුණුකරුවන් විසින් ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා 27 ක් පවත්වන ලදී. දිස්ත්‍රික්ක 12 පුරාවට පැවැත්වූ සම්පූර්ණ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා සංඛ්‍යාව 45 ක් විය.


සිද්ධි අධ්‍යයන සහ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා හැරුණු විට, පර්යේෂණ කණ්ඩායම් විසින් ප්‍රවීණයන් විසින් සම්මුඛ සාකච්ඡා 10 ක් ද පවත්වන ලදී.

**විශ්ලේෂණය**

මෙම කොටස උප කොටස් දෙකකට බෙදා ඇත. පළමු උප කොටස අවධාරණය කරනු ලබන්නේ සුවිශේෂී ගැටළු වෙනුවෙන් සටන් කරන ප්‍රජා මූල සංවිධාන/ප්‍රාදේශීය කණ්ඩායම්/සාමූහිකයන්ගේ *ඓන්ද්‍රීය ගොඩනැගීම* හා ස්වභාවයයි. මෙම ගැටළු බොහෝමයක් ඔවුන්ගේ ප්‍රජාවන් තුළ හෝ දෛනික ජීවිතයේදී මුහුණ දෙන අයිතීන් සම්බන්ධ ගැටළු වේ. දෙවැනි උප කොටස බහුත්ව වාදය, වෛරී කථනය, හෝ ආගමික සමගිය වැනි හේතූන් ප්‍රගමනය සඳහා *සංවිධාන හරහා ජනතාව කණ්ඩායම් ලෙස එක්වන ආකාරය* ගැන සොයා බලයි. මෙම උප කොටස් දෙකම මෙම හේතූන් සෑම එකක්ම ඉදිරියට ගෙන යාමේ දී මහජන සහභාගිත්වයේ සහ සමාගමයේනිදහසෙහි ස්වභාවය ගැන සාකච්ඡා කරයි.

**1. පුරවැසියන්ගේ කේන්ද්‍රීය ගොඩනැගීම**

මෙම කොටස තුළ, අප සම්බන්ධ වන්නේ ප්‍රාදේශීය මට්ටමේ දී පුරවැසියන් කණ්ඩායම් ලෙස හෝ සාමූහිකයන් ලෙස ඓන්ද්‍රියව ගොඩනැගීම සිදුවන්නේ මන්ද සහ කෙසේද, මෙය ඔවුන්ගේ පුරවැසිභාවය තියුණු කර ඇත්තේ කෙසේද, ඔවුන් භුක්ති විඳින සමාගමයේ නිදහස සහ එයට අභියෝග කර ඇති ආකාරයන් මොනවාද යන ප්‍රශ්න සමඟ ය. මෙම ප්‍රශ්න වලට පිළිතුරු සපයන විට, පුරවැසිභාවය ක්‍රියාත්මක වන බවද, නමුත්, එය සිදුවන්නේ ප්‍රාදේශීය මට්ටමින් පුරවැසිභාවයේ භාවිතාවන්ට බලපෑම් කරන වෙනත් බොහෝ පාර්ශවකරුවන් සිටීමත් සමඟ වන බවද, අපි හඳුනා ගනිමු (කරුණාකර 1 වන රූපය බලන්න). මේ අනුව, මෙම හඳුනාගත් පාර්ශවකරුවන්ගේ කාර්යය සහ ඔවුන්ගේ අපේක්ෂාවන්ට ද ප්‍රාදේශීය මට්ටමින් පුරවැසියන්ගේ ඓන්ද්‍රිය ගොඩනැගීම විශ්ලේෂණය කරන විට වැදගත්කම ලබා දේ. තවද මෙම කොටස කාන්තාවන් සහ සුළුතරයින් ප්‍රාදේශීය මට්ටමේදී ඔවුන්ගේ පුරවැසිභාවය භාවිතයට ගන්නා විට සුවිශේෂී අභියෝග වලට මුහුණ දෙන ආකාරයන් ගැන ද නිශ්චිත විශ්ලේෂණයක් ලබා දෙයි.




*1 වන රූපය: ප්‍රජා අවකාශය තුළ මහජන සහභාගිත්වයට බලපෑම් කරන පාර්ශවකරුවෝ*

### 1. පුරවැසි සහභාගිත්වය පදනම් වනුයේ සාමූහික අවශ්‍යතා සපුරාලීම මත ය

- කිසියම් ප්‍රජාවක පුරවැසි සහභාගිත්වය මූලිකව පොළඹවනු ලබන්නේ එම ප්‍රජාව මුහුණ දෙන සුවිශේෂිත ගැටළුවක් මගින් ය. බොහෝ අවස්ථාවලදී මෙම ගැටළු ප්‍රජාව මුහුණ දෙන අයිතීන් උල්ලංඝනය කිරීම් හෝ අසාධාරණයන් වේ. ගුණාත්මක සාකච්ඡා පුරාවටම පැහැදිලිව ප්‍රකාශ කෙරුණේ, මතුවී තිබෙන නිශ්චිත ප්‍රශ්නය ජය ගැනීම ඔවුන්ගේ අභිලාෂය වූ බවයි. මෙහිදී යහ පාලනයේ ගුණධර්ම රැක ගැනීමේ චේතනාවක් පෙන්වූයේ නැත[13]ග මෙය අනිවාර්යයෙන්ම නරක දෙයක් නොවේ. කෙසේනමුත්, ප්‍රජා අවකාශය තුළ මහජන සහභාගිත්වය සහ ඔවුන්ගේ


[13] What is Good Governance? [Review of What is Good Governance?]. United Nations Economic and Social Commission for Asia and the Pacific. https://www.unescap.org/sites/default/files/good-governance.pdf

පුරවැසිභාවය සාක්ෂාත් කර ගැනීම බොහෝ දුරට නිර්ණය වන්නේ කිසියම් ප්‍රජාවක් මුහුණ දෙන නිශ්චිත ගැටළු මගින් බව හඳුනා ගැනීම වැදගත් වේ.

- යාපනයේ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවකදී ප්‍රතිචාරකයෙකු පැවසුවේ"අපගේ ප්‍රදේශ ගැසට් පත්‍රයක් හරහා අධි ආරක්ෂිත කලාප බවට පත් කර ඇති අතර, අපගේ ඉඩම් අත්පත් කර ගෙන තිබෙනවා. මේ තාක් කල්, නිදහස් කර ඇත්තේ අක්කර 3000 ක් තරම් පමණකි. ආරක්ෂක හේතූන් මත මෙම ඉඩම් ඔවුන් විසින් ලබාගෙන තිබුණද, හමුදාව විහාරස්ථාන ඉදිකර, අපගේ ඉඩම් වගාව සඳහා භාවිතා කරනවා. අපට අවශ්‍ය වන්නේ ඔවුන් අපේ ඉඩම් ආපසු ලබාදීමයි."
- මාතරදී පැවැත්වූ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් වාර්තා කළේ *නිල්වලා යෝජනා ක්‍රමය* යටතේ සිදු කළ ලවණ බාධකය හා ඉදි කිරීම් හේතුවෙන්, ඔවුන් වගා කළ ඉඩම් දැන් ගංවතුරට යටවන බවයි."මෙම ගැටලු පාදක හේතුවෙන්, අක්කර කිහිපයකින් පවා අස්වැන්න නෙලා ගැනීම අපට දුෂ්කර වී තිබෙනවා. මේ වනවිට ඉඩම් වල සමහර කොටස් ජලය නිසා වගුරු බිම් බවට පත්ව තිබෙනවා. මෙම ස්ථාන"අනාරක්ෂිත ප්‍රදේශ□ ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන් අපගේ ගැටලුව ආමන්ත්‍රණය කිරීම සම්පූර්ණයෙන්ම මඟ හැරීමට රජය උත්සාහ දරනවා."
- මහියංගනයේ පැවති විරෝධතා වලට සහභාගි වූ ප්‍රතිචාරකයෙක් පැවසුවේ,"අපට අවශ්‍ය වන්නේ අපගේ ගොවිතැනෙහි නිරත වී අපගේ වැඩ වල යෙදීමයි. අපට අලි-මිනිස් ගැටුම විසඳා දෙන්න. එය අපට ප්‍රමාණවත්" යනුවෙනි.

**2. ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජාව අවබෝධ කර ගැනීම සහ ඔවුන්ගේ ගැටලු මත පදනම් වූ සහභාගිත්වය**

- සිත්ගන්නා සුළු කරුණ වන්නේ, "ප්‍රජාව" යන සංකල්පය ස්ථිර නොවන අතර, එය යම්කිසි වේලාවක පැන නගින ගැටලු මගින් අර්ථ දක්වනු ලබයි. උදාහරණයක් වශයෙන්, යම්කිසි ග්‍රාමයක, ගොවීන් ඔවුන්ට බලපාන යම් දෙයක් වෙනුවෙන් සටන් කළ හැක, තම ඉඩම් වලට ඔප්පු නොමැති අය තම ඔප්පු වෙනුවෙන් සටන් කළ හැක, සහ අලි-මිනිස් ගැටුමෙන් සෘජුවම බලපෑමට ලක් වන ජනතාව විසඳුම් ඉල්ලා සටන් කළ හැකිය (කරුණාකර 2 වන රූපය බලන්න). ප්‍රතිඵලයක් ලෙස, එකම ග්‍රාමයක් තුළ පවා, නිශ්චිත ගැටලු සම්බන්ධව කටයුතු කරන වඩා විශාල ප්‍රජාව තුළ ද විවිධ උප-කණ්ඩායම් හරහා ප්‍රජා අවකාශය තුළ ප්‍රජාවේ සහභාගිත්වය සිදුවිය හැක. සමාජ විද්‍යාඥයින්ගේ සංගමය මගින් තරුණ තරුණියන්ගේ දේශපාලන සහභාගිත්වය පිළිබඳව මෑතකදී සිදු කළ අධ්‍යයනයකට අනුව, යම් ග්‍රාමයක, රසායනික පොහොර තහනමට විරුද්ධ වූයේ ගමෙහි ගොවීන් පමණක් වූ අතර, මෙම කාලය අතරතුර ගොවීහු තම කෘෂිකාර්මික වැඩ කටයුතු වල අධික ලෙස කාර්යබහුල වූ බැවින් මෙම ගොවීහු *ගෝඨාගෝගම* විරෝධතාවයට සහාය දැක්වීමට සහභාගි නොවූහ. ඒ වෙනුවට ඉන්ධන සැපයුම නොමැති කමින් කලකිරුණු ගමේ තරුණ තරුණියෝ ඊට සහභාගි වූහ.




*2 වන රූපය: ගැටලු පාදක කොටගත් ප්‍රජාවන් ගොඩ නැගීම*

- ඇටම්පිටියේදී හෙළිදරව් වූයේ ඉඩම් අයිතීන් ඉල්ලා සිදු කරන අරගල වලට සහභාගි වන්නේ ඉඩම් ගැටලුවෙන් පීඩාවට පත් වතු ප්‍රජාවන්ගේ පුද්ගලයින් පමණක් වන බවයි."අනෙකුත් වතු වල හෝ අපගේ වතු වල කිසිදු ඉඩම් ගැටලුවක් නොමැති සාමාජිකයෝ අපගේ මුලපිරීම් වලදී අප සමග සහභාගි වීම හෝ අපට සහාය දැක්වීම කරන්නේ නැහැ. ඔවුන් කරදර වන්නේ වතු බලධාරීන් සමග පවතින සම්බන්ධතාව විනාශ වීම ගැනයි."


- එමෙන්ම, මහියංගනයේදී, අලි-මිනිස් ගැටලුවට විසඳුම් ඉල්ලා විරෝධතාවන්ට සහභාගි වන්නේ එම ගැටලු වලින් පීඩාවට පත් වන අය පමණක් බව අනාවරණය විය. විරෝධතාවයට සහභාගි වූ භික්ෂූන්වහන්සේ, ව්‍යාපාරික ප්‍රජාව, ගොවීන් මෙම ගැටලුවෙන් සෘජුවම පීඩාවට පත් අය බැවින්, මෙම ගැටලුවට විසඳුමක් ලබාගැනීමට තමන්ට හිමි අපේක්ෂාවක් තිබුණු අය වූහ.

- මාතර පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවේ ප්‍රතිචාරකයෙක් අනාවරණ කළේ, "මේ කණ්ඩායම් දෙකක් සිටිනවා, විරෝධතා වලට සහභාගි වන අය සහ සහභාගි නොවන අය. එයට සහභාගි නොවන අය රජයේ රැකියා ඇති අය හෝ ඉහළ මට්ටමේ පෞද්ගලික රැකියා ඇති අය යි. ඔවුන් විරෝධතා වලට නොපැමිණෙන්නේ ඒ නිසයි."

### 3. පුරවැසි සහභාගිත්වය පුද්ගල අවශ්‍යතා සපුරාලීම මත පදනම් විය හැක

- පුරවැසි සහභාගිත්වය ද පුද්ගල අවශ්‍යතා සපුරාලීම මත පදනම් විය හැක. සමාජයේ මිනිසුන්ට එවැනි පුද්ගලික අවශ්‍යතා සපුරා ගැනීමේ අපේක්ෂා තිබේ නම් සහ එවැනි සහභාගිත්වයක් හරහා ඒවා සපුරා ගැනීමට හැකියාව නොමැති නම්, එවැනි ප්‍රාදේශීය කණ්ඩායම් වල ක්‍රියාකාරීව සහභාගි

වීමෙන් ඔවුන් අධෛර්යමත් විය හැක. (කරුණාකර 3 වන රූපය බලන්න).




*3 වන රූපය: ප්‍රජාවක සාමූහිකයන් තුළ පුද්ගල අභිලාෂයන් තිබීම*

- වැල්ලවාය සාකච්ඡා වලදී හෙළිදරව් වූයේ ප්‍රාදේශීය කණ්ඩායම ඔවුන්ගේ අරගලය ආරම්භ කළ විට, කිසිදු ආකාරයකින් රජයේ නිලධාරීන්ට ඔප්පු ලබාගත නොහැකි බව ඔවුන්ට පැවසූ බවයි. එමනිසා, මෙම සහභාගිත්වය හරහා තම අවශ්‍යතා ඉටු නොවන බැවින්, රජයේ සේවකයෝ අරගලයට එක්වීමට පසුබට වූහ. සමහර අවස්ථා වලදී, එවැනි සහභාගිත්වයකින් තම අවශ්‍යතා ඉටුකර ගත නොහැකි පුද්ගලයින් සංවිධානයේ ප්‍රයත්නයන් නිෂ්ඵල බව පවසමින් ප්‍රජාවන්හි අනෙකුත් සාමාජිකයින් නොකඩවා අධෛර්යමත් කරන බවද ඔවුහු අනාවරණය කරති."අපේ ගොඩනැගීම ආරම්භයේ දී ගමේ පවුල් 152 න් අපිත් සමග එකතු වූයේ පවුල් 20 ක් පමණයි. මෙයට හේතුව වූයේ අපේ ව්‍යාපාරයට සම්බන්ධ වීමෙන් පවුල් අධෛර්යමත් කළ බොහෝ දෙනෙක් ප්‍රාදේශීය මට්ටමේ සිටීමයි. නමුත් දැන් අපට සහයෝගය ලබාදෙන පවුල් සැලකිය යුතු සංඛ්‍යාවක් සිටිනවා.

- මාතර ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙකු අනාවරණය කළේ,"*මාවී* වගා කරන අයට ගංවතුර විශාල ගැටලුවක්. අපට ස්ථිර විසඳුමක් අවශ්‍යයයි. බොහෝ අවස්ථාවලදී, කුඹුරු ඉඩම් වලට හිමිකම් ඇති, කොළඹ වැනි පිටස්තර පෙදෙස් වල රැකියා කරන අය වන්දි ලැබීම ගැන සතුටු වෙනවා. නමුත් අපට වන්දි ගෙවීම විසඳුමක් නොවෙයි.

- මඩකලපුවේ පැවැත්වූ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙකු පැවසුවේ"අපි අපේ ඉඩම් ඉල්ලා සිටියත්, ගම්වල ජීවත්ව සිටි නමුත් දැන් නගරවල ජීවත්වන බොහෝ දෙනෙක් එය ඉල්ලීමට

සුදානම් නැහැ. ඉඩම් හිමිකාරීත්වය යළි ලබා ගැනීමට වඩා ඔවුන් කැමති වන්නේ වන්දි ලබාගැනීමට යි. තවද, යුද්ධය අතරතුර විදේශ රටවලට ගිය අය ඉඩම් නඩුවක් පැවරීමට අකමැති වන්නේ ඔවුන්ට ඒ වෙනුවෙන් ආපසු පැමිණීමට සිදුවන නිසයි. එමනිසා, විදේශ රටවල සිටින බොහෝ දෙනා ද කැමති වන්නේ වන්දි ලබාගෙන ප්‍රශ්න වලින් වැළකීමට යි.


### 4. විසඳුම් ලබාගැනීමට තමන්ට ඇති හැකියාව සම්බන්ධයෙන් කණ්ඩායම තුළ ඇති විශ්වාසය

- ප්‍රජා මූල සංවිධාන වල සහභාගිත්වය ද බොහෝ දුරට රඳා පවතින්නේ පුරවැසියන්ගේ ඉල්ලීම් හා අවශ්‍යතා කෙතරම් දුරට ඉටුකර ගත හැකි ද යන්න මත මෙන්ම, ඔවුන්ට තමන්ගේ අයිතීන් දිනා ගත හැකි බවට පුරවැසියන් අතර ඇති විශ්වාසය මත ය. මෙම විශ්වාසය සමහර විට බොහෝ දුරට රඳා පවතින්නේ ගැටලුව සමඟ මීට පෙර ලද අත්දැකීම් හෝ අනෙකුත් ප්‍රාදේශීය කණ්ඩායම් තම අයිතීන් වෙනුවෙන් සටන් කරන ආකාරය බලා සිටීමෙන් ලද නිරීක්ෂණ මත ය. අතීතයේ සිට සහභාගිත්වය සහ සාර්ථක කතාන්දර ගැන සඳහනක් නොමැති විට, එවැනි ගැටලු වලට උදාසීන ආකල්පයක් ඇතිවීමේ ප්‍රවණතාවක් ඇත.

  - ➢ යාපනයේ ඉඩම් හිමිකම් ගැටලු සහිත යළි පදිංචි කළ කාන්තාවන්ගේ ප්‍රාදේශීය කණ්ඩායමක ප්‍රතිචාරකයින් හෙළිදරව් කළේ පලාලී ඉඩම් ගැටලුව සම්බන්ධයෙන් උද්ගත වූ විරෝධතා දෙස ඔවුන් බලා සිටි බවත්, එය ඉතාමත් ප්‍රසිද්ධ ගැටලුවක්ව තිබියදීත්, ප්‍රදේශවාසීන්ගේ බොහෝ ප්‍රයත්නයන් තිබියදීත්, එයට ලබාදුන් වැඩදායක විසඳුමක් නොමැති බවයි."පලාලී සිද්ධිය ගැන සටන් කරන ජනතාවගේ බොහෝ ප්‍රයත්නයන් ගෙන් පසුව වුවද ඔවුන්ගේ අයිතීන් දිනාගත නොහැකි නම්, අපට ඇති බලාපොරොත්තුව කුමක්ද?

### 5. සහභාගිත්වයේ පිරිවැය

- ප්‍රජා අවකාශය තුළ මහජන සහභාගිත්වය බොහෝ විට පැමිණෙන්නේ පිරිවැයක් සමග ය. ඔවුන්ට බලපාන ගැටලු ඉතා වැදගත් හා ඔවුන්ට ඍජුවම බලපාන ඒවා වුවත්, මෙය මහජන සහභාගිත්වයට බාධා කරන හේතුවක් බවට අනාවරණය වේ. එක් අතකට මෙම පිරිවැය මූල්‍යමය ස්වභාවයක විය හැකි අතර, අනෙක් අතට එය දේශපාලන පිරිවැයක් විය හැකිය. මෙම දේශපාලන පිරිවැය සිල්වා සහ ලේකම්වසම් :2021*[14] විසින් පැහැදිලි කර ඇත. ඒ අනුව, තවද, බොහෝ ප්‍රදේශවාසීහු ප්‍රාදේශීය දේශපාලනඥයෙකුට අභියෝග කිරීම වැනි ක්‍රියාකාරී සහභාගිත්වයට බිය වෙති. එවැනි විරෝධය දැක්වීමක් දේශපාලනඥයා විසින් සාමාන්‍යයෙන් පළිගැනීමේ ක්‍රියාවන්ට හේතු විය හැකිය. මේ හේතුවෙන් බොහෝ ප්‍රදේශවාසීහු එක්කෝ සහභාගි නොවෙති, නැතහොත්, ඔවුන් එසේ කරන්නේ නම්, දේශපාලනඥයින්ගේ මඟ පෙන්වීම අනුගමනය කිරීමට පෙළඹෙති. මෙම පිරිවැය, ජනතාවගේ නිදහස් සංගමයට ඇති අයිතිය ක්‍රියාත්මක කිරීමට ඇති ඔවුන්ගේ අධික හැකියාව සහ කැමැත්ත




*4 වන රූපය: සහභාගිත්වයෙහි පිරිවැය*

[14] Silva, S., & Lecamwasam, N. (2021). Ideal vs Practice: Narratives on Clientelism, Democracy and Participation in Local Government Authorities in Sri Lanka. Research Journal of the Royal Thimphu College, 4(1). https://www.rtc.bt/images/rigtshoel/Rig-Tshoel-_2021-Vol-4-No-I.pdf

- මූල්‍ය පිරිවැය පැහැදිලි කිරීමට, වැල්ලවායේ ඉඩම් අයිතීන් වෙනුවෙන් සටන් කරන ප්‍රාදේශීය කණ්ඩායමේ ප්‍රතිචාරකයෝ අනාවරණය කළේ ඔවුන්ගේ ඉඩම් අයිතීන් ඉල්ලා විරෝධතා කිහිපයක ක්‍රියාකාරීව සහභාගි වූ බවයි. එවැනි පිරිවැය ස්තුති පූර්වකව ඔවුන් සමග සම්බන්ධ වී සිටින රාජ්‍ය නොවන සංවිධානය මගින් හසුරුවන ලද බව ඔවුහු ප්‍රකාශ කළහ."අපේ සටන් දිනා ගැනීම සඳහා අපට පිටතින් විශාල සහයෝගයක් අවශ්‍ය වුණා. ප්‍රධාන කරුණ වුයේ අපේ ගැටලු පිළිබඳව අප විසින්ම සටන් කිරීමට ප්‍රමාණවත් මුදල් නොතිබීමයි. විරෝධතා සඳහා කොළඹට පැමිණීම් වලදී අපගේ සියළු පිරිවැය අප සමග කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධානය විසින් ආවරණය කරනු ලැබුවා. ප්‍රවාහනය, නවාතැන්, හෝ ආහාර සඳහා අපි කිසිදු මුදලක් වැය කළේ නැහැ."

- අනෙක් අතට, දේශපාලන පිරිවැය ප්‍රාදේශීය කණ්ඩායම් සමග සහභාගි නොවන විරුද්ධ දේශපාලන මත දරන ජනතාවගේ ස්වරූපය ද ගත හැකිය.

  - වැල්ලවායේ ප්‍රතිචාරකයා අනාවරණය කළේ ප්‍රජා මූල සංවිධානයේ නායකයා යන ජාතික දේශපාලන පක්ෂයේ ආධාරකරුවෙකු වන බැවින් ජාතික දේශපාලන පක්ෂයේ ආධාරකරුවන් නොවන බොහෝ දෙනා ප්‍රජා මූල සංවිධානයට සහභාගි නොවන බවයි. තවදුරටත්, ප්‍රතිචාරකයෙකු සඳහන් කළේ, "මේ තරුණ තරුණියෝ අපේ විරෝධතාවන්ට සහභාගි වන්නේ නැහැ, එවැනි ක්‍රියාකාරකම් වලට සහභාගි වන බව දැන ගතහොත් තමන්ගේ රැකියා අහිමි වෙතැයි ඔවුන් බිය වෙනවා. තවද, මෙම ප්‍රදේශයේ රජයේ රැකියා වල නිරත වන බොහෝ තරුණ තරුණියන් සිටින නමුත් ඔවුහු ස්ථිර සේවකයෝ නොවෙයි. ඒ නිසා, අප සමග සහභාගිවීමෙන් ඔවුන්ගේ රැකියා තත්ත්වයන්ට ගැටලු ඇතිවේ යැයි ඔවුන් කරදර වෙනවා" ඒ අනුව එවැනි සිදුවීම් වලින් හෙළිදරව් වන්නේ පුද්ගලයින්ගේ සහභාගිත්වය සමහර විට නිර්ණය වන්නේ පුරවැසියන්ගේ දෘෂ්ටි කෝණයෙන් නොව, ඡන්ද දායකයින් ලෙස ය.

- එපමණක් නොව, කරදරයකින් තොර සහ එදිනෙදා/දිනචර්යා ක්‍රියාකාරකම් අනතුරේ නොහෙළන (පාඩු නොකරන) ප්‍රජා සහභාගිත්වයේ ආකාර වලට ජනතාව උනන්දුවක් දැක්වීමට වැඩි ඉඩක් ඇත.

  - මහියංගනයේ ප්‍රතිචාරකයින් හෙළිදරව් කළේ විරෝධතා සංවිධානය කිරීම සඳහා සඳුදාට වඩා බදාදා දිනය ඔවුන් තෝරාගත් බවයි. මන්දයත්, සතියේ ආරම්භක දිනට වඩා සතිය මැද සහභාගි වීමට ජනයා වැඩි කැමැත්තක් දක්වනු ඇතැයි ඔවුන් දැන සිටි බැවිනි.

  - මඩකලපුවේ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ මෙහි ජනතාවට, සාමූහිකයක් ලෙස සංවිධානය වීමට ඇති ප්‍රධාන අභියෝගයක් වන්නේ, රැකියාවේ කැපවීම් හා ආර්ථික දුෂ්කරතාවන් ය. ඔවුන්ගේ දෛනික වේතනය ලබාගැනීමට ඔවුන් දිනපතා වැඩට යා යුතු වෙනවා.

**දැනුවත් සහභාගිත්වය**

- දැනුවත් සහභාගිත්වය යනු ක්‍රියාකාරී හෝ අක්‍රිය සහභාගිත්වය නිර්ණය කරන තවත් කරුණක් බව සොයා ගන්නා ලදී. සාකච්ඡා වලින් හෙළි වූයේ බොහෝ අවස්ථා වලදී බොහෝ දෙනෙක් දැනුවත් වී සිටින්නේ ගැටලුවෙහි කොටසක් ගැන පමණක් බවත්, අයිතීන් ගැන සහ පිළිතුරු හෝ පවතින ගැටලුවට විසඳුමක් ලබාගැනීමේ ක්‍රියාවලිය ගැන එතරම් දැනුමක් නොමැති බවයි. ඇතැම් අවස්ථාවලදී, විවිධ අයිතීන් පදනම් කරගත් ක්‍රියාකාරකම් වල අඛණ්ඩව සහභාගිවීමෙන් ජනයා දැනුම හා අත්දැකීම් ලබාගත් පසු, ඔවුන් විශ්වාසය දිනා ගෙන ප්‍රාදේශීය මට්ටමින් සිදුවන අසාධාරණයන්ට එරෙහිව ඒකරාශී වීම හා වෙනත් විරෝධතා සංවිධානය කිරීම ආරම්භ කරති. අවසානයේදී ප්‍රාදේශීය මට්ටමේ සැලකිය යුතු දැනුමක් හා අවබෝධයක් ඇති පුද්ගලයින් ද ගමේ වඩාත් කැපී පෙනෙන චරිත බවට පත්වේ.

  - වැල්ලවායේ ප්‍රතිචාරකයින් අනාවරණය කළේ ප්‍රාදේශීය කාන්තා සමිති හරහා රාජ්‍ය නොවන සංවිධාන මගින් සංවිධානය කළ වැඩමුළු වලට සහභාගි වීමෙන් ඔවුන්ගේ අයිතීන් ගැන සහ ඔවුන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් කිරීමේ නෛතික ක්‍රියාවලීන් ගැන ඉගෙන ගැනීමට ඔවුන්ට මාර්ගයක් ලැබුණු බවයි. අවසානයේදී එවැනි නිරාවරණය වීම් හා එවැනි දැනුවත් වීම් හරහා දැනුම පුළුල් වීමත් සමග, ප්‍රජා මූල සංවිධානයේ සමහර පුද්ගලයින්ට ගම තුළ

විශ්වසනීයත්වය හා පිළිගැනීමක් ද ලැබී ඇත. ඉඩම් අයිතීන් සඳහා සටන් කරන ප්‍රාදේශීය කණ්ඩායමක් සමග සක්‍රියව සම්බන්ධ වී සිටින ප්‍රතිචාරකයෙක් හෙළිදරව් කළේ,"ජනතාව දැන් උපදෙස් ලබාගැනීම සඳහා මා වෙතට පැමිණෙනවා. මට දැන් ගම තුළ ද වඩා හොඳ පිළිගැනීමක් තිබෙනවා" ඉඩම් අයිතීන් වෙනුවෙන් අඛණ්ඩව සටන් කිරීමෙන් ලත් විශ්වාසයත් සමග වැල්ලවායේ ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ, ඉඩම් ගැටලු ගැන සටන් කිරීමෙන් ඔවුන්ට පොදුවේ පුරවැසියන්ගේ අයිතීන් ගැන අදහසක් ලැබුණු බවයි. එහි ප්‍රතිඵලයක් ලෙස ගම තුළ පවතින අකාර්යක්ෂම තැපැල් සේවාව ගැන සොයා බැලීමට මූලිකත්වය ගැනීමට ඔවුන්ට ශක්තිය ලැබුණි.

- මාතර පැවැත්වූ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් හෙළිදරව් කළේ "අපේ ව්‍යාපාරය සඳහා රාජ්‍ය නොවන සංවිධාන වලින් සහයෝගය හා නෛතික උපදෙස් අපට ලැබුණා. සමහර මහාචාර්යවරුන් ද තාක්ෂණික දැනුමෙන් අපට සහයෝගය ලබා දුන්නා."

- අනෙක් අතට, ප්‍රමාණවත් දැනුම නොතිබීමේ ප්‍රතිවිපාක සහ එහි බලපෑම් වලින් දැනුවත් සහභාගිත්වය අවහිර කිරීම පිළිබඳව ද සාකච්ඡා වලින් අනාවරණය විය.

  - ඇටම්පිටියේදී වතු ප්‍රජාව සමඟ සාකච්ඡා පවත්වන විට හෙළිදරව් වූයේ ඔවුන්ගේ අයිතීන් සම්බන්ධව හෝ අවශ්‍ය කරන නෛතික දැනුම නොමැතිවීම හේතුවෙන් ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය දැඩි ලෙස සීමා වූ බවයි. නෛතික ක්‍රියාවලිය හෝ ක්‍රියාවලියට සම්බන්ධ නීතිඥයින් ගැන අපි කිසිවක් දන්නේ නැහැ. අපව සෘජුවම නීතිඥයින්ට හඳුන්වා දිය හැකි නම් එය ඇත්ත වශයෙන්ම උපකාරී විය හැකියි. සමහර නීතිඥයින් ඔවුන්ට රුපියල් 30,000 ක් ගෙවන ලෙස ඉල්ලනවා. නමුත් අපට එක් වේලාවක එතරම් ගෙවිය නොහැකියි. මෙම වියදම් දැරිය හැකි හෝ අපට එම නඩුවට සහයෝගය දිය හැකි යම් සංවිධාන තිබේදැයි යන්න පවා අපි දන්නේ නැහැ."

  - එසේම, ඉඩම් ගැටලු වලින් පීඩාවට පත්වූ ප්‍රාදේශීය කණ්ඩායමක් සමග මඩකලපුවේ දී පැවති සාකච්ඡා වලදී හෙළිදරව් වූයේ, ඔවුන් තමන්ගේ නෛතික අයිතීන් සහ ඔවුන්ට හිමිකම් ඇත්තේ මොනවාටද?, සහ පුරවැසියන් ලෙස නීතිය හරහා ඔවුන්ට ඉල්ලා සිටිය හැක්කේ මොනවාද යන්න ගැන ඔවුන් දැනුවත් වී නොමැති බවයි. එසේ දැනුම නොමැතිකම නිසා පුරවැසියන් ලෙස විශ්වාසයෙන් සහභාගි වීමට සහ දැනුවත් ආකාරයකින් ඔවුන්ගේ අයිතීන් සඳහා ඉල්ලීම් කිරීමට පුරවැසියන්ට ඇති හැකියාවට එය බලපාන බව බොහෝ ආකාර වලින් හෙළිදරව් විය.

### 6. අන්තර්-ප්‍රජා අභියෝග

- සමහර පෙදෙස්වල ප්‍රජාව ඇතුළත හෝ අන්තර්-ප්‍රජා අභියෝග තිබිය හැකි බව සොයා ගන්නා ලදී. ඇතැම් ප්‍රජාවන් තුළ ප්‍රදේශවාසීන්ම ප්‍රජා සහභාගිත්ව මුලපිරීම් වළක්වා ලන කඩාකප්පල්කාරීන් (බාධා කරන්නන්) විය හැකිය. මෙය බොහෝවිට මුලපිරීම් වලට සහභාගිවන්නන් සමාජයේ අනෙකුත් සාමාජිකයින්ගේ අපේක්ෂාවන්ට සමාන අපේක්ෂාවන් බෙදාහදා නොගන්නා බැවින් සිදුවිය හැක. නැතහොත්, සහභාගිත්වයේ ස්වභාවය අන් අයට නොගැලපෙන, නැතහොත් සමහර අවස්ථාවලදී ඇතැම් කණ්ඩායම් වල සහභාගිත්වය අන් අයව අනිවාර්යයෙන් බැහැර කරනවා විය හැකිය. එවැනි තත්ත්වයකදී ප්‍රජාවේ සමහර සාමාජිකයන් ප්‍රජාවේ අනෙකුත් සාමාජිකයන්ගේ සමාගමයේ නිදහසට අභියෝග කළ හැකිය.

  - ඉඩම් අයිතීන් සඳහා සටහන් කරන වැල්ලවායේ ප්‍රාදේශීය කණ්ඩායමකින් පැමිණි වැන්දඹුවක් හෙළිදරව් කළේ ඔවුන් විරෝධතා වලට සහභාගි වන විට ඇය ගැන (සහ අනෙකුත් කාන්තාවන් ගැන) ගම්වාසීන් බොහෝවිට කතාන්දර සාදන බවයි. "අපි විරෝධතා වලට සහ නගර වල සිදුවන සිදුවීම් වලට යන විට හෝ අපේ නිවෙස් වලින් බැහැරව රාත්‍රිය ගත කරන විට, හෝ අපි ආපසු ගමට එනවිට රාත්‍රියේදී අපව වාහන වලින් බස්සවන විට ප්‍රදේශවාසීන් කතාන්දර ගෙතීමට පෙළඹෙනවා.

- ➢ විරෝධතා දේශපාලනීකරණය කිරීම අවබෝධ කර ගැනීමට උපකාර කිරීම සඳහා, වැල්ලවායෙන් පැමිණි ප්‍රතිචාරකයෙකු අනාවරණය කළේ, "මෙම විරෝධතා තමන් හඳුනාගනු ලබන දේශපාලන මාර්ග හරහා සිදු නොකෙරේ නම්, ජනයා ඒවාට සහභාගි වෙන්නේ නැහැ. සහභාගිත්වය විවිධ දේශපාලන අවශ්‍යතා වලින් වර්ණවත් වේ නම්, එවිට ද ඔවුන් සහභාගි වෙන්නේ නැහැ."

- වෙනත් අවස්ථා වලදී, මෙම දේශපාලනීකරණය ප්‍රාදේශීය ප්‍රජා මූල සංවිධාන තුළ වුවද දිස්විය හැක. ඇතැම් අවස්ථාවලදී, ප්‍රජා මූල සංවිධාන වල සාමාජිකයින් මෙම ගැටලු නොසලකා හැරීමට ඉඩ ඇත. කෙසේවෙතත්, වෙනත් අවස්ථා වලදී විවිධ දේශපාලන ආධාරකරුවන් සිටීම ප්‍රජා මූල සංවිධානයේ ක්‍රියාකාරීත්වයට අහිතකර විය හැක.

  - ➢ අප සාකච්ඡා පැවැත්වූ වැල්ලවාය, මාතර සහ මඩකලපුවෙහි ප්‍රජා මූල සංවිධාන වල විවිධ දේශපාලන පක්ෂවල ආධාරකරුවෝ සිටියහ. කෙසේවෙතත්, ඔවුන් මෙය ඔවුන්ගේ ශක්තියට භාවිතා කරමින්, මොනයම් හෝ පක්ෂයක් හරහා ඔවුන්ගේ ඉල්ලීම් සපුරා ගැනීම සඳහා විවිධ ආධාරකරුවන් සිටීම ප්‍රයෝජනවත් වේයැයි ඔවුහු සඳහන් කරති. කෙසේවෙතත්, එවැනි සහයෝග පිළිගෙන තිබියදීත්, අභ්‍යන්තර එකඟ නොවීම් විසඳා නොගැනීම එවැනි ප්‍රජා මූල සංවිධාන වල සුමට ක්‍රියාකාරීත්වයට දිගු-කාලීන බලපෑමක් ඇති විය හැකි බවට බවට නිරීක්ෂණය විය. "මේ ජනතාව අපේ කටයුතු වලට සම්බන්ධ නොවීමට එක් හේතුවක් වන්නේ, ඔවුන් ප්‍රජා මූල සංවිධානය තුළ ඇති දේශපාලනික පසුබිම හා මත සමඟ එකඟ නොවීමයි. ප්‍රජා මූල සංවිධානය තුළ සිටින අයගේ දේශපාලන මත සමඟ අප වුවද නිතරම එකඟ නොවුවත්, අප ප්‍රජා මූල සංවිධානය සමඟ අඛණ්ඩව සම්බන්ධ වන්නේ අපගේ ඉඩම් බලපත්‍රය ලබාගැනීම පිණිස යි." යනුවෙන් වැල්ලවායෙහි ප්‍රජා මූල සංවිධානයකින් පැමිණි ප්‍රතිචාරකයෙක් පැවසීය.

## 7. ආගමික නායකයින්ගේ කාර්යභාරය

- ➢ ප්‍රජාවේ ගැටලු විස්තාරණය කිරීමට සහයෝගය ලබාදීමට සහ නිත්‍යානුකූල භාවය ලබාදීමට ආගමික නායකයන් හට ඉටුකළ හැකි බලගතු කාර්යභාරය ද සාකච්ඡා වලින් පෙන්වා දෙන ලදී. වඩාත් සුවිශේෂීව අනාවරණය වූයේ ප්‍රාදේශීය මට්ටමේ දී පුරවැසි සහභාගිත්වය සඳහා ප්‍රදේශයේ බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ කාර්යභාරය ඉතා වැදගත් වූ බවයි. ප්‍රාදේශීය ගැටලු වලට නිත්‍යානුකූල භාවය ලබාදීමේ දී ආගමික නායකයින්ගේ වැදගත්කම මීට පෙර සිදුකර ඇති පර්යේෂණ වලින් ද අනාවරණය කර ඇත.[15] ඇතැම් අවස්ථා වලදී අසාධාරණයන්ට එරෙහිව ජනතාවට ශක්තියක් වන ආගමික නායකයින්ම අන්තවාදී කණ්ඩායම් වල කොටස් කරුවන් බවට පත්වන ආගමික නායකයින් වීම සිත් ගන්නා සුළු කරුණකි. ආගමික නායකයින් ඉටු කරන මෙම පරස්පර විරෝධී කාර්යභාරය එක් අතකින් එක් ප්‍රජාවක ක්‍රියාකාරී පුරවැසිභාවය භාවිතයට ගැනීමට ඇති හැකියාව ශක්තිමත් කරන අතර, අනෙක් අතට තවත් කණ්ඩායමක සමාන සහභාගිත්වය හා පුරවැසිභාවය අභියෝගයට ලක් කරයි.

- ➢ මහියංගනයෙන් පැමිණි ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ කීර්තිමත් විහාරස්ථානයක විහාරාධිපති භික්ෂූන්වහන්සේ ඉතා ක්‍රියාශීලී බලගතු හිමිනමක් වූ බවත්, මෑතකදී එම ප්‍රදේශයේ අලි-මිනිස් ගැටුමට විසඳුමක් ඉල්ලා උද්ඝෝෂණය සංවිධානය කළේද එම හිමිනම බවයි. එම හිමිනම ප්‍රාදේශීය මට්ටමේ දී ඉතා ක්‍රියාශීලී වූ බවත්, දේශපාලනඥයන් නොසිටින විට පවා බොහෝවිට ජනතාවගේ පැත්ත ගන්නා බවත් ය. මීට පෙර, මෙම හිමිනම ම ආන්දෝලනාත්මක සිංහල-බෞද්ධ ජාතිකවාදී සංවිධානයක සාමාජිකයෙකු වූ අතර, ගමට අනීතිකව ඇතුල් වී ගවයන් රැගෙන ගිය බව චෝදනා ලත් මුස්ලිම් ජාතිකයින් පොලීසියට භාරදීමට පෙර ඔවුන්ට හිරිහැර කළ බවට ද චෝදනා ලබා ඇත.

[15] Gunasekara, V., Surenthiraraj, R., & Tilakaratne, P. (2019a). Services And Legitimacy: Exploring the Everyday Experiences of the State in Sri Lanka (pp. 16–17). https://securelivelihoods.org/wp-content/uploads/20190329_SLRC_Sri-Lanka-services-and-legitimacy-report-fina-online-1.pdf

- මාතර පැවති සාකච්ඡාවේදී අනාවරණය වූයේ, ප්‍රාදේශීය ප්‍රජා මූල සංවිධානය තමන්ගේ අයිතීන් සාක්ෂාත් කර ගැනීම සඳහා භික්ෂූන්වහන්සේලාගේ වටිනාකම සහ ඔවුන්ගේ සහයෝගය ගැන දැනුවත් වී ඇති බවයි. එම කණ්ඩායමේ ප්‍රතිචාරකයෙකු සඳහන් කළේ, " ප්‍රදේශයේ භික්ෂුන් වහන්සේලා සම්බන්ධ වීම බොහෝ විට අපගේ ගැටලු විස්තාරණය කිරීමට අවශ්‍ය කරන බර සහ වැදගත්කම ලබාදෙනවා" යනුවෙනි.

## 8. රජයේ නිලධාරීන්ගේ සහ සිවිල් සේවකයින්ගේ කාර්යභාරය

- සිවිල් සේවකයින්ගේ කාර්යභාරය ප්‍රාදේශීය මට්ටමේ දී ප්‍රජා අවකාශය තුළ මහජන සහභාගිත්වයෙහි තවත් වැදගත් අංගයකි. එක් අතකට, ජනතාව උත්සුක වන ගැටලු පිළිබඳව සේවකයින්ගේ නොදැනුවත්කම හේතුවෙන් ජනයා පිටතට පැමිණ තම අයිතීන් වෙනුවෙන් සටන් කිරීමට ඔවුන්ව දිරිමත් කර ඇත. සමහර අවස්ථාවලදී, නොදැනුවත්කමට හේතු වී ඇත්තේ උනන්දුවක් නැතිකම පමණක් නොව, සම්පත් නොමැතිකම, දේශපාලනික බලපෑම්, සහ වෙනත් අනුග්‍රහයන් නිසා ය. එවැනි අවස්ථාවලදී, රජයේ සේවාවන් කෙරෙහි ඇති ජනතා විශ්වාසය නැති වේ. ඇතැම් අවස්ථා වලදී රජයේ සේවකයින්ගේ අකාර්යක්ෂමතා සහ ප්‍රදේශ වල ග්‍රාම සේවක වැනි රජයේ නිලධාරීන් කලින් කලට වෙනස්වීම ද කාර්යක්ෂම සේවාවක් ලබාදීම පිළිබඳව රාජ්‍ය ආයතන විශ්වාස කිරීම කෙරෙහි ප්‍රජාවන්ට ඇති හැකියාවට බොහෝ විට බලපෑම් කරයි.

- උදාහරණයක් වශයෙන්, ජල සම්පාදන මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය අධිකාරීන් අත්වැල් බැඳගෙන වැඩ කරන අතර, ස්වාධීන ආයතන ලෙස කටයුතු කිරීම නීතියෙන් අවශ්‍ය වුවත්, ඔවුන් බොහෝවිට එසේ නොකරන බවත් මාතර ප්‍රතිචාරකයෝ අනාවරණය කළහ. එවැනි අගතීන් සහ අනිසි පක්ෂග්‍රාහිත්වයන් බොහෝවිට රාජ්‍ය ආයතන සහ ඔවුන්ගේ රාජකාරි ඉටුකිරීමට ඒවාට ඇති හැකියාව සම්බන්ධයෙන් ජනතා විශ්වාසය තවදුරටත් අඩුකරයි.

- තවද, මහියංගනයේ ප්‍රතිචාරකයින් අනාවරණය කළේ, වනජීවී දෙපාර්තමේන්තුව වැනි ආයතන වලට අලි-මිනිස් ගැටුම හැසිරවීමට අවශ්‍ය කරන මෙවලම් සහ සම්පත් නොමැති බවයි - එය ඔවුන් කෙරෙහි ඇති අවිශ්වාසය තවත් උග්‍ර කරයි. මෙය රජයේ ආයතන කෙරෙහි ජනතාව තුළ ඇති විශ්වාසය නැති කරගෙන තමන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් කිරීමට ප්‍රජා මට්ටමින් මූලිකත්වය ගැනීමට හේතු වේ.

- යාපනයේ යළි පදිංචි කළ ප්‍රදේශයක කාන්තාවක් සමඟ පැවැත්වූ සාකච්ඡාවක දී හෙළිදරව් වූයේ, ග්‍රාම සේවක නිරන්තරයෙන් වෙනස් වීමට මුහුණු දීමට සිදුවීම සහ තම ඉඩම් සම්බන්ධ ගැටලු නිතරම වෙනස් වන ග්‍රාම සේවකට සන්නිවේදනය කිරීම ඔවුන්ට වැඩි වැඩියෙන් දුෂ්කර වී ඇති බවයි."මේ වේලාවේ අපේ ග්‍රාම සේවක කවුද යන්නවත් අප දන්නේ නැහැ. මීට පෙර අපේ ප්‍රදේශයේ ග්‍රාම සේවක කිහිප වතාවක් වෙනස් කළා. අළුත් කෙනෙක් පැමිණෙන සෑම අවස්ථාවකම අපේ ගැටලු මුල සිටම පැවසිය යුතුයි. ස්ථිර ග්‍රාම සේවකයෙකු නොමැතිකම ප්‍රජාවේ ගැටලු ප්‍රකාශ කර ඒවාට විසඳුමක් ලබාගැනීමට ප්‍රජාවට ඇති හැකියාවට බලපෑම් කර තවදුරටත් ප්‍රමාදවීම් වලට හේතු වේ.

## 9. විශ්ව විද්‍යාල සිසුන් ශක්තියෙහි මූලාශ්‍රයක් ලෙස

- විශ්වවිද්‍යාල සිසුන් පුළුල් ප්‍රජාව වෙත ගැටලු විස්තාරණය කිරීම සඳහා නිත්‍යානුකූල බලවේගයක් ලෙස හඳුනාගෙන ඇත. විශ්වවිද්‍යාල සිසුන්ගේ සහභාගිත්වය හා ඔවුන් ගනු ලබන නායකත්වයෙන් ධනාත්මක හා සෘණාත්මක අර්ථ නිරූපණ දෙකම තිබිය හැකිය. එක් අන්තයකින් විශ්වවිද්‍යාල සිසුන්ගේ සහභාගිත්වය පුරවැසියන්ගේ සහභාගිත්වය ශක්තිමත් කර අභිප්‍රේරණය කරයි. කෙසේවෙතත්, අනෙක් අන්තයේ දී එවැනි උද්ඝෝෂණවල නියැලෙමින් ජනතාවගේ එදිනෙදා කටයුතු වලට බාධා කරන බවට ඔවුන්ට චෝදනා ද එල්ල වේ.[16] කෙසේවෙතත්,

[16]Sri Lanka Police fires tear gas on university students protesting outside Parliament - Times of India. (2022). The Times of India. https://timesofindia.indiatimes.com/world/south-asia/sri-lanka-police-fires-tear-gas-on-university-students-protesting-outside-parliament/articleshow/91354810.cms

සාකච්ඡා වලින්, හෙළිදරව් වෙන්නේ තරුණ තරුණියන් විශේෂයෙන් විශ්වවිද්‍යාල සිසුන් ජනතාවගේ ගැටලු වලට හඬක් දිය හැකි වැදගත් වත්කමක් ලෙස ය.

- බුත්තල හා මහියංගනය ප්‍රදේශ දෙකින්ම ප්‍රතිචාරකයින් අනාවරණය කළේ *ගෝඨාගෝගම* විරෝධතා වලට සමගාමීව තමන්ගේ ප්‍රදේශ වල විරෝධතා සංවිධානය කළේ විශ්වවිද්‍යාල සිසුන් බවය.

- යාපනයේදී පැවැත්වූ සාකච්ඡා වලදී අනාවරණය වූයේ, නිහඬ විරෝධතා සහ වෙනත් ක්‍රම හරහා ඔවුන්ගේ ඉඩම් ගැටලු විස්තාරණය කර අවධානය යොමු කිරීමට උපකාර කළේ යාපනය විශ්වවිද්‍යාල සිසුන් බව යි. "අපි විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංගමය සමඟ සමීපව කටයුතු කරනවා. ඔවුන් අපේ ගැටලු ගැන ඉතා සහයෝගයෙන් සහ අවබෝධයෙන් සිටිනවා."

- මහියංගනයේදී අලි-මිනිස් ගැටුම ගැන මෑතකදී පැවති උද්ඝෝෂණ වලදී පවා විශ්වවිද්‍යාල සිසුහු සහභාගී වීමෙන් වටිනා කාර්යභාරයක් ඉටු කළහ."අපේ උද්ඝෝෂණ වලදී විශ්වවිද්‍යාල සිසුන් කිහිප දෙනෙකු අපි දුටුවා."

## 10. දේශපාලනඥයින්ගේ බලය

- ප්‍රාදේශීය මට්ටමේ දී ප්‍රජා සහභාගිත්වය නිර්ණය කිරීමේදී දේශපාලනඥයෝ සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරති. දේශපාලනඥයින් තමන්ගේ පැත්තෙහි සිටීමෙන් ඔවුන්ට අර්ථවත් මාර්ග වල නියැලීම වඩාත් පහසුවන බව ජනාතව අවබෝධ කර ගනිති. කෙසේවෙතත්, මීට පෙර සාකච්ඡා කළ පරිදි, පක්ෂ දේශපාලනය ශක්තියක් වනු පමණක් නොව, එය ප්‍රාදේශීය මට්ටමේදී සමාගමයේනිදහසට අභියෝගයක් ද විය හැක. මන්දයත්, එක් දේශපාලන පක්ෂයකින් හෝ සුවිශේෂී දේශපාලනඥයෙක් සහභාගි වීම අන් අයගේ සහභාගිත්වය අධෛර්යමත් කිරීම හෝ ව්‍යාපාරයට එක්වීමට කැමති අනෙක් පක්ෂ වල ආධාරකරුවන් එදිරි වීම සිදුවිය හැකි ය.

- මහියංගනය ප්‍රතිචාරකයෙකු දුන් උදාහරණයක් තුළින් ප්‍රජා ප්‍රයත්නයන්හි දේශපාලනඥයන්ගේ සහභාගිත්වයෙහි ස්වභාවය අනාවරණය කළේය. මහියංගනයේ අලි-මිනිස් ගැටුමෙන් පීඩාවට පත් ප්‍රදේශ වල දේශපාලනඥයින් ගැටලුවට ප්‍රගාමීය විසඳුමක් සෙවීමට ගනු ලබන මුලපිරීම් වලට සහභාගි නොවන නමුත්, පීඩාවට පත් පුද්ගලයින්ට වන්දි ලබාදීමේ මෙහෙයුම් වලට සහභාගි වන බව ඔවුහු සඳහන් කළහ. ඔවුන් තවදුරටත් අනාවරණය කරන්නේ බොහෝ දේශපාලනඥයින් මෑතකදී ප්‍රජාව විසින් පවත්වන ලද විරෝධතාවකට සහභාගි නොවූයේ, ඔවුන්ගේ සහභාගිත්වය දිරිමත් කරමින් විශේෂ ඉල්ලීමක් නොකළ නිසා පමණක් බවයි. සංවිධානය කළ විරෝධතාවයේදී දේශපාලනඥයින්ගේ වැඩි සහභාගිත්වයක් සහ දේශපාලන මැදිහත් වීමක් තිබුණේ නම් විරෝධතාවයට මීට වඩා සහභාගි වන්නන් සිටිය හැකිව තිබූ බව මහියංගනයේ එම ප්‍රතිචාරකයෝම පිළිගනිති. ඔවුන් සඳහන් කරන්නේ දේශපාලනඥයින්ට එරෙහි වීමට වඩා ඔවුන්ගේ ආශිර්වාදය සහිතව ජනතාව වැඩියෙන් සහභාගි වීමට ඉඩ ඇති බවයි.

- මඩකලපුවේ ප්‍රතිචාරකයින් පැවසුවේ ඔවුන් දේශපාලනඥයින්ගේ බලය හඳුනා ගන්නා බවයි. ඔවුන් වෙනුවෙන් ඉදිරිපත් වී කතා කළ යුත්තේ සමාජයේ කුමන කණ්ඩායමක් දැයි ඇසූ විට, කිසිදු පැකිලීමකින් තොරව ඔවුන් සඳහන් කරන්නේ දේශපාලනඥයින් බවයි." අපේ අරමුණ වෙනුවෙන් සටන් කිරීමට අපට උපකාර කළ හැක්කේ දේශපාලනඥයින්ට පමණයි. දවස අවසානයේදී බලය ඇත්තේ ඔවුන් සතුවයි."

- දේශපාලනඥයින් සූක්ෂම ලෙස හැසිරවීම සම්බන්ධයෙන් ගත් කල, ඇටම්පිටියේ පැවති සාකච්ඡා වලින් අනාවරණය වන්නේ, තමන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් කිරීමට මූලිකත්වය ගන්නා ප්‍රජාවේ ක්‍රියාකාරී සාමාජිකයින් දේශපාලනඥයින් උපක්‍රමයක් ලෙස යොදා ගන්නා බවයි. තමන්ගේ අන්තර්ක්‍රියා සහ ජාලයක් එක් දේශපාලන පක්ෂයකට සීමා කිරීමට වඩා, හැකි පමණ ප්‍රතිලාභ ලබා ගැනීමට ඔවුන් පක්ෂ කිහිපයක් සම්බන්ධ කර ගන්නා බව ඔවුහු

සඳහන් කරති. "අපගේ ඉඩම් ගැටලුව විසඳා ගැනීම, අපට වැදගත් වෙනවා. මෙය ඉටුකර ගැනීමට, අපට උදව් කරන්නේ කුමන පක්ෂයද යන්න ගැන අපි සලකා බලන්නේ නැහැ. අප සමඟ වැඩ කිරීමට කැමති ඕනෑම පක්ෂයක් සමඟ අපි වැඩ කරනවා. මෙය සපුරා ගැනීම සඳහා එකක් වෙනුවට දේශපාලන පක්ෂ කිහිපයක් සමග වැඩ කිරීම අපට කමක් නැහැ"

### 11. අධෛර්යය කිරීමක් ලෙස හමුදාවේ සහ පොලීසියේ සෝදිසි කිරීම්

- හමුදාව සහ පොලීසිය යන දෙකෙන්ම කෙරෙන මැදිහත්වීම හා සෝදිසි කිරීම් වැඩිවීම සමාගමයේ නිදහස සඳහා වන අභියෝගයක් ලෙස වටහා ගත හැකිය. දිගු කලක් තිස්සේ ප්‍රජාවන් හමුදා සෝදිසි කිරීම් වලට සහ ප්‍රශ්න කිරීම් වලට ලක්ව ඇති බැවින්, විශේෂයෙන් හමුදාව සිටින ස්ථාන වල තමන්ගේ ගැටලු ක්‍රියාකාරිව හා විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කිරීමට ඔවුන් අතර අඛණ්ඩ බියක් පවතී. ඒ අතරම, එවැනි ගැටලු හේතුවෙන් ජනතාව තුළ වැඩියෙන් ඔරොත්තු දීමේ හැකියාව ඇතිකර, එවැනි බාධක සමඟ කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳව වඩාත් නව්‍ය ලෙස සිතීමට ඔවුන්ව පොළඹවා ඇත. කෙසේවෙතත්, මෙසේ හමුදාව සිටීම ප්‍රජා අවකාශය තුළ ඔවුන්ගේ සහභාගිත්වය සහ ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් පුද්ගලයින් අතර සැක කිරීම් කිහිපයක් නිර්මාණය කර ඇති බවට විශාල සැකයක් පවතී.

  - මඩකලපුවේ සහ යාපනයේ ප්‍රතිචාරකයින් අනාවරණය කරන්නේ, සිදුවීම් සහ කණ්ඩායම් සහ ප්‍රජාවන් සමඟ ප්‍රාදේශීය මට්ටමේ සාකච්ඡා සංවිධානය කරන විට අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව හා හමුදාව ඔවුන්ගේ ජීවිත වලට තවදුරටත් මැදිහත් වීමට මෙය අවස්ථාවක් ලෙස භාවිතා කරන බවයි. යාපනයේ ප්‍රතිචාරකයෙක් පහත සඳහන් කරුණු අනාවරණය කළේය,"මම උදේම මගේ නිවසින් පිටත් වන විට කිහිප වතාවක්ම මා පසුපසින් පැමිණීමට අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව උත්සාහ කළා. ඔවුන් සිවිල් ඇඳුම් ඇඳගෙන ගේට්ටුවෙන් පිටත සිටිනවා. මම යන ස්ථානය සහ මම සහභාගි වන සිදුවීම් සොයා ගැනීමට ඔවුන් මගේ බයිසිකලය පසුපස එනවා.

  - මඩකලපුවේ පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් පැවසුවේ, "තරුණ අය බෙහෙවින් සහභාගි නොවන්නේ ඔවුන් හමුදාව, පොලීසිය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ඇති අත්දැකීම් ගැන අසා ඇති නිසාය. ඔවුන් තමන්ගේ ආරක්ෂාව ගැන කනස්සල්ලට පත් වෙනවා."

### 12. යහපත් නායකත්වයක් තිබීමේ වැදගත්කම

- ප්‍රාදේශීය මට්ටමේ සංගමය ද යහපත් නායකත්වයක් තිබීම මත රඳා පවතී. ඇතැම් අවස්ථා වලදී, පිහිටුවා ඇති ප්‍රජා මූල සංවිධාන වල සාමාජිකයින් තමන්ගේ ප්‍රදේශ වල ක්‍රියාකාරී පුරවැසියන් ලෙස ඔප්පු කරන ලද වාර්තා ඇති යහපත් නායකයින් සොයා ගනී. තවත් අවස්ථාවලදී, ප්‍රාදේශීයව පිහිටුවා ඇති කණ්ඩායමක නායකයෙක් හෝ නායකත්ව තනතුරක් භාර ගැනීමට කැමති කෙනෙක් නොසිටී. නායකයින් නොමැතිවිට, සාමූහිකයේ අවශ්‍යතා සපුරා ගැනීමට විශාල බාධකයක් ලෙස එය කටයුතු කරයි. අනෙක් අතට, නිශ්චිත නායකත්වයක් තිබීම ද කණ්ඩායමේ ඉල්ලීම් වලට එරෙහිව ක්‍රියා කිරීමේදී බලධාරීන්ට සහ බාධා කරන්නන්ට මර්දනයේ මෙවලමක් ලෙස භාවිතා කළ හැකි බව කණ්ඩායම් විසින් හඳුනාගෙන ඇත. එවැනි අවස්ථාවලදී, කණ්ඩායම් මර්දනය කිරීම සඳහා බොහෝවිට නායකයින්ව පහසුවෙන් ඉලක්ක කර ගනී. සමහර අවස්ථාවලදී, නායකයින් ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වයෙන් ප්‍රමුඛත්වය ලබා ගන්නා සහ ඔවුන්ට ඇති පිළිගැනීමෙන් වාසි ලබා ගන්නා අවස්ථා තිබිය හැක. වෙනත් අවස්ථාවලදී, නායකයින් දේශපාලන පක්ෂ වලට සම්බන්ධ වීමෙන්, ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජා මූල සංවිධාන වල ක්‍රියාකාරීත්වය සහ වටහා ගැනීම (සංජානනය) යන දෙකටම සර්පිලාකාර බලපෑම් ඇති කළ හැකිය.

  - වැල්ලවායේ සාකච්ඡා සහ නිරීක්ෂණ වලින් අනාවරණය කරනු ලබන්නේ, හොඳ නායකයෙක් සිටීම කණ්ඩායම් වලට නිත්‍යානුකූල භාවය දිනා ගැනීමට හා සුමට ලෙස ක්‍රියා කිරීමට වඩාත් පහසු කරන බවයි. ඒ අතරම, ගම්වාසීන් නායකයාට ලබාදෙන පිළිගැනීම නායකත්වය හරහා ප්‍රජා මූල සංවිධානයට ලැබෙන සහයෝගය පුළුල් කිරීමට උපකාරී වේ. "මේ තාක්කල්

අපට සහ ප්‍රජා මූල සංවිධානයට මඟපෙන් වූ අපගේ *මාමාට* අපි ස්තූතිවන්ත වෙනවා. ඔහුගේ වයසද නොතකා ප්‍රජා මූල සංවිධානයේ ක්‍රියාකාරිත්වය සහතික කිරීමට හා අපේ අයිතීන් වෙනුවෙන් සටන් කිරීමට ඔහු විශාල උත්සහායක් දරනවා." යනුවෙන් වැල්ලවායේ ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේය.

- ඇටම්පිටියේ දී පැවති සාකච්ඡා වලදී, අනාවරණය වූයේ ඔවුන් තෝරා ගෙන ඇති නායකයා ප්‍රදේශයේ තරුණ සමිතියේ සභාපති බව ය. ජනතාව මහා මාර්ගයේ විරෝධතා දක්වන විට තරුණ තරුණියන් ඔවුන්ට ආරක්ෂාව ලබාදෙන බව ඔවුහු පවසති. "ඔහුගේ වයස බැලූ විට, ඔහුට විශාල දැනුමක් තිබෙනවා. ඔහුට විවිධ ජනතාවන් සමඟ ජාල ද තිබෙනවා. වැඩිහිටි ප්‍රතිචාරකයින් සඳහන් කරන්නේ තරුණ තරුණියන් නව තාක්ෂණය හැසිර වීමේදී වඩා හොඳ බැවින් නායකත්ව තනතුරු දැරීමට ඔවුන් හොඳටම සුදුසු බවයි".

- මාතර ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ, "අපගේ ගොවි සමාගමයේසභාපති හා ලේකම් 2017 වසරේ සිට කැපවීමෙන් වැඩ කරනවා. ඔවුන් ගැටලුව අවබෝධ කර ගැනීමට ඔවුන්ගේ හැකියාව තුළ අත්හදා බැලීම් කරනවා. රාජ්‍ය නිලධාරීන්ට කතා කළ යුතු ආකාරය ඔවුන් අත්දැකීම් වලින් දන්නවා. සෑම රැස්වීමකදීම ඔවුන් අපව නියෝජනය කරනවා. සියල්ල දන්නා නායකත්වයක් අපේ ව්‍යාපාරයට වැදගත් වෙනවා".

- අනෙක් අතට, සමහර ප්‍රදේශ වල නායකත්වය නොමැති වීමට හේතු වන බාධා කරන සාධක තිබිය හැකි බවද නිරීක්ෂණය විය.

  - කණ්ඩායමේ කිසිවෙක් නායකත්වය ගැනීමට උනන්දුවක් නොමැති බව මඩකලපුවේ දී සොයා ගන්නා ලදී. කණ්ඩායමට නිශ්චිත නායකයෙක් සිටී නම් අත්අඩංගුවට ගනු ඇතැයි යන බිය මෙයට හේතු වූ බව අනාවරණය විය.

### 13. භාෂාව ගැටලුවක් ලෙස

- විශේෂයෙන් ද්‍රවිඩ භාෂාව කතා කරන සුළුතර කණ්ඩායම් අතර සහ තමන්ගේ අයිතීන් සඳහා ඉල්ලීම් කරන ප්‍රජාවන් අතර භාෂාව බරපතළ ගැටලුවක් බව සොයාගන්නා ලදී. සාකච්ඡා අතරතුර සඳහන් වූයේ, ඔවුන්ගේ ඉල්ලීම් සන්නිවේදනය කිරීමට සහ රාජ්‍ය නිලධාරීන්ගෙන් අවශ්‍ය අවධානය ලබාගැනීමට සිංහල භාෂාවෙන් සංවාදයේ යෙදීමට නොහැකි වීම බාධාවක් වී ඇති බවයි. අනෙක් අතට, කරන ලද ඉල්ලීම් සඳහා ප්‍රතිචාරය අදාළ රාජ්‍ය අධිකාරිය විසින් සිංහල භාෂාවෙන් යවා ඇති අතර, එමඟින් ප්‍රතිචාරය ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට බාධා වී ඇති බව වාර්තා විය.

  - ඉඩම් වලින් ඉවත්වන ලෙස යවන ලිපි, බොහෝ විට වතු ප්‍රජාවේ සාමාජිකයින් (ප්‍රධාන වශයෙන් දෙමළ භාෂාව කතා කරන) වෙත සිංහල භාෂාවෙන් යවන බව ඇටම්පිටියේදී අනාවරණය විය. ඔවුන්ට සාමාන්‍යයෙන් මෙම ලිපි කියවිය නොහැකි බවත්, ඒවායේ සඳහන් කර ඇති දේ තේරුම් ගැනීමට භාෂාව දන්නා කෙනෙකුගේ සහාය ලබාගත යුතු බවත් ඔවුහු සඳහන් කළහ.

  - මඩකලපුවේ දී, සිංහල හා දෙමළ භාෂාවන් දෙකම දැන සිටි ප්‍රතිචාරක කාන්තාවක් සඳහන් කළේ ඔවුන්ට රාජ්‍ය අධිකාරීන්ට යම් ලිපියක් ඉදිරිපත් කිරීමට ඇති විට හෝ සිංහල කතා කරන ආයතන සමග අන්තර්ක්‍රියා කිරීමට සිදුවූ විට සිංහල භාෂාවෙන් ලිපි කෙටුම්පත් කිරීමට ඇය මූලිකත්වය ගන්නා බවයි.

  - යාපනයේ පිරිමි ප්‍රතිචාරකයෙක් හෙළිදරව් කළේ බොහෝ අවස්ථා වලදී ඔවුන්ට සේවාවන් ලබා ගැනීමට සිදුවන විට, ඔවුන්ගේ ගැටලු සන්නිවේදනය කරන විට, ඔවුන්ගේ අයිතීන් ඉල්ලන විට, භාෂාව ප්‍රබල ගැටලුවක් වූ බවයි. ව්‍යාපාර වල නිරතවීම වැනි දෛනික අන්තර්ක්‍රියා වලදී භාෂාමය කුසලතා විශාල ගැටලුවක් ලෙස ඔවුන් දුටුවේ නැත. "ව්‍යාපාර වල නියැලෙන විට භාෂාව අපට ගැටලුවක් නොවෙයි. අපේ සාප්පු වලට පැමිණෙන සිංහල

පාරිභෝගිකයින් සමඟ අපි කෙසේ හෝ කතා කරනවා. නමුත් අපේ අයිතීන් ඉල්ලීමේදී, භාෂාව විශාල ගැටලුවක් වෙනවා".

### 14. කම්කරු සංගම් හරහා පුරවැසි සහභාගිත්වය

- විශේෂයෙන් වතු වල සිටින මලෙයියාහා දෙමළ ප්‍රජාවට තම අයිතීන් සඳහා සමාගමයේ නිදහස ඔවුන්ගේ කම්කරු සංගම් හා ඒවායේ සාමාජිකත්වය හරහා තිබී ඇත. කෙසේ වෙතත්, බොහෝ ආකාර වලින් ඔවුන්ගේ සහභාගිත්වයට පහසුකම් සපයන එම කම්කරු සංගම් වුවද මෙම ප්‍රජාවේ අනන්‍යතාවය බලාත්මක කරනු ලබන්නේ පුරවැසියනී ලෙස නොව කම්කරුවනී ලෙස ය. කම්කරු සංගම් දුර්වල වූ විට, තමන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් කිරීමට ඔවුන් සඳහා ශක්තිමත් මාර්ගයක් නොමැති බව විශ්වාස කිරීමට ජනතාව වැඩියෙන් පෙළඹෙති. මෙහි ප්‍රතිඵලයක් ලෙස, පුරවැසි සහභාගිත්වය සඳහා කම්කරු සංගම් හරහා සිදු කෙරෙනවාට වඩා ප්‍රජාවට වෙනත් මාර්ග සොයා ගැනීම වැඩි වැඩියෙන් වැදගත් වෙමින් තිබේ.

  - ➢ ඇටම්පිටියේ වතු වල පැවති සාකච්ඡා වලදී සොයාගනු ලැබුවේ මීට පෙර වතු ප්‍රජාවන් අතර ගැටලු පැවති විට ඔවුන්ගේ සහයෝගය සඳහා කම්කරු සංගම් පැවති බවයි. "අප අතර, X,Y සහ වෙනත් බොහෝ කොමියුනිස්ට් කම්කරු සංගම් තිබුණා. අපි එම කම්කරු සංගම් වල සාමාජිකයින් වූ අතර, ඔවුන් අප වෙනුවෙන් සියළුම නීතිමය ක්‍රියා පටිපාටි සිදු කළා. නමුත් සමාගම විසින් අප වෙනුවෙන් මෙම කම්කරු සංගම් වලට සාමාජිකත්ව ගාස්තුව ගෙවන්නේ නැහැ. ඒ නිසා, කම්කරු සංගම් තවදුරටත් අපව නියෝජනය නොකරන අතර, අප සිටින්නේ තනිවමයි. අපි සිටින්නේ අපේ අයිතීන් වෙනුවෙන් සටන් කිරීමේ පිරිවැය දැරිය හැකි තත්ත්වයක නොවෙයි. එමෙන්ම, එය කළ හැකි කෙසේද යන්න පිළිබඳ දැනුමක් ද අප සතුව නැහැ."

  - ➢ ඇටම්පිටියේ වතු ප්‍රජාවේ ප්‍රතිචාරකයින් ද සඳහන් කළේ, "අපට තවදුරටත් උපකාර කිරීමට කම්කරු සංගම් නොමැති බැවින්, යෞවන සමාජ හරහා අපේ අයිතීන් වෙනුවෙන් සටන් කිරීමට ඇති හැකියාවන් පිළිබඳව අපි සිතා බලනවා. අපට වඩා නිරාවරණය වුණු, සහ අධ්‍යාපනය සහිත තරුණ තරුණියන් රාශියක් වතු වල සිටිනවා. ඔවුන් ජාතික මට්ටමේ දේශපාලන පක්ෂ වලට ද සම්බන්ධයි. අපේ අයිතීන් උල්ලංඝනය වුණොත් අප වෙනුවෙන් සටන් කිරීමට ඔවුන්ට වඩා හොඳ හැකියාවක් තිබෙනවා". ප්‍රජා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා වතු වල සාමූහිකයන් ඓන්ද්‍රියව ගොඩනැගීම දිරිගැන්වීමේ අවස්ථාවක් ලෙස තරුණ පරපුර සැලකිය හැකි ය. මලෙයියාහා දෙමළ තරුණ තරුණියන් ඔවුන්ගේ වැඩිහිටි සගයන්ට වඩා වෙනස් වන බව මෑතකදී කළ සමීක්ෂණයකින් හඳුනාගෙන ඇත. ඔවුන් වඩාත් ප්‍රගතිශීලි හා ඔවුන්ගේ අයිතීන් වෙනුවෙන් හඬ නඟන බව සොයා ගෙන ඇත.[17]

### 15. මලෙයියාහා දෙමළ ප්‍රජාවගේ ගැටලු

- ප්‍රජාව විසින් තමන්ගේ ක්‍රියාකාරී පුරවැසිභාවය ක්‍රියාත්මක කිරීමට හා තම අයිතීන් වෙනුවෙන් සටන් කිරීමට උත්සාහ දරන විට සමාජය අතර වතු වල ජීවත්වන මලෙයියාහා දෙමළ ප්‍රජාවේ වටහාගත් අනන්‍යතාව, ප්‍රජාවට ගැටලුවක් වී ඇති බව පෙනී යයි. මෙම ප්‍රජාව ඓතිහාසිකව වෙනස්කොට සැලකීම් වලට ලක්ව ඇති අතර, ඔවුන්ගේ ගැටලුව ප්‍රජාව තුළ මතු කරන විට, එය වැදගත් ලෙස නොසැලකේ.[18] එබැවින්, අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන්ට සමාන ලෙස නොසලකන බැවින් හෝ බලවත් යැයි නොසලකන බැවින් මෙම ප්‍රජාවට බලපෑම් කිරීම වඩා දුෂ්කර වී ඇත.

[17] Study findings extracted from the Social Scientists' Association, from the project titled, 'Youth as a Catalyst for Political Change'. Fieldwork conducted between February to April 2022 [Report Unpublished]

[18] Gunasekara, V., Surenthiraraj, R., & Tilakaratne, P. (2019a). Services And Legitimacy: Exploring the Everyday Experiences of the State in Sri Lanka

- මලෙයියා හා දෙමළ ප්‍රජාවේ සාමාජිකයෙකු සමග ප්‍රවීණයන් කළ සම්මුඛ සාකච්ඡාවකදී හෙළිදරව් වූයේ, "සිංහල ජනවාර්ගික ප්‍රජාවට හා මලෙයියාහා දෙමළ ජනවාර්ගික ප්‍රජාවට සම්බන්ධ ගැටලුවක් ඇති විට, බොහෝ අවස්ථා වලදී ප්‍රමුඛත්වය සහ වටිනාකම ලබා දෙන්නේ සිංහල ප්‍රජාවේ ගැටලු වලට යි. මෙසේ සිදුවන්නේ ඔවුන් සමග සංසන්දනය කිරීමේදී මලෙයියාහා දෙමළ ප්‍රජාව වැදගත් ලෙස නොලසකන නිසා ය."

### 16. පෞද්ගලික ජාල ශක්තියෙහි මූලාශ්‍රයක් ලෙස

- ප්‍රාදේශීය මට්ටමේ ප්‍රජා මූල සංවිධාන වල සාර්ථකත්වය පෞද්ගලික ජාල කෙතරම් හොඳින් පවත්වා ගන්නේද යන්න මත ද රඳා පවතී. මෙම ජාල රාජ්‍ය නොවන සංවිධාන, දේශපාලනික ජාල හෝ රජයේ නිලධාරීන් සමග විය හැකිය. එවැනි ජාල පවත්වා ගෙන යාම ප්‍රජා මූල සංවිධාන වල සාර්ථකත්වය සඳහා වැදගත් විය හැක. කෙසේවෙතත්, ඒ සමගම, එවැනි ජාල භාවිතය පුරවැසියන්ගේ සමස්ථය ඇතුළත් කරන සහභාගිත්වය සහතික කිරීමේදී අභියෝගයක් විය හැකි අතර, එම ක්‍රියාවලියේදී ජනතාවගේ දේශපාලනික ජාල හෝ අනුබද්ධ වීම් මත පදනම්ව සමහර කණ්ඩායම් බැහැර කිරීමට හේතු විය හැකිය.[19]
    - මාතරදී පැවැත්වූ සාකච්ඡා වලින් අනාවරණය වන්නේ ප්‍රාදේශීය ප්‍රජා මූල සංවිධාන සාර්ථකත්වය ලබා ගැනීම සහතික කිරීම සඳහා ජාල කිහිපයක් සහ ප්‍රවීණයින් භාවිතා කරන බවයි. "අපි දීර්ඝ කාලයක් තිස්සේ නීතිපති කාර්යාලය, ආණ්ඩුකාරවරයාගේ කාර්යාලය සමඟ කටයුතු කර තිබෙනවා. තවද අපි වාර්මාර්ග දෙපාර්තමේන්තුව, ප්‍රදේශයේ වෙළඳ සමාගමයේසභාපති, ජාතික දේශපාලන පක්ෂයක ප්‍රාදේශීය සජීවීකාරක, සහ රාජ්‍ය විශ්වවිද්‍යාලයක මහාචාර්යවරුන් සමඟ ද වැඩ කර තිබෙනවා. අපි යන ඕනෑම තැනක ජාල ගොඩ නගා ගැනීමට උත්සාහ දරනවා. සාර්ථකත්වය ළඟා කර ගැනීමට හා අපගේ අයිතීන් දිනා ගැනීමට අපට උපකාර කළ හැකි කවුරුන් හෝ සිටිනම්, අපි ඔවුන්ව සම්බන්ධ කර ගන්නවා. එය අපේ ශක්තිය යි."
    - වැල්ලවායේ පැවැත්වූ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙකු හෙළිදරව් කළේ, " 1980 සිට ගම සංවර්ධනය කිරීමට *මාමා* ජාතික දේශපාලන පක්ෂයක් සමඟ කටයුතු කළා. ඒ නිසා ඔහු නිරන්තරයෙන්ම රජයේ නිලධාරීන් සමඟ කටයුතු කරනවා. *මාමා* ඉඩම් ඔප්පු පිළිබඳව රජයේ නියෝජිතායතන සමඟ සාකච්ඡා කිරීමට සෑමවිටම පෙරමුණ ගන්නවා. *සමෘද්ධි* ලැයිස්තුව සාදන විට පවා, ගම්වාසීන් පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට රජයේ නිලධාරීන් *මාමා* ව සම්බන්ධ කර ගන්නවා."

### 17. කාන්තාවන්ගේ මහජන සහභාගිත්වය

ඓන්ද්‍රියව ගොඩ නැගුණු සාමූහික හෝ කණ්ඩායම් වල කාන්තා සහභාගිත්වය සිත්ගන්නා සුළු, එහෙත් ප්‍රවේශමෙන් තේරුම් ගත යුතු සමහර විට සංකීර්ණ සංසිද්ධියකි.

- බොහෝ දුරට, කාන්තා සහභාගිත්වය ක්‍රියාකාරී නොවන අතර, ඉඩම් අයිතීන් හා ඉඩම් වලට ප්‍රවේශය වැනි ගැටලු වෙනුවෙන් ඉල්ලීම් කිරීමේදී සහ සටන් කිරීමේදී පිරිමින් වඩාත් සුදුසු වන බව කාන්තාවෝම විශ්වාස කරති. ඇතැම් කාන්තාවන් පුරවැසියන් ලෙස ක්‍රියාකාරීව සහභාගී වීමට ඔවුන්ට ඇති හැකියාව සීමා කරන ඔවුන්ගේ අතීත අත්දැකීම්, වැන්දඹුවන්, අවතැන් වූවන් ලෙස ඔවුන්ගේ තත්ත්වය හා වයස සාධක යන මේවා මඟින් බැඳී සිටින බවද අනාවරණය විය. ක්‍රියාකාරී පුරවැසිභාවය ක්‍රියාත්මක කිරීමට කාන්තාවන්ට වඩා පිරිමින් හොඳ බව සමහර කාන්තාවෝ විශ්වාස කරති.

    - මාතරදී කාන්තා කණ්ඩායම සමඟ පැවැත්වූ සාකච්ඡා වලදී අනාවරණය වූයේ සහභාගිත්වය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය අක්‍රිය අදහසක් මත පදනම් වූවක් වන බවයි. අප සමග සම්බන්ධ වූ කාන්තාවන් අනාවරණය කළේ ඔවුන් එළවළු හා පළතුරු සිටුවීම වැනි ක්‍රියාකාරකම් සඳහා වැඩියෙන් ආයෝජනය කරන බවයි. "ඔවුන් අයත් වන්නේ ලොකු සමිති වලටයි (මින් අදහස් කළේ ප්‍රදේශයේ පිරිමින් නායකත්වය සපයන ගොවි සමිති ය), අපිව හඳුන්වන්නේ "කාන්තා ගොවි සමිති" ලෙසයි. අපි එළවළු සිටුවීම වැනි කුඩා

[19] https://www.cpalanka.org/wp-content/uploads/2021/08/12-Chapter-8.pdf

ක්‍රියාකාරකම් වල බොහෝ විට නිරත වෙනවා. අපි ඔවුන් සමඟ සෘජුවම වැඩ නොකළත්, ලොකු සමිතියට අපි අපේ සහාය ලබා දෙනවා."

- එමෙන්ම, කන්කසන්තුරේදී යළි පදිංචි කළ කාන්තාවන් සමඟ පැවති අන්තර්ක්‍රියා අතරතුර අනාවරණය වූයේ, ඉදිරියට ගොස් ඉඩම් අයිතීන් සම්බන්ධ ගැටලු වෙනුවෙන් සටන් කිරීමෙහි වැඩියෙන් නිරත වන්නේ ප්‍රදේශයේ පිරිමින් බවයි. ඔවුන් පැවසූ පරිදි, එවැනි ගැටලු විසඳීමට පිරිමින් නායකත්වය ගන්නා විට ගැටලු සඳහා විසඳුම් ලබාගැනීමට ඇති ඉඩකඩ වැඩි බවයි.

- ගුණාත්මක සාකච්ඡා වලදී, රජයේ ආයතන වෙත ප්‍රවේශ වන විට සමහර තත්ත්වයන් යටතේ කාන්තාවන් වෙනස්කොට සැලකීමට ලක්වන ආකාරය ද සාකච්ඡා කෙරුණි. මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පාදක කොටගත් වෙනස්කොට සැලකීම කාන්තාවන්ගේ සමාගමයේනිදහස සීමා කරයි. විශේෂයෙන් ආසාධාරණයන්ට එරෙහිව සටන් කිරීමට පියවර ගැනීමේදී එසේ සිදුවේ. මෙම සක්‍රීය වෙනස්කොට සැලකීම රජයේ ආයතන වල හා නිලධාරීන්ගේ අවධානය ආකර්ෂණය කර ගැනීමේ වඩා හොඳ අවස්ථාවක් කාන්තාවන්ට වඩා පිරිමින්ට ඇති බවට පවතින අවබෝධය බලාත්මක කරයි.

- යාපනයේ ප්‍රතිචාරක කාන්තාවක් ප්‍රදේශයේ පොලිස් ස්ථානයට ගිය විට සිදු වූ සිද්ධියක් අනාවරණය කළාය. "ඔවුන් මාව මුළු දවසම පොලිස් ස්ථානයේ රඳවා ගත්තා. කිසිම නිලධාරියෙකු මගේ ගැටලුවට ප්‍රමුඛතාවය දීමට කැමති වුණේ නැහැ. මට ලොකු අපහාසයක් දැනුණා. එක් වේලාවක මට හිතුනා මාත් සමඟ පිරිමියෙකු සිටියා නම් වඩාත් හොඳයි කියා. මේ දේවල් වෙනස් ආකාරයකින් සිදුවන්නට තිබුණා"


- සමහර අවස්ථා වලදී හා සන්දර්භයන් තුළ කාන්තාවන් සක්‍රිය සහභාගිත්වය පෙන්නුම් කර ඇති බව සඳහන් කිරීම ද වැදගත් ය. සමාජ විද්‍යාඥයින්ගේ සංගමය මගින් මීට පෙර සිදු කළ පර්යේෂණ වලට අනුව,[20] මෙය මූලිකව දිස්වන්නේ පිරිමින් නගර කරා සංක්‍රමණය වී කාන්තාවන් ගම්වල වැඩ කටයුතු වලින් බහුතරයක් සිදු කරන පෙදෙස්වල ය. එම අධ්‍යයනයම දරිද්‍රතාවය සහ වැන්දඹු භාවය වැනි ඇතැම් අවදානම් මගින් කාන්තාවන් තමන්ගේ දුක් වේදනා තුරන් කිරීමේ උත්සාහයන්හි සහභාගි වීමේදී ඔවුන්ව වඩාත් ශක්තිමත් කරන ආකාරය සාකච්ඡා කරයි. ඇතැම් සිද්ධි වලදී, රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධ වීම හා ඔවුන් එහි සිටීම, විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් කොන් කිරීමට ලක්ව ඇති දිස්ත්‍රික්ක වල, කාන්තාවන්ට අත්‍යවශ්‍ය වන නිරාවරණය හා දැනුම ලබා දෙයි.

  - වැල්ලවායේ ප්‍රජා මූල සංවිධානයක ප්‍රතිචාරක කාන්තාවක් "දැන් අපි සියළුම විරෝධතා වලට යනවා. අපේ ප්‍රදේශයේ වැඩ කරන ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධානය ද කාන්තාවන් නායකත්වය සපයන සංවිධානයක්. ඔවුන් අපට ගොඩාක් උදව් කරනවා" යනුවෙන් හෙළිදරව් කළාය.

**ප්‍රාදේශීය සංවිධාන මගින් අන්තර්-වාර්ගික මුලපිරීම්**

වාර්තාවේ මෙම කොටසෙහි අපි අවධානය යොමු කරන්නේ අන්තර්-වාර්ගික මුලපිරීම් වලට පුරවැසියන්ට සහභාගි වීම සඳහා ප්‍රජා අවකාශය තිබීම මෙන්ම එසේ සහභාගි වීමට ඔවුන්ට ඇති හැකියාව කෙරෙහි ය. මෙම විමර්ශනය තුළ, අප විසින් සාකච්ඡා කරන්නේ, මෙම ආකාර වල අන්තර්-වාර්ගික මුලපිරීම් සඳහා පවතින අවකාශයේ ස්වභාවය, මෙම ගැටලු සම්බන්ධයෙන් වැඩ කිරීම වැදගත් වන්නේ මන්ද, ප්‍රාදේශීය මට්ටමින් එවැනි මුලපිරීම් සඳහා අවකාශයක් නිර්මාණය කිරීමට කළ හැක්කේ කුමක්ද, එවැනි හිතකර අවකාශයන් නිර්මාණය කිරීමේදී ප්‍රධාන පාර්ශවකරුවන් වන්නේ කවුද (කරුණාකර 5 වන රූපය බලන්න) සහ අපේක්ෂා කළ හැකි කුමන ආකාරයේ අභියෝගයක් ද යනාදිය ගැන යි. මෙම මුලපිරීම් ඓන්ද්‍රියව ගොඩ නැගුණු පුරවැසි අරගල වලින් වෙනස් වන්නේ කෙසේද සහ මන්ද යන්න ද එය සාකච්ඡා කරයි.

[20] Extracted from the study on 'Gender and Social Inclusion Analysis: An Investigation of the Challenges of Community Participation to Inform the Social Cohesion and Reconciliation Project'. Conducted in 2019 by the Social Scientists' Association for the United States Agency for International Development.




*5 වන රූපය: ප්‍රාදේශීය මට්ටමේදී අදාළ පාර්ශවකරුවන් (අන්තර්-වාර්ගික මුලපිරීම් පිළිබඳව කටයුතු කරන සංවිධාන තුළ)*

1. **ඉල්ලුමක් නොමැති විට අවකාශයක් නිර්මාණය කිරීම**

- අන්තර්-වාර්ගික මුලපිරීම් ප්‍රචලිත කිරීමට හෝ ඒ පිළිබඳව දැනුවත් කිරීම සඳහා කණ්ඩායම් පිහිටුවීමට බොහෝ විට සැලකිය යුතු මහජන ඉල්ලුමක් නොමැත. මේ අනුව, බොහෝ මුලපිරීම් දියත් කරනු ලබන්නේ සංවිධාන මගින් මෙහෙයවනු ලබන මැනවින් සංවිධානය කරන ලද ව්‍යාපෘතියකින් හෝ වැඩ සටහනකින් ලැබෙන තල්ලුවක් සමඟිනි. කෙසේවෙතත්, පෙර නොදුටු විරූ සිදුවීම් වලදී මෙන් වාර්ගික සමගියට තර්ජනයක් විය හැකි ප්‍රාදේශීය මට්ටමේ ගැටලු වලදී මැදිහත්වීම සම්බන්ධයෙන් ගත් කල මෙම සංවිධාන තිබීම හිතකර වේ. අන්තර්-වාර්ගික සමගිය කෙරෙහි ඇතිවන ගැටලු විසඳීමට සහ එවැනි අභියෝග වලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට මෙන්ම, ප්‍රජාවන් එකිනෙකා සමඟ දැන හැඳින ගැනීමටත්, ස්ථාපිත කර ඇති අවකාශයන් වැඩදායක වන බව ඔප්පු වී ඇත. ඒ අනුව, මැදිහත්වීම් වලට සම්බන්ධ බොහෝ අභියෝග සහ උදාසීනත්වයන් තිබියදීත් (මේවා මෙම කොටස තුළ තවදුරටත් සාකච්ඡා කෙරේ), අන්තර්-වාර්ගික මුලපිරීම් සඳහා ප්‍රජා අවකාශය නිර්මාණය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා එවැනි මුලපිරීම් වල අඛණ්ඩ මැදිහත් වීම සහ පැවතීම දිරිමත් කරනු ඇත.

- මඩකලපුවේ පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක සිටි මුස්ලිම් ජාතික ප්‍රතිචාරකයෙකු අනාවරණය කළේ, "පාස්කු ඉරිදා ප්‍රහාර වලින් පසු අන්තර්-වාර්ගික වැඩසටහන් වලින් අප ගැන දැන සිටි පියතුමන්ලා කිහිප දෙනෙක් (කතෝලික පියතුමන්ලා ගැන සඳහන් කරමින්) අපව සොයා ගෙන පැමිණියා. ඔවුන් අප ගැන කනස්සල්ලෙන් සිට අප හොඳින් සිටින බව

සහතික කර ගැනීමට අවශ්‍ය වුණා. ඒ අවස්ථාවේදී ඔවුන් අපට ගොඩාක් උදව් කර අපව ආරක්‍ෂා කළා."

- මඩකලපුවේ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ, "අපේ ප්‍රදේශයේ සුසාන භූමියක් පිළිබඳ ප්‍රශ්නයක් තිබුණා. මෙය රෝමානු කතෝලික ප්‍රජාවේ සාමාජිකයන් සහ වෙනත් දේවස්ථානයක් අතර තිබුණු ගැටලුවක්. මේ ගැටලුව ගැන දිස්ත්‍රික් අන්තර්-ආගමික කමිටුව මැදිහත්වී එය විසඳනු ලැබුවා"

- අන්තර්-වාර්ගික වැඩ සටහනකින් එකිනෙකා හඳුනාගත් බෞද්ධ භික්ෂුවක් සහ මුස්ලිම් මවුලවිතුමා ප්‍රජා මට්ටමේ ගැටලුවක් විසඳීමට එක්ව කටයුතු කිරීම ගැන සිදුවීමක් ප්‍රවීණයින් සිටි සම්මුඛ සාකච්ඡාවකින් අනාවරණය විය. ගිරිතලාව විහාරස්ථානයේ නායක හාමුදුරුවෝ අපේ වැඩසටහන් වල අප සමඟ වැඩ කරනවා. සොරකමක් සම්බන්ධයෙන් ප්‍රජාව තුළ ගැටලුවක් ඇතිවුණු අතර, ඒ සම්බන්ධයෙන් මුස්ලිම් ජාතිකයෙකුට චෝදනා එල්ල වුණා. නායක හාමුදුරුවෝ මවුලාවිතුමා සමඟ මැදිහත්වී ගැටලුව සමථයට පත් කිරීමට හැකිවුණා"

## 2. සහභාගිත්වය සඳහා පෙළඹවීම

- ඉහත කාරණයේදී සාකච්ඡා කළ පරිදි, ජනතාවගෙන් සැලකිය යුතු ඉල්ලුමක් නොමැති විට, වැඩසටහන් සහ මුලපිරීම් වල සහභාගි වීම සාධක තුනක් හේතුවෙන් සිදුවේ. පළමු සාධකය වන්නේ සහයෝගිතාව පෙන්වීමයි. මෙම මුලපිරීම් සජීවිකරණය කරන පුද්ගලයින් සතුව හොඳ සමාජ ප්‍රාග්ධනයක් තිබේ. එබැවින් සහයෝගිතාව, මිත්‍රත්වය යන මේවායේ ඉඟියක් ලෙස, හෝ සජීවීකාරක කෙරෙහි ඇති ගරුත්වය ලෙස, එවැනි මුලපිරීම් වලට ප්‍රාදේශීය ජනයා සහභාගි කරගත හැක. දෙවැනි සාධකය වනුයේ, පිළිගැනීම, ජාලගත වීමේ අවස්ථා, සහ නිරාවරණය වැනි සහභාගිත්වය හරහා ලැබෙන ස්පර්ශ කළ නොහැකි (wiamDYH) ප්‍රතිලාභ ය. තෙවන සාධකය වනුයේ, මෙම මුලපිරීම් වලට සහභාගි වීමට ජනයා දිරිමත් කරන ගමන් දීමනා වැනි, ලැබෙන මූල්‍යමය ආධාර ය.

  - ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ, "සමහරුන්ට සිදුවීම් වලට සහභාගි වීම නව අත්දැකීමක් වෙනවා. ඔවුන්ට හොඳ හෝටලයක නැවතීමට අවස්ථාව ඇති අතර, වැඩසටහන අතරතුර විවේක කාලය භුක්ති විඳීමට හැකි වෙනවා. එය ඔවුන්ගේ දෛනික ජීවිතයේ දුර්ලභ සිදුවීමක්."

  - ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ "අපගේ සිදුවීම් වලට සහභාගි වන බොහෝ දෙනෙකු සඳහා අපි ඔවුන්ට ලබාදෙන ගමන් දීමනාව ඉතා වටිනවා. සමහරු සිදුවීම් සඳහා පැමිණෙන්නේ මෙම දීමනා බලාපොරොත්තුවෙන්."

  - සමාජ ජාල පවත්වා ගෙන යාමේ ආකාරයක් ලෙස සහ සහයෝගිතාවේ ලකුණක් ලෙස සහභාගිත්වය සිදුවන අන්දම විස්තර කරමින් ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ, "අපි ගමේ බෞද්ධ භික්ෂූන් වහන්සේ සමඟ සමීපව වැඩ කරනවා. අප *කඨින පින්කමට* යනවා. අපි භික්ෂූන් වහන්සේට යමක් ගෙන යන විට එතුමා එය අගය කරනවා. ඕනෑම පෞද්ගලික ඉල්ලීම් වලදී ද අපි එතුමාට සහයෝගය ලබා දෙනවා. අපි උන්වහන්සේ සමඟ සුහද සබඳතාවක් පවත්වා ගෙන යන නිසා, උන්වහන්සේ පෙරළා අපේ වැඩ වලට සහයෝගය දෙනවා"

  - ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් හෙළිදරව් කළේ, "අපිට අපේ ප්‍රජාවේ ජනතාව සමඟ හොඳ සුහදතාවයකින් සිටිය යුතු වෙනවා. අපට මළගෙවල් වලට යන්න වෙනවා. කවුරු හෝ අසනීප වුණාම අපි ඔවුන්ව බලන්න යා යුතුයි. නැතහොත්, අපි සංවිධානය කරන සිදුවීම් වලට ඔවුන් පැමිණෙන්නේ නැහැ. අහම්බෙන් හෝ අපට මළගෙදරකට යාමට නොහැකි වුනොත්, ඔවුන් අප සමඟ අවුල් වෙනවා"

## 3. අන්තර්-වාර්ගික මුලපිරීම් පිළිබඳව මහජන මතය

- බොහෝ අවස්ථා වලදී, ස්ථාපිත වී ඇති ප්‍රාදේශීය හෝ ජාතික නියෝජිතායතන මගින් ඔවුන්ගේ වරමෙහි කොටසක් ලෙස මෙම වැඩසටහන් සංවිධානය කරති. ප්‍රාදේශීය ජනතාව මෙසේ සංවිධානය කළ මුලපිරීම් වලට සහභාගි වෙති. මෙම නියෝජිතායතන ඔවුන්ගේ සංවිධානයික පසුබිම නොතකා, ප්‍රාදේශීය මට්ටමේ ප්‍රදේශවාසීන් අතර බොහෝ විට ක්ෂණිකවම රාජ්‍ය නොවන සංවිධාන ලෙස ලේබල් ගැසෙති. මේ හේතුවෙන් ප්‍රජාවන් අතර මිශ්‍ර අර්ථ නිරූපණ තිබීමට මඟ පාදයි. බොහෝ ප්‍රදේශවාසීන් මෙම සංවිධාන වටහා ගනු ලබන්නේ, ජාත්‍යන්තර වරමක් මත කටයුතු කරන අය ලෙස, විශාල අරමුදල් සහිත සංවිධාන ලෙස, රාජ්‍යයට හෝ රටේ බහුතර ජනවාර්ගික-ආගමික ප්‍රජාවට එරෙහි න්‍යාය පත්‍ර සහිත අය ලෙස, හෝ දුප්පතුන්ට උපකාර කරන අය, යනාදිය ලෙස ය. එක් අතකට, එවැනි වටහා ගැනීම් තිබීම ප්‍රජාවේ සමහර සාමාජිකයින් අතර සහභාගිත්වයට අනුබල දෙන්නේ, මෙම මුලපිරීම් වලට සහභාගි වීමෙන් ඔවුන්ට යම් ආකාරයක ද්‍රව්‍යමය ප්‍රතිලාභ ලබාගත හැකි යැයි ඔවුන් විශ්වාස කරන බැවිනි. අනෙක් අතට, සමහර ප්‍රදේශවාසීන් සහභාගි වීමට අධෛර්යමත් වන්නේ මෙම මුලපිරීම් නිෂ්ඵල වන බව හෝ ඒවා රාජ්‍යයට එරෙහිය යන හැඟීම හේතුවෙනි.

  - මාතර පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ ප්‍රජාවේ ඇතැම් සාමාජිකයන් අතර මෙවැනි මුලපිරීම් වලට දැඩි ඍණාත්මක අර්ථ නිරූපණයක් ඇති බවයි."මෙම ප්‍රදේශයේ සිංහල ප්‍රජාවේ සමහර සාමාජිකයින් පවසන්නේ මෙම මුලපිරීම් මුදල් සහ කාලය නාස්ති කිරීමක් බවයි. අන් අය මෙම මුලපිරීම් රට පාවා දෙන බව පවසනවා. මෙම මුලපිරීම් වල සංකල්ප හා අභිලාෂයන් පිළිබඳව ඇසූ විට ඒවා රාජ්‍ය නොවන සංවිධාන වල ව්‍යාපෘති ලෙස ක්ෂණිකවම ලේබල් කරන අයත් ඉන්නවා"

  - ඍණාත්මක අවබෝධයද ජනතාව ස්වේච්ඡාවෙන් හෝ සැබෑ උනන්දුවකින් සහභාගි වීමෙන් වළක්වයි. "අපි සංවිධානය කරන සිදුවීම් වලට පැමිණෙන ජනතාව අපට පවසන්නේ ඔවුන් අපේ මිතුරන් වන නිසා පැමිණි බවයි. එසේ නොමැති නම්, ඔවුන්ට පැමිණීමට අපේක්ෂාවක් තිබුණේ නැහැ. සාමාන්‍යයෙන් සහභාගි වන්නන්ගේ කවයෙන් ඔබ්බට පුද්ගලයින්ගේ සහභාගිත්වය දිරිමත් කිරීමට උත්සාහ කරන විට, බොහෝ අවස්ථා වලදී මිනිසුන් තම ඥාතීන් හෝ සමීප මිතුරන් සහභාගි කරවන බව අනාවරණය විය. ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් සඳහන් කළේ, "සාමාන්‍ය කවයට පිටින් සහභාගි වන අය මෙම සිදුවීම් වලට පැමිණෙන්නේ එක්කෝ ඔවුන් මෙම ජනතාවගේ සමීප මිතුරන් වීම හෝ ඔවුන් ඥාතීන් වන නිසාය"

  - අධික අරමුදල් පිළිබඳ අවබෝධය ද සහභාගි වන අය යම් ආකාරයක මූල්‍ය ප්‍රතිලාභ උපයා ගැනීම පිණිස එසේ කරන බවට අදහසක් නිර්මාණය කරයි. "රාජ්‍ය නොවන සංවිධානයක් මුදල් රාශියක් වැය කරන බව දකින විට, විශාල හෝටල් වල සිදුවීම් සංවිධානය කරන අතර ජනතාව සහභාගි වන බව දකින විට, ඇතැම් ජනතාව සිතන්නේ මෙම සංවිධාන මුදල් රාශියක් උපයන බැවින් එසේ කරන බවයි," යනුවෙන් ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් සඳහන් කළේය.

  - අනුරාධපුර පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් පැවසුවේ "පොදුවේ ගත් කළ, අප අතර සාමයට හා සමගියට ප්‍රධාන බාධාවක් නැහැ. නමුත් විෂබීජ මෙන් කටකතා පතුරුවන සමහර ආගමික නායකයින් ඉන්නවා. එක් කාලයක අනුරාධපුරයේ විශාල ගැටලුවක් තිබුණා මට මතකයි, මෙහිදී සහනාධාර සහ සංවර්ධන ව්‍යාපෘති වලට අවධානය යොමු කළ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක් ක්‍රිස්තියානි ආගම පතුරවන බවට ජනතාව චෝදනා කළා. මේ කටකතාව පැතිරෙව්වේ ප්‍රදේශයේ සිංහල-බෞද්ධ සංවිධානයක භික්ෂූන් වහන්සේලා කණ්ඩායමක් බව මට මතකයි" යනුවෙනි.

  - කළුතර පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක මුස්ලිම් නොවන ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ, "මම මුස්ලිම් ප්‍රජාවට උපකාර කිරීමට ගිය විට, ප්‍රදේශයේ බෞද්ධයින් මට මොහොමඩ් කියා කතා කිරීමට පටන් ගත්තා. මුස්ලිම් ජනතාවට උදව් කර ප්‍රශ්න වලට පැටලෙන්න එපා කියා පැවසුවා" යනුවෙනි.

## 4. අන්තර්-ආගමික කටයුතු සඳහා ජාතික මට්ටමේ පිළිගැනීම ධනාත්මක සාධකයක් ලෙස

- අන්තර් ආගමික මුලපිරීම් සඳහා ප්‍රාදේශීය මට්ටමේ ජනතාවගේ බහුතරයකින් සැලකිය යුතු ඉල්ලුමක් නොමැති වුවත්, ජාතික මට්ටමින් වරින් වර ගන්නා ලද පියවර ප්‍රාදේශීය මට්ටමින් අන්තර්-ආගමික මැදිහත්වීම් ප්‍රවර්ධනය කර ඇති බව පෙනේ. ජාතික මට්ටමේ ප්‍රයත්නයන් ප්‍රාදේශීය මට්ටමේදී මෙම කටයුතු සඳහා පිළිගැනීම ඉහළ නැංවීමට උපකාරී වී ඇත. උදාහරණයක් ලෙස, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජාතික ඒකාබද්ධතා නිලධාරීන්ගේ කටයුතු හා මුලපිරීම් හරහා ප්‍රජාවන් අන්තර්-ආගමික සිදුවීම් වලට සහභාගි වී ඇත. තවද, එම සිදුවීම් වලට අවශ්‍ය සම්පත් සපයා දුන් රාජ්‍ය නොවන සංවිධාන සමග ද ප්‍රජාවන් සම්බන්ධ වී ඇත. තවත් එවැනි ධනාත්මක නිදසුනක් වනුයේ, පාසැල් මට්ටමේ දී දිරිමත් කරන අන්තර්-ආගමික මැදිහත්වීම් හා සිදුවීම් ය. සිසුන්ට වෙනත් ප්‍රජාවන්ගේ භාවිතාවන්, චාරිත්‍ර හා සම්ප්‍රදායයන් හුරු කිරීමේ උත්සාහයකින් විවිධ ආගමික කණ්ඩායම් වල විශේෂ උත්සව සහ සිදුවීම් සමරන ලෙස පාසැල් වලින් ඉල්ලා ඇත. මෙම සන්දර්භය එවැනි ක්ෂේත්‍ර ප්‍රගමනය කිරීම සඳහා පාසැල් සමඟ සහයෝගිත්වයෙන් කටයුතු කිරීම සඳහා සංවිධානයට ධනාත්මක පසුබිමක් සකසා ඇත.

  - ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් මෙසේ පැවසීය. "වරක් අපේ ප්‍රදේශයේ බෞද්ධ පාසලකින් එම පාසලේ නත්තල් වැඩසටහනේ සැසියක් කිරීම සඳහා අපේ සංවිධානයෙන් සම්පත්දායකයින් එවන ලෙස ඉල්ලා සිටියා"

  - ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක් අතරතුරදී ප්‍රතිචාරකයෙකු හෙළිදරව් කළේ, ඔවුන්ගේ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සමඟ වැඩ කිරීම පහසු බවයි. ඒ මන්දයත්, එම ප්‍රදේශවල කටයුතු කිරීමට ජාතික ඒකාබද්ධතා නිලධාරීන් හරහා අවකාශයක් නිර්මාණය කර ඇති අතර, එවැනි වැඩ කටයුතු ප්‍රගමනය කිරීම සඳහා ඔවුන්ට සහයෝගය අවශ්‍ය වීමයි.

  - කළුතර ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවකදී මුස්ලිම් නොවන ප්‍රතිචාරකයෙක් හෙළිදරව් කළේ,"වරක් මම කිහිප දෙනෙකුගේ සහභාගිත්වය සහිතව ප්‍රදේශයේ කතෝලික පාසැලක හජ්ජි උත්සවයක් සංවිධානය කළා. වැඩසටහනට සහභාගි වු අය එය ඉතා හොඳ මුලපිරීමක් ලෙස මට ප්‍රශංසා කළා."

## 5. අන්තර්-ආගමික සමගිය ප්‍රගමනය කිරීමට රාජ්‍ය නිලධාරීන් අතර සැබෑ උනන්දුවක් නොමැති වීම

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි රාජ්‍ය ආයතන වලට තම වැඩ කටයුතු හරහා අන්තර්-ආගමික/අන්තර්-ජනවාර්ගික සමගිය ප්‍රවර්ධනය කිරීමට වරමක් ඇතත්, එවැනි ක්ෂේත්‍ර ප්‍රගමනය කිරීම සඳහා රජයේ නිලධාරීන් අතර සැබෑ උනන්දුවක් තිබේද යන ප්‍රශ්නය ඉතිරිව ඇත. සාකච්ඡා වලට සහභාගි වූ ප්‍රතිචාරකයින් පවසන පරිදි, සමහර රජයේ නිලධාරීන් මෙම මුලපිරීම් පිළිබඳව අවංකවම දැඩි ඇල්මක් දක්වන අතර, හුදෙක් සිය වගකීම් ඉටුකිරීමට මෙම මුලපිරීම් වල නිරත වන සමහරු ද සිටිති. ඇතැම් රජයේ නිලධාරීන් මෙම මුලපිරීම් පිළිබඳව ඍණාත්මක අවබෝධයක් දරන අතර, එම වැඩසටහන් ඔවුන්ගේ පෞද්ගලික හෝ පිළිගත් මතවාදී ස්ථාවරයන්ට නොගැලපෙන බැවින් ඒවාට බාධා කිරීමට උත්සාහ දරන බවට ද මෙහිදී සාකච්ඡා කරන ලදී. රජයේ නිලධාරීන්ගෙන් පැමිණෙන මේ ආකාරයේ ප්‍රතිරෝධය හා ඍණාත්මක ආකල්ප ප්‍රාදේශීය මට්ටමේ ප්‍රජාවන්ගේ සමාගමයේ නිදහසට ද බලපෑමක් ඇති කරයි.

  ප්‍රතිචාරකයින් කිහිපදෙනෙක් පහත සඳහන් කරුණු අනාවරණය කළහ.

  - "සමහර රජයේ නිලධාරීන් අපගේ ව්‍යාපෘති ගැන ඇසු විට අප කරන වැඩ වලින් ප්‍රයෝජනයක් නැතැයි පවසනවා", යාපනයේ පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක්

  - "සමහර රජයේ නිලධාරීන්ගෙන් අපි සහයෝගය ඉල්ලු විට ඔවුන් ප්‍රථමයෙන්ම අපෙන් අසන්නේ අපි ඔවුන්ට කොපමණ ගෙවනවාද යන්නයි. එවැනි මුලපිරීම් බොහෝ විට සිදු කරන්නේ රාජ්‍ය නොවන සංවිධාන වල ව්‍යාපෘති වල කොටසක් වන මැදිහත්වීම් ලෙස බව ඔවුන් දන්නවා. ඔවුන් හුදෙක් ඔවුන්ගේ කාර්යයන්හි වගකීම් තුළ රාජකාරි ඉටු කරන විට

පවා අප ඔවුන්ට ගෙවනු ඇතැයි අපේක්ෂා කරනවා" - ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක්

- "රාජ්‍ය නොවන සංවිධාන වලට අවමන් කරන ඇතැම් රජයේ නිලධාරීන් සිටිනවා. අපි සමඟ කතා කිරීමටවත් ඔවුන් කැමති නැහැ" - ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක්
- "එවැනි වැඩ සටහන් කිරීම වෙනුවට ද්‍රව්‍යමය භාණ්ඩ හෝ සලාක බෙදා දෙන ලෙස අපෙන් ඉල්ලා සිටි ඇතැම් රජයේ නිලධාරීන් සිටිනවා. ජනතාවට ආහාර ගැනීමට මුදල් නොමැති කාල වලදී ඔවුන් සමඟ මෙම වැඩසටහන් කිරීමෙන් ඇති ඵලය කුමක් දැයි ඔවුන් අපෙන් විමසනවා" මාතර පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක්

- ඇතැම් රජයේ නිලධාරීන් තමන්ගේ රැකියාවේ කාර්යභාරයන් හෝ වගකීම් ඉටු කිරීමට උනන්දුවක් නොදක්වන නිසා, තමන්ගේ මුලපිරීම් වලට අකැමති වන රජයේ නිලධාරීන් ද සිටින බව ප්‍රතිචාරකයෙක් හෙළිදරව් කළේය. "අප ක්‍රියාකාරීව සිටීම ඔවුන්ට ඔවුන්ගේ වැඩ කටයුතු කිරීමට සහ ක්‍රියාකාරී වීමට ඔවුන්ට බල කරනවා - ඔවුන් එයට අකැමති යි" - ප්‍රවීණ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක්

- ප්‍රතිචාරකයෙන් පහත සඳහන් සිද්ධිය හෙළිදරව් කළේය. "වරක් අපේ සංවිධානය අපේ ප්‍රජාව තුළ ගැටලුවකට මැදිහත් වීමට උත්සාහ කළා. ගැටලුව තිබුණේ බෞද්ධ විහාරස්ථානයක් හා ක්‍රිස්තියානි (රෝමානු කතෝලික නොවන) දේවස්ථානයක් අතර යි. මෙම ප්‍රශ්නයට මැදිහත් වීමට අපි ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරියෙකුව හමුවීමට ගියා. ඔහු මෙම ප්‍රශ්නයට මැදිහත් වීමට උත්සාහ කිරීම නතර කර අපට අපේ වැඩක් බලාගන්නා ලෙස අපට පැවසුවා" - ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක්

- අනුරාධපුරයේ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ, රජයේ නිලධාරීන් තමන්ගේ වැඩ වල භූමිකාවට සහ වගකීම් වලට පමණක් සීමාවී සිටින බවයි. එවැනි වැඩසටහන් ප්‍රගමනය කිරීමට ඔවුන් අතර අපේක්ෂාවක් නොමැති බව ඔවුහු ප්‍රකාශ කළහ.

## 6. සුළුතර ජනවාර්ගික-ආගමික ප්‍රජාවන්ගේ සහභාගිත්වය නිර්ණය කරන සාධක

- සුළුතර ජනවාර්ගික-ආගමික ප්‍රජාවේ සාමාජිකයින් මෙම වැඩසටහන් පිළිබඳව සහ වෙනත් ජනවාර්ගික-ආගමික ප්‍රජාවන්හි සාමාජිකයින් සමඟ වැඩ කිරීමට උනන්දුවක් දක්වන්නේ ඔවුන් සමඟ සහභාගිත්වය සහ ජාලගත වීම ඔවුන්ට ආරක්ෂාව පිළිබඳ හැඟීමක් ලබාදෙන බැවිනි.
  කෙසේනමුත්, සුළුතර ජනවාර්ගික-ආගමික ප්‍රජාවන්ට අයත් සාමාජිකයන් ඔවුන්ගේ ජනවාර්ගික-ආගමික අනන්‍යතාවට බලපාන සිදුවීමකට හෝ ගැටලුවකට මුහුණ දී ඇත්නම් මිස, එවැනි සහභාගිත්වයකට උනන්දුවක් නොපෙන්වන අවස්ථා ඇති බවද අනාවරණය විය.

- මඩකලපුවේ පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ, ඔවුන් සංවිධානය කරන මුලපිරීම් වලට සුළුතර ජනවාර්ගික-ආගමික ප්‍රජාවන්හි සාමාජිකයින් සහභාගි වන්නේ විශේෂයෙන් ඔවුන් ඉලක්ක කර ගනිමින් ජාතික මට්ටමේදී ආතතියක් වූ විට බව ඔවුහු නිරීක්ෂණය කළ බවයි."මම සිතන්නේ අපේ වැඩටසහන් වලට සහභාගි වීම ඔවුන්ට වඩාත් සුරක්ෂිත බව හැඟීමට උපකාරී වන බවයි"

- ක්‍රිස්තියානි සහ රෝමානු කතෝලික ප්‍රජාවන් සමඟ වැඩ කිරීමට උත්සාහ කළ, ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ," මම බොහෝ කලක් තිස්සේ අපගේ මුලපිරීම් වල අප සමඟ කටයුතු කරන ලෙස ක්‍රිස්තියානි (රෝමානු කතෝලික නොවන) සභාවට ආරාධනා කර තිබෙනවා. නමුත් ඔවුන් අප සමඟ එක්වූයේ නැහැ. කෙසේවෙතත්, ඔවුන්ගේ සභාව පිළිබඳව ප්‍රජාව තුළ ඇතැම් ආතතීන් පැවතුණු විට, අප සමඟ වැඩ කිරීමට ඔවුන් උන්නදුවක් දක්වන බව අප දුටුවා"


- කළුතර ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක මුස්ලිම් ප්‍රතිචාරකයෙක් හෙළිදරව් කළේ, "අපේ නිවාස අසල මුස්ලිම් පල්ලියක් තිබෙනවා. මුස්ලිම් පල්ලිය වටා සිටින ජනතාවටත් අප කියන දේ තේරුම් ගත හැකි බැවින් මම යෝජනා කළා සිකුරාදා බයාන් (Bayaan) සිංහලෙන් පවත්වන ලෙස. ශබ්ද විකාශන වල ශබ්දය අඩු කරන ලෙෂ ද මම යෝජනා කළා. මේවා යෝජනා කිරීම පිළිබඳව මුස්ලිම් ප්‍රජාවේ සමහරු මාව විවේචනය කළා. ගමේ පන්සල සමග මම අත්වැල් බැඳගෙන ආගම පාවා දෙන බවට එක් අවස්ථාවකදී කට කතා පැතිරී තිබුණා."

## 7. ජාලයන්හි වැදගත්කම


- කේන්ද්‍රීයව පිහිටුවන ලද ප්‍රාදේශීය කණ්ඩායම් සහ ප්‍රජා මූල සංවිධාන වල සිද්ධියේ දී දුටු අන්දමින්, ඊට සමානව අන්තර්-වාර්ගික මුලපිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී, ජාලයන් ශක්තියක් ලෙස දක්නට ලැබේ. කෙසේනමුත්, භාවිතා කරන ජාලයන්හි වර්ගය සම්බන්ධයෙන් වෙනසක් නිරීක්ෂණය කරන ලදී. ප්‍රජාවේ ගැටලුවක් විසඳන අවස්ථාවේ දී, භාවිතා කළ බොහෝ ජාලයන් පහළ සිට ඉහළට යන ජාල වෙති. එහෙත්, අන්තර්-වාර්ගික මුලපිරීම් ප්‍රචලිත කිරීමේ දී, ජාලයන් ඒකරාශී කරනු ලබන්නේ ඉහළ සිට පහළට ය. මෙයින් අදහස් කෙරෙන්නේ ප්‍රජා මට්ටමේ ගැටලු ගැන සලකා බැලීමේ දී, ජනතාව බිම් මට්ටමේ දී ඒකරාශී වී ජාලයන් හරහා ඉහළ මට්ටමේ බලධාරීන් වෙත ගැටලු ගෙන ඒමට ජාල භාවිතා කරන බවයි; කෙසේනමුත්, අන්තර්-වාර්ගික මුලපිරීම් වල දී, ජනතාවගෙන් සැලකිය යුතු ඉල්ලුමක් නොමැති බැවින්, ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන, පූජ්‍ය පක්ෂය, හෝ රජයේ නිලධාරීන් වැනි ඉහළ මට්ටමේ පුද්ගලයින්, මුලපිරීම් ආරම්භ කර, ගමේ නායකයින් හරහා ජනතාව වෙත ළඟා වන බවයි. (කරුණාකර 6 වන රූපය බලන්න)[21]. අන්තර්-ආගමික වැඩසටහන් වලට මැදිහත් වන්නේ ප්‍රජාවන් තුළ ජනතාව වෙත ළඟා වීමට හැකියාව ඇති අය වෙති, විශේෂයෙන් ප්‍රාදේශීය ආගමික හා ප්‍රජා නායකයින් මඟින් පවත්වා ගෙන යන ජාල හරහා මෙය සිදුවේ. මොවුන් *දායක සභා වල* සාමාජිකයන්, *දහම් පාසැල්* ගුරුවරුන්, පූජ්‍ය පක්ෂය, පාසැල් විදුහල්පතිවරුන් යන අය වෙති. මෙම සන්දර්භයට අනුව, ප්‍රාදේශීය සමාජ ජාල තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරන ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සහයෝගය දිනා ගැනීම සම්බන්ධයෙන් සංවිධාන කෙතරම් සාර්ථක වන්නේ ද යන්න මත සමාගමයේනිදහස ද රඳා පවතින බව පැහැදිලි ය. එක් අතකින්, එවැනි ජාල භාවිතා කිරීම මුලපිරීම් සාර්ථක බව සහතික කිරීම සඳහා ඉහළ සිට පහළට යන ප්‍රවේශයක් භාවිතා කිරීමේ වැදගත්කම පෙන්නුම් කරන්නක් වේ. මෙය සිදුවන්නේ පහළින් සැලකිය යුතු ඉල්ලුමක් නැති විට ය.

[21] Please note that Figure 6 is not an absolute representation of how networks can be mobilized from the top-down or bottom-up levels. Stakeholders and pathways may differ depending on location, context, community, and issue of concern.

අන්තර්-චාර්ගික මුලපිරීම්




සාමුහික අවශ්‍යතා සඳහා කේන්ද්‍රීය ගොඩ නැගීම




ප්‍රදේශයේ ආගමික නායකයින් යහපත් සම්බන්ධතා ඇතිව සිටී නම්, ප්‍රදේශවාසීන්ගේ සහයෝගය හා සහභාගිත්වය සහතික කර ගත හැකි යැයි ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක දී ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේය. "*මේ දායක සභාව* සමඟ සමීපව සිටීම අපට වැදගත් වෙනවා. එසේ නොවුණහොත්, ජනාතව වෙත ප්‍රවේශ වීම දුෂ්කර වෙනවා"

- ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක දී ප්‍රතිචාරකයෙක් සිද්ධියක් ගැන පවසමින් ආගමික නායකයන් සුහදව තබා ගැනීමේ වැදගත්කම අනාවරණය කළේය. "වරක් අපි සැලසුම් කළ වැඩසටහනක් ගැන දිස්ත්‍රික්කයේ ප්‍රධාන බෞද්ධ භික්ෂූන් වහන්සේට දැනුම් දීමට බැරිවුණා. අපට හැකිවූයේ අනෙකුත් තරුණ භික්ෂූන් වහන්සේලාට සහභාගි වන ලෙස ආරාධනා කිරීමට පමණයි. මෙයින් උන්වහන්සේ බෙහෙවින් කලබලයට පත් වුණා. උන්වහන්සේ අපට කතා කර ආරාධනා නොකිරීම පිළිබඳව දොස් පැවරුවා. ඒ සමඟම, අපේ සිදුවීමට ප්‍රදේශයේ වෙනත් කිසිම භික්ෂුවක් සහභාගි නොවන බවට ද සහතික කළා"

- ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රතිචාරකයෙක් මෙසේ පැවසීය. "ප්‍රජාව තුළ නිතරම පන්සලේ ගැවසෙන ජනතාව සිටිනවා. ඔවුන් තමයි පන්සලට ගම යා කරන්නේ. මොවුන්ට විශාල දැනුමක් නොමැති වුවත්, ගම්වාසීන් අතර ඔවුන්ට විශාල පිළිගැනීමක් තිබෙනවා. ඒ නිසා ඔවුන් සමඟ කටයුතු කිරීම අපට වැදගත් වෙනවා. නැත්නම් අපට අපේ වැඩ කටයුතු කර ගැනීමට අපහසු වෙනවා"

- ➢ මඩකලපුවේ සහ යාපනයේ මුස්ලිම් ප්‍රජාවගේ සහභාගිත්වය පිළිබඳව මෙම ස්ථාන දෙකේම පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා වල ප්‍රතිචාරකයින් අනාවරණ කළේ, "මුස්ලිම් ජනතාවගේ සහභාගිත්වය සහතික කර ගැනීමට, ප්‍රථමයෙන්ම අපට ප්‍රාදේශීය *මවුලවි තුමා* සමග කතා කළ යුතු වෙනවා"

- ➢ වතු වල මලෙයියාහා දෙමළ ප්‍රජාවගේ සහභාගිත්වය සම්බන්ධයෙන්, බදුල්ලේ පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් මෙසේ පැවසීය."අපට *තලෙයිවාර්* ගේ අනුමැතිය සහ එකඟතාවය ලබාගත යුතු වෙනවා. ප්‍රජාවේ ජනතාවගේ සහභාගිත්වය ලබා ගැනීමට අපි ඔහු හරහා යා යුතු වෙනවා. නැත්නම්, ඔවුන් අපේ වැඩ කටයුතු වලට බාධාවක් ලෙස ක්‍රියා කර, ප්‍රජාව සමඟ අපේ වැඩ කටයුතු කිරීමට අපට ඉඩ දෙන්නේ නැහැ"

- ➢ අනුරාධපුරයේ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක දී ප්‍රතිචාරකයෙක් මෙසේ පැවසීය. "ජාතික සාම මණ්ඩලය සංවිධානය කළ සියලුම සිදුවීම් වලට මම සහභාගි වී තිබෙනවා. මට අසනීප වුණත්, මම යාමට සෑම උත්සාහයක් දැරුවේ එය මගේ වගකීම ලෙස සැලකූ නිසයි. විශේෂයෙන් පෙරේරා මහතා (ව්‍යාජ නමකි) වැනි පුද්ගලයින් කතා කර සහභාගි වන ලෙස ඉල්ලුවොත්, මම එම සිදුවීම තිබෙන ස්ථානයට සම්පව නොසිටියත්, මම කෙසේ හෝ සහභාගි වීමට මාර්ගයක් සොයා ගන්නවා. ඇත්තටම ඔවුන් සංවිධානය කරන වැඩ සටහන් වර්ගයට මම කැමතියි"

## 8. ප්‍රාදේශීය ආගමික නායකයින් සමඟ සබඳතාව නිර්ණය කිරීමේ සාධකයක් ලෙස

- ප්‍රාදේශීය මට්ටමින් ආගමික නායකයන් අතර තිබිය හැකි ගැටලු ද ප්‍රාදේශීය මට්ටමේ අන්තර් ආගමික මුලපිරීම් සඳහා සමාගමයේ නිදහසට බලපෑම් කරයි. මෙම ගැටලු අන්තර් පුද්ගලික ගැටලු, මතවාදී ගැටුම් හෝ ප්‍රාදේශීය මට්ටමින් ආගමික කණ්ඩායම් වල දේශපාලනයට සම්බන්ධ ගැටලු විය හැකිය. මෙම ගැටලු ප්‍රාදේශීය මට්ටමේ දී පවතින විට ආගමික නායකයෝ අන්තර්-ආගමික සිදුවීම් වලට සහභාගි වීම ප්‍රතික්ෂේප කිරීමට පෙළඹෙති. මෙසේ ප්‍රතික්ෂේප කිරීම මෙම සිදුවීම් වලට ප්‍රජාවෙන් සහභාගි වන මෙම ආගමික නායකයන්ගේ අනුගාමිකයින් සංඛ්‍යාව නිර්ණය කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ආගමික කණ්ඩායම් හෝ නායකයින් අතර ඇති සුහදතාවය පුරවැසි සහභාගිත්වය නිර්ණය කරන විට, එවැනි පළුදු වූ සබඳතා බිම් මට්ටමේ පුරවැසියන්ගේ සමාගමයේ නිදහස මත බලපෑමක් ඇති කරයි.

  - ➢ මාතර පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් ක්‍රිස්තියානි සහ රෝමානු කතෝලික පියතුමෙක් අතර අන්තර් පුද්ගල ගැටලුවක් පැවති සිදුවීමක් අනාවරණය කළේය. ගැටලුව අන්තර්-පුද්ගල එකක් විය. කෙසේනමුත්, මෙම ගැටුම හේතුවෙන්, මොවුන්ගේ කවුරු හෝ සිදුවීමට පැමිණෙතැයි දන්නේ නම්, ඔවුන් දෙදෙනාම සහභාගි නොවෙති. මෙය ක්‍රිස්තියානි සහ රෝමානු කතෝලික ප්‍රජාවන් දෙකින්ම නියෝජනය ලබා ගැනීමේදී ඔවුන්ට අභියෝගයක් වී ඇත.

  - ➢ ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක දී ප්‍රතිචාරකයෙක් මෙසේ අනාවරණය කළේය." බෞද්ධ භික්‍ෂුන් වහන්සේලා ක්‍රිස්තියානි ප්‍රජාවේ විවිධ නිකායන් සහ සභාවන් ගැන දන්නේ නැහැ. වරක් එක් බෞද්ධ භික්‍ෂුවක් පැවසුවා - මෙම සිදුවීමේ සංවිධායකවරු මෙම සිදුවීම් වලට සහභාගිවීම සඳහා ආරාධනා කරන්නේ *කළු කෝට් කාරයින්ට* (රෝමානු කතෝලික නොවන දේවගැතිවරුන් ගැන අපහාසාත්මක ලෙස සඳහන් කරමින්) පමණයි' භික්ෂුන් වහන්සේලා එවැනි දේ පවසන්නේ ක්‍රිස්තියානි ප්‍රජාවට හරවා ගැනීම් ගැන කේන්තියෙනුයි"

  - ➢ පොලොන්නරුවේ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් මෙසේ අනාවරණය කළේය, "අන්තර් ආගමික කමිටුවට අයත් ආගමික නායකයන් අතර මතයක් ද තිබෙනවා. ඇතැම් පියතුමන්ලා (කතෝලික පියතුමන්ලා ගැන සඳහන් කරමින්) මෙම සිදුවීම් වලට අනෙක් පියතුමන්ලා සහභාගි වන විට එයට අකැමතියි. ඔවුන් එකම ආගමෙන් වුවද, එකිනෙකා අතර යම් ගැටලු තිබෙනවා. සමහර පියතුමන්ලාට අකැමති බෞද්ධ භික්ෂුන් වහන්සේලා ද ඉන්නවා"

## 9. තම අනුගාමිකයින් වෙත ආගමික නායකයින්ගේ වෙනස්වන බලපෑම්

- ආගමික නායකයින්ගෙන් තම අනුගාමිකයින් වෙත ඇති බලපෑම ද ආගම අනුව වෙනස් වේ. හින්දු ආගමේ අනුගාමිකයින් ගත් කළ, කුරුක්කල් තුමා තම අනුගාමිකයින් කෙරෙහි ඇති කරන බලපෑම බෞද්ධ අනුගාමිකයින් කෙරෙහි බෞද්ධ භික්ෂුවක් ඇති කරන බලපෑමට සමාන නොවේ. මේ අනුව, ආගමික නායකයින්ගේ නියෝජනය සහිත මුලපිරීම් වලදී සමාන මට්ටමක බලපෑමක් තහවුරු කළ නොහැක. එබැවින්, සියලුම ආගමික කණ්ඩායම් සඳහා එවැනි බලපෑම් කෙරෙහි විශ්වාසය තැබීමෙන් සියලු ආගමික කණ්ඩායම් සඳහා සමාන මට්ටමක සංගම් ගතවීමේ අවස්ථා සහතික කළ නොහැක.

  - ➢ ප්‍රවීණයින් සිදුකළ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් හෙළිදරව් කළේ, "මලෙයියාහා දෙමළ ප්‍රජාව අතර, කුරුක්කල් තුමාට වඩා බලගතු වන්නේ කෝවිල් කමිටුවයි. සමහර පෙදෙස්වල අපට නිසි කුරුක්කල් තුමෙක් නැහැ" යනුවෙනි. ප්‍රතිචාරකයා තවදුරටත් පැවසුවේ,"කෝවිල් රාශියක් පෞද්ගලිකව ඉදිකර ඇති අතර, ඒවා පවුල් සතු වෙනවා. පූසාරිවරුන් සහ කුරුක්කල් වරුන් බොහෝවිට කෝවිල් වල සිටින්නේ ආගමික ප්‍රජාවන් සිදුකිරීමට පමණයි. මේ හේතුවෙන්, බොහෝ පූසාරිවරුන් සහ කුරුක්කල් වරුන් ප්‍රජාවේ ගැටලු වලට මැදිහත් වීමට උනන්දුවක් දක්වන්නේ නැහැ"

  - ➢ යාපනයේ පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් පැවසුවේ, "කෝවිල් සමිති සිදුකරන්නේ කෝවිල රැක ගැනීම හා කළමනාකරණය කිරීම පමණයි. බොහෝ වේලාවට කුරුක්කල් තුමා සිදුකරන්නේ ආගමික පූජාව පමණයි. කෝවිල් සමිති ද තමන්ගේ ආගම සම්බන්ධ දේ හැර වෙන කිසිවක් කරන්නේ නැහැ" යනුවෙනි.

## 10. සිදුවීම් සෝදිසි කිරීම බාධාවක් ලෙස

- ➢ රාජ්‍ය නොවන සංවිධාන සහ ඔවුන්ගේ ප්‍රාදේශීය නියෝජිතයන් සංවිධානය කරනු ලබන මුලපිරීම් වලදී ප්‍රාදේශීය මට්ටමේ සිදුවන සෝදිසි කිරීම් පිළිබඳ මෑතකාලීන සිදුවීම් මඟින් මෙම මුලපිරීම් රාජ්‍යයට එරෙහි බවට මහජන මතයක් නිර්මාණය වී ඇත. මෙය ජනතාව අතර ඍණාත්මක අවබෝධයක් ඇති කර, එවැනි මුලපිරීම් වලට සහභාගි වීම ගැන සලකා බැලීමේදී වඩාත් ප්‍රවේශම් වීමට ප්‍රජාව පොළඹවති. මෙය ප්‍රාදේශීය මට්ටමින් සමාගමයේ නිදහස ක්‍රියාත්මක කිරීමේ හැකියාව අභියෝගයට ලක් කරයි.

- ➢ මඩකලපුවේ පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් මෙසේ පැවසීය. "අපේ සිදුවීම් වලදී අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව සිටින බව අපි දකිනවා. මේ නිසා අපේ වැඩසටහන් වලට සහභාගී වීමට පෙර මිනිසුන් බෙහෙවින් කනස්සල්ලට පත්වී ඒ ගැන බොහෝ සේ සිතීමට හේතු වෙනවා. ඔවුන් සිටින නිසා මිනිසුන් සිතන්නේ අපි නීති විරෝධී දෙයක් කරන බවයි"

- ➢ මාතර ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ, "අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව හා පොලීසිය පැමිණ අපේ සිදුවීම් ගැන විස්තර අසනවා. ඔවුන්ගෙන් සමහරු අසනවා ඔවුන්ටත් අපේ සිදුවීම් වලට පැමිණිය හැකි දැයි කියා. අපි ඔවුන්ට අපේ සිදුවීම් වලට පැමිණෙන ලෙස පවසනවා. නමුත් නිල ඇඳුමෙන් නොව සිවිල් ඇඳුමෙන් එන ලෙස අපි ඉල්ලා සිටිනවා. නිල ඇඳුමෙන් පැමිණෙන විට මිනිසුන් බිය වීම ඊට හේතුවයි"

## 11. උනන්දුවක් දක්වන ආගමික නායකයින් සහ රජයේ නිලධාරීන් සහයෝගයෙහි ශක්තිමත් මූලාශ්‍රයක් ලෙස

- කෙසේනමුත්, ඇතැම් ආගමික නායකයින් හා රජයේ නිලධාරීන් ප්‍රාදේශීය මට්ටමේ එවැනි මුලපිරීම් වලට බාධා කරන්නන් ලෙස කටයුතු කළ හැකි වුවද, මෙම ස්ථාවරය සාමාන්‍යකරණය සිදු කළ නොහැකි බව හඳුනා ගැනීම ද වැදගත් වේ. එවැනි ක්ෂේත්‍ර විශේෂයෙන්ම අන්තර් ආගමික සමගිය ප්‍රගමනය කිරීම ගැන අවංකවම උනන්දුවක් දක්වන ආගමික නායකයින් සිටින බවත්, බිම් මට්ටමේ

වැඩ කරන සංවිධාන වලට ඔවුන්ගේ අවංක සහයෝගය ලබා දෙන බවත් සාකච්ඡා වලදී හෙළිදරව් විය.

- ප්‍රවීණයින් පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් මෙසේ අනාවරණය කළේය. "අපේ වැඩ වලට නිතරම සහභාගි වන භික්ෂූන් වහන්සේ නමක් සිටිනවා. අපි දෙන ගමන් දීමනාව වත් එතුමා පිළිගන්නේ නැහැ. එතුමා අප සමඟ අඛණ්ඩව වැඩ කරනවා"

- ප්‍රවීණයින් පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් මෙසේ අනාවරණය කළේය. "රටින් පිට ගොස් ලෝකය දැක ඇති ඇතැම් භික්ෂූන් වහන්සේලා සිටිනවා. ඔවුන්ගෙන් සමහරුන් විදේශ රටවල ඉගෙනුම ද ලබා තිබෙනවා. අන් අය සමඟ සංසන්දනය කිරීමේදී ඔවුන් වඩා ප්‍රගතිශීලියි. ඔවුන් අපේ මුලපිරීම් වලට සහයෝගය දැක්වීමට වැඩි ඉඩක් තිබෙනවා"

- මාතර දී පැවැත්වූ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් මෙසේ අනාවරණය කළේය. "අපේ සෑම සිදුවීමකටම පාහේ පැමිණෙන දේවගැතිවරයෙක් සිටිනවා. ප්‍රජාවේ ගැටලුවක් ඇති ඕනෑම අවස්ථාවක, ගැටලු විසඳීමට ඔහු නිතරම අප සමඟ කටයුතු කරනවා"

- ප්‍රවීණයින් පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් මෙසේ අනාවරණය කළේය. " අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමා අපේ ජාතික සාම මණ්ඩලයේ වැඩසටහන් වලට විශාල ලෙස උදව් කර තිබෙනවා. රාජ්‍ය නොවන සංවිධාන භාරව සිටියේ ඔහුයි. වෛරී කථනය වැළැක්වීම පිළිබඳ අපේ වැඩසටහන් වලට ඔහු විසින්ම පැමිණි අතර, මුදල් පවා ඉල්ලුවේ නැහැ. අපි දුන් ගමන් දීමනාව වත් භාර ගත්තේ නැහැ"

- ප්‍රවීණයින් පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් මෙසේ අනාවරණය කළේය. "දිස්ත්‍රික්කයේ මායිමේ, බොහෝ දුර සිටින බෞද්ධ භික්ෂුන් වහන්සේ කෙනෙක් ඉන්නවා. ත්‍රිරෝද රථයේ වියදම ආවරණය කිරීමට අපි උන්වහන්සේට දෙන ගමන් දීමනාව මදියි. නමුත් ඉතිරි මුදල උන්වහන්සේ පෞද්ගලිකව ගෙවා කෙසේ හෝ අපේ සිදුවීම් වලට සහභාගි වෙනවා"

- කුරුණෑගල මුස්ලිම් ආගමික නායකයෙක් හෙළිදරව් කළේ ඔහු තමන්ගේ වී විකුණා ඔහුගේ එම පෞද්ගලික මුදලින් වැඩසටහන් වලට සහභාගි වූ අවස්ථා තිබුණු බවයි.

## 12. වෙනත් ආගම් පිළිබඳව පූර්ව සංකල්පිත අදහස් සහ අගතීන්

වෙනත් ආගම් පිළිබඳ වැරදි වැටහීම්, මිනිසුන් අතර මුල් බැස ඇති සැකයන් හා අගතීන් ප්‍රාදේශීය මට්ටමේ ප්‍රජා ප්‍රයත්නයන්ට බාධාවක් වී ඇත. වෙනත් ප්‍රජාවන් පිළිබඳව නොවිසඳුණු සැකයක් ඇතිවිට මිනිසුන් එකනෙකා සමඟ වැඩ කිරීම පිළිබඳව වැඩි වැඩියෙන් සැක ඇති කර ගනී. එපමණක් නොව, ඇතැම් ආගමික කණ්ඩායම් වල හැසිරීම් සහ ක්‍රියාකාරීත්වයන් ප්‍රජාවන් අතර ආතතීන් ඇති කළ අවස්ථා තිබී ඇත. මේවා ප්‍රජාවන් අතර විවෘත සංවාදයන්හි නිරත වීමට ඇති හැකියාව අභියෝගයට ලක් කිරීමට මඟ පාදයි. මෙම ආතතීන් ජනතාවට එකට එක්ව වැඩ කිරීමෙහි දිගුකාලීන බාධක ඇති කරයි.

- මඩකලපුවේ පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක දී ප්‍රතිචාරකයෙක් මෙසේ අනාවරණය කළේය. "අපි ක්‍රිස්තියානි පුද්ගලයෙක් සමඟ සිදුවීමකට යන විට පවා, අපි ඔවුන් සමඟ යන්නේ මන්ද යනුවෙන් මිනිසුන් අසනවා. අපි ක්‍රිස්තියානි අය සමඟ වුවමනාවට වඩා ආශ්‍රය කළහොත්, ඔවුන් අපව ඔවුන්ගේ ආගමට හරවා ගනී යැයි ඔවුන් තුළ බියක් තිබෙනවා"

- මඩකලපුවේ පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක දී ප්‍රතිචාරකයෙක් මෙසේ අනාවරණය කළේය. "ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවට මෙම ප්‍රදේශයේ ඔවුන්ට අයත් ඉඩම් නොමැතිකම පිළිබඳ ගැටලුවක් පවතිනවා. ප්‍රමාණවත් ඉඩම් නොතිබීම ඔවුන්ගේ ප්‍රධාන ගැටලු වලින් එකක්. ඇතැම් මුස්ලිම්වරු ඔවුන්ගේ අනන්‍යතාව හින්දු ලෙස වෙනස් කොට දෙමළ ගම්මාන වල ගවයින් සිටින පවුල් වලට විවාහ වන බව අපි අසා තිබෙනවා. පෙනෙන අන්දමට ඔවුන්

පසුව මෙම ගම්වලින් ගවයන් රැගෙන ගොස් නගර වල විකුණනවා. ඔවුන් මෙම පවුල් විවාහ කර ගන්නේ ඔවුන්ගේ ඉඩම් ලබා ගැනීම සඳහා බවත් සමහරු පවසනවා"

- කුරුණෑගල ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් පැවසුවේ, "මුස්ලිම් ජාතිකයින් තමන්ට *වඳ පෙති* දෙනු ඇතැයි බියක් ප්‍රජාවේ සිංහල ජනතාව අතර පවතිනවා. අනෙක් අතට, ඇතැම් මුස්ලිම් ජාතිකයින් ද සිංහල අයගේ ව්‍යාපාර පිළිබඳව සැක කරනවා - ඔවුන් අතර සිටින සිංහල ජනතාවගෙන් විස්කෝතු වැනි ආහාර පරිභෝජනයට ඔවුන් අතර සුළු දෙගිඩියාවක් පවතිනවා" යනුවෙනි.

- කුරුණෑගල ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් පැවසුවේ,"ප්‍රජාව අතර, මුස්ලිම්වරුන් ගැන සැකයක් පවතිනවා. මුස්ලිම්වරුන් ඉඩම් උදුරා ගන්නා බවට ප්‍රජාව තුළ අදහසක් පවතිනවා"

- කුරුණෑගල ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ, "සමහර අවස්ථා වලදී මම නිවෙස් වල *බණ* සැසි වලට යන විට, බෞද්ධ භික්ෂූන් අපට *හරක් හොරු* යැයි පවසනවා. ප්‍රජාව තුළ අප සම්බන්ධයෙන් අවිශ්වාසයක් තිබෙනවා"

## 13. ජනවිකාශ සංයුතිය මුලපිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා නිර්ණය කිරීමේ සාධකයක් ලෙස

බහුත්වවාදය, ආගමික සමගිය ප්‍රගමනය කිරීම පිළිබඳ මුලපිරීම් හා වැඩසටහන් වලට ප්‍රදේශයේ ජීවත් වන විවිධ ජන සංයුතියක් සහිත ප්‍රදේශවල වැඩ කිරීමට වැඩි අවස්ථාවක් තිබේ. බහුජනවාර්ගික ප්‍රදේශ සහ ඉසව් වලට අන්තර්-ආගමික මුලපිරීම් වලට සහභාගි වීම පිණිස වඩා හොඳ විභවයක් ඇත. මෙයට එක් හේතුවක් වන්නේ එවැනි ප්‍රදේශයක ජනවාර්ගික කණ්ඩායම් අතර දැනටමත් වර්ධනය වී ඇති හෝ පවතින සබඳතා ය. තවත් තිබිය හැකි පැහැදිලි කිරීමක් වන්නේ එවැනි පෙදෙස් වල එක් ජනවාර්ගික කණ්ඩායමකට අනෙකා මත අතිමහත් බලයක් නොමැති වීම සහ එවැනි බහුසංස්කෘතික පසුබිමක අන්තවාදියෙකු වීම ප්‍රතියමාන (සම්මතගත) නොවේ යන්නයි.

- ප්‍රවීණයන් පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් මෙසේ අනාවරණය කළේය, " කදුරුවෙල නගරය ආසන්නව ජීවත් වන මුස්ලිම් ප්‍රජාව බොහොමයක් ව්‍යාපාරිකයෝ වෙනවා. ගම්බද ප්‍රදේශ කරා යන විට ඔබට වැඩියෙන්ම දක්නට ලැබෙන්නේ ගොවිතැනෙහි නියැලෙන සිංහල ජනතාවයි. කෙසේවෙතත්, ගමේ ප්‍රධාන භික්ෂූන් වහන්සේ මුස්ලිම් හා සිංහල ජනතාව යන දෙපාර්ශවයම සමඟ සුහදව කටයුතු කරනවා. මුස්ලිම් ව්‍යාපාරිකයෝ භික්ෂූන් වහන්සේට ගරු කරනවා. උන්වහන්සේ ද මුස්ලිම් ප්‍රජාව මුහුණ දෙන ගැටලු විසඳා ගැනීමට ඔවුන්ට විශාල සහයෝගයක් දෙනවා. උන්වහන්සේට මුස්ලිම් ප්‍රජාව සමඟ ඇති සමීප සබඳතා හරහා ප්‍රදේශයේ සිංහල පවුල් වලට උපකාර කිරීමට හැකි වී තිබෙනවා. ප්‍රදේශයේ මුස්ලිම් ව්‍යාපාරිකයෝ පන්සලේ *පෙරහැර* සංවිධානය කිරීමට මූල්‍යමය සහයෝගය ද ලබා දෙනවා"

- ප්‍රවීණයන් පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් හෙළිදරව් කළේ, "තමන්ගේම ගම්වල රණ්ඩු වන මිනිස්සු නගර වලට හෝ පිටරටකට ගිය විට එකිනෙකා සමඟ හොඳින් හැසිරෙනවා. සියලු ගැටුම් පවතින්නේ ගම තුළ පමණයි යනුවෙනි.

- යාපනයේ පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ, " අපේ ප්‍රජාවේ සිරිත් විරිත්, සාම්ප්‍රදායයන්, ඇදහිලි වැදගත් වන්නේ අපේ පවුල ජීවත්වන ගම තුළ පමණයි. මෙම සාම්ප්‍රදායයන් සහ සිරිත් විරිත් අපි නගර වලට හෝ උසස් අධ්‍යාපනය සඳහා යන විට වැදගත් වන්නේ නැහැ. අපි ගමෙන් පිට වී නගර වලට යන විට ඔවුන් එන ප්‍රජාවන් අනුව මිනිසුන් අතර මෙම බෙදීම් හෝ වෙනස්කම් ඇත්ත වශයෙන්ම වැදගත් වන්නේ නැහැ යනුවෙනි.

## 14. කුලය සහභාගිත්වය සඳහා වන බාධකයක් ලෙස

- කුලය මුලපිරීම් වලට සහභාගිවීම සහ සමාගමයේනිදහසට බලපාන සැලකිය යුතු බාධකයක් බවට හඳුනාගෙන ඇත. විශේෂයෙන් හින්දු ප්‍රජාව අතර සමාජ හා සංස්කෘතික පසුබිම් තුළ, වඩාත් ස්ථාපිත වී ඇති ගැටලුවක් ලෙස කුලය ක්‍රියා කරයි.[22] පුද්ගලයන් එකට එක්ව වැඩ කරන බව සහතික කිරීමට ඇති හැකියාවට මෙය බලපායි. එබැවින් සමාජ මට්ටමින් කුලයට අනුව බෙදා වෙන් කිරීම සමාගමයේ නිදහස ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව සහතික කිරීමට ඇති බාධාවකි.

    - යාපනයේ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ, මිනිසුන්ට තමන්ගේ වෙනස්කම් පාදක කොට ගැනීම සඳහා ප්‍රබල කාරණයක් ලෙස කුලය ක්‍රියා කරන බවයි. "මිනිසුන් කුලය මත පදනම්ව කෝවිල් ඉදිකරනවා. කුලය මත පදනම්ව සුසාන භූමි ඉදිකරනවා. කුලය මත පදනම්ව ඔවුන් පදිංචි වන ස්ථානය තීරණය කරනවා"

    - යාපනයේ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් අනාවරණය කළේ, නිලධාරියෙකු වඩා පහත් කුලයක පිරිමි ළමයෙකුට රැකියාවක් දීම හේතුවෙන් ප්‍රාදේශීය මට්ටමේ යම් සංවාදයක් පැන නැගුණු බවයි. "ජනතාව පුදුමයට පත්වූ අතර, තම ජීවිකාව සඳහා ගස් කපන මිනිසෙකුගේ පුතාට ග්‍රාම සේවක කාර්යාලයේ රැකියාවක් ලබාදීමට නිලධාරියාට හැකිවූයේ කෙසේ දැයි ඔවුන් පුදුම වුනා"

    - යාපනයේ පැවති ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක දී තරුණ ප්‍රතිචාරකයෙක් සඳහන් කළේ," අපේ ප්‍රදේශයේ ගමක වැඩසටහනක් සංවිධානය කර තිබුණා. මම මේ වැඩසටහනට යනවාට මගේ දෙමාපියන් කැමති වුණේ නැහැ. එම ගමේ වඩා පහත් කුලයක මිනිසුන් සිටින බව ඔවුන් පැවසුවා. මගේ දෙමාපියන්ගේ අදහස වුණේ මෙයයි. මට එය වැදගත් වුනේ නැහැ. මම කෙසේ හෝ වැඩසටහනට ගියා"

    - ප්‍රවීණයන් පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් (මලෙයියාහා දෙමළ ප්‍රජාවට අයත් වූ) මෙසේ අනාවරණය කළේ ය."අපේ ප්‍රජාව තුළ සමිති වල නායකත්ව තනතුරු මිනිසුන්ට ලබාදෙන විට හෝ කෝවිල් ක්‍රියාකාරකම් වල නායකත්වය ගන්නා විට, කුලය විශාල ගැටලුවක් වෙනවා. බොහෝ වේලාවට කුල ගැටලුව නිසා, පහත් කුල වල මිනිසුන්ට බොහෝ දේවල් වලින් නොසලකා හරිනවා"

    - කුරුණෑගල පැවති සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රතිචාරකයෙක් හෙළිදරව් කළේ "විවාහය වැනි දේට කුලය බලපානවා. රජයේ නිලධාරීන් සලාක බෙදා දෙන විට මිනිසුන්ව ඔවුන්ගේ කුලය පදනම් කරගෙන කොන් කරනවා. ඉහළ කුල වල සාමාජිකයන්ගේ මත වලට පක්ෂග්‍රාහිත්වයක් තිබෙනවා"

    - පොළොන්නරුවේ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවක ප්‍රතිචාරකයෙක් මෙසේ පැවසීය, "අපේ ප්‍රජාවේ බොහෝ ජනතාව (දී ඇති ඉසව්වේ පසුගාමී ලෙස සලකන) දැන් නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ රැකියා වල යෙදෙනවා. නමුත් ප්‍රදේශයේ ජනතාව අපට ගෞරවයෙන් සලකන්නේවත් අපව පිළිගන්නේවත් නැහැ. අපේ ප්‍රජාවේ මිනිසුන්ට පරම්පරා ගණනාවක සිට සක්කිලි කියා කියනවා. ප්‍රදේශයේ සිංහල මෙන්ම මුස්ලිම් ජනතාව කුඩා අපහසුතාවයකදී වුවත් අපට දොස් පවරන්න සූදානම්ව සිටිනවා. මේ හේතුවෙන්, බොහෝ ස්ථාන වලදී අපි අවමානයට සහ කොන් කිරීමට ලක්වී තිබෙනවා."

[22] A Review of the State of Religious Freedom in Sri Lanka. (2022). MinorMatters.

**නිර්දේශ**

**<u>පුරවැසියන් ඓන්ද්‍රීයව ගොඩනැගීමේ සිද්ධි වලට සහාය වීමට බලාපොරොත්තු වන විභවයක් ඇති තෙවැනි පාර්ශව මුලපිරීම් සඳහා</u>**

පුරවැසි සහභාගිත්වය වැඩි කිරීමට සහ සමාගමයේ නිදහස ශක්තිමත් කිරීම සඳහා, දී ඇති ප්‍රජාවකට සම්බන්ධ වීමට කැමති තෙවැනි පාර්ශවයක් සඳහා නිර්දේශ සැපයීම මෙම කොටසෙහි අරමුණ වේ. මෙම නිර්දේශ වඩා දිග කාලරාමු සහ රාජ්‍ය මට්ටමේ මැදිහත්වීම් අවශ්‍ය කරන නිර්දේශ වලට වඩා, ප්‍රදායකයින් අරමුදල් සපයා දී ඇති ව්‍යාපෘතියක ප්‍රායෝගික මැදිහත්වීම් පිළිබඳව පර්යේෂණ කණ්ඩායමේ තක්සේරු මත පදනම් වී ඇති බව සඳහන් කිරීම වැදගත් වේ.

පහත සඳහන් නිර්දේශ ව්‍යාපෘති වල කාලරාමුව, මූල්‍යමය හා මානව සම්පත් ලබාගැනීමේ හැකියාව සහ මැදිහත් වන තෙවන-පාර්ශව සංවිධානයෙහි අභිමතාර්ථය මත බෙහෙවින් රඳා පවතී.

- යහ පාලනයේ ගුණධර්ම ආරක්ෂා කිරීම සඳහා සහභාගිවීමට පුද්ගලයින් අඩු කැමැත්තක් දක්වන වත්මන් සන්දර්භය සැලකිල්ලට ගෙන, අයිතීන් පදනම් කරගත් කණ්ඩායම් ලෙස ඓන්ද්‍රීයව ගොඩනැගීමට ඔවුන් දිරිමත් කරන හේතු සමඟ සම්බන්ධ වීම ඉතා වැදගත් වේ. මෙය වැදගත් වන්නේ, ජනතාව යහ පාලනයේ ගුණධර්ම සහ වටිනාකම වටහා ගන්නේ ඔවුන් සාක්ෂි දරන අසාධාරණයන්ගේ කාචය හරහා නිසා ය. මේවා ප්‍රාදේශීය මට්ටමේ පවතින ඉතා නිශ්චිත අසාධාරණකම් මගින් බැඳී තිබිය හැක. මේ අනුව, ප්‍රාදේශීය මට්ටමින් මිනිසුන් හඳුනාගෙන ඇති නිශ්චිත අසාධාරණයන් අවබෝධ කර ගැනීමට, හඳුනාගත් ගැටලු විසඳීමට ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට, සහ ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා එම ප්‍රජාවන් සමඟ සම්බන්ධ වීම වඩාත් සුදුසු බව පෙනේ. එවැනි තවත් මුලපිරීම් වැඩියෙන් තිබීම ජාතික මට්ටමේ වැඩි ප්‍රජා සහභාගිත්වයක් සහතික කිරීම කෙරෙහි වඩා හොඳ පළමු පියවරක් වනු ඇත.

- ජනතාව මුහුණ දෙන ප්‍රාදේශීය මට්ටමේ අසාධාරණයන් ආමන්ත්‍රණය කිරීම සඳහා වන ඕනෑම මැදිහත් වීමක් මනාව ස්ථාපිත වී ඇති ප්‍රජා මූල සංවිධානයක් හරහා, හෝ එවැන්නක් නොමැති විට ප්‍රාදේශීය මට්ටමින් එවැන්නක් පිහිටුවීම හරහා සිදු කිරීම වඩාත් සුදුසු වේ. මේ ආකාරයෙන් සහභාගී වීම වඩාත් දිගු-කාලීනව පවතින, සමස්තය ඇතුළත් කරන, සහ සාමාජිකයින්ට වැඩදායක වනු ඇත. තවද එය සමාගමයේ නිදහස ශක්තිමත් කරයි. මන්දයත්, විධිමත්ව ස්ථාපිත වී ඇති ප්‍රජා මූල සංවිධාන වලට අවිධිමත් එක් රැස්වීම් හෝ පුද්ගලයින්ගේ සාමූහිකයන්ට වඩා හොඳින් සමාගමයේ නිදහසට ඇති තර්ජන වලට මුහුණ දීමට වඩා හොඳ හැකියාවක් තිබෙන බැවිනි.

- තෝරාගත් ප්‍රජා මූල සංවිධානයට ලිඛිත ව්‍යවස්ථාවලියක් තිබීම සහතික කිරීම, සහ ඔවුන්ට එවැන්නක් නැතහොත්, එවැනි කණ්ඩායම් සුමටව ක්‍රියා කිරීම පිණිස එවැන්නක් සැකසීම ඉතා වැදගත් වේ. සාමාජිකයන්ගේ එකඟතාවය සහිතව වත්මන් ව්‍යවස්ථාවලිය හෝ සකසන ව්‍යවස්ථාවලිය සංශෝධනය කළ හැකි අතර, මෙම අධ්‍යයනයේ නිර්දේශ සැලකිල්ලට ගත හැකිය.

- පවතින සමාජයක් තුළ, ප්‍රජා නායකයින්, මත සම්පාදකයින් සහ පක්ෂ දේශපාලනය වැනි ප්‍රදේශයේ අදාළ පාර්ශවකරුවන් පිළිබඳව නිසි විශ්ලේෂණය සහ සිතියම් ගත කිරීම ඉතා වැදගත් වේ. මෙම අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය සහ වටිනාකම නොසලකා හැරීම ප්‍රාදේශීය මට්ටමින් මහජන සහභාගිත්වය ශක්තිමත් කිරීමේ තෙවන-පාර්ශව ප්‍රයත්නයන් සීමා කරනු ඇත. මෙසේ සිදුකරන්නේ ජනතාව විසින්ම ප්‍රජාවන් තුළ බොහෝවිට ප්‍රාදේශීය මට්ටමින් ඔවුන්ගේ එදිනෙදා ජීවිත තුළ අඛණ්ඩව නිරත වන පාර්ශවකරුවන් තෝරා ගෙන සිටින බැවිනි. එබැවින් මෙම කණ්ඩායම/සාමූහිකයන් සමඟ වැඩ කිරීමට පෙර මෙම පාර්ශවකරුවන් සිතියම් ගත කිරීම ඉතා වැදගත් පළමු පියවරක් වේ.

- එක් දේශපාලන පක්ෂයක් කෙරෙහි පක්ෂග්‍රාහී වීමෙන් ප්‍රාදේශීය මට්ටමේ අනෙකුත් දේශපාලන පක්ෂ එදිරි කර ගැනීම මගින් සමාගමයේනිදහස අනතුරේ හෙළීම සිදුවිය හැකිය. සිත්ගන්නා සුළු කරුණ වන්නේ, දේශපාලනික නොවන ලෙස සිටීමෙන් ද ප්‍රාදේශීය මට්ටමින් පුරවැසි

සහභාගිත්වයේ මට්ටමට බලපෑම් කර, යම් ආකාරයකින් එය සීමා කළ හැකි වීම ය. එබැවින් දේශපාලනික නොවන ලෙස සිටීමෙන් ජනතා සහභාගිත්වය අඩු වේ නම්, ඇතැම් දේශපාලන සම්බන්ධකම් මඟින් මුලපිරීම් වල සහභාගිවීම අනතුරේ නොහෙළීම සහතික කිරීමට මැදිහත් වීමක් සඳහා ප්‍රධාන දේශපාලන පක්ෂ වල ප්‍රාදේශීය මට්ටමේ සාමාජිකයන්ගේ සහයෝගය දිනා ගැනීම (දේශපාලනඥයින් විය යුතු නැත) ඉතා වැදගත් වේ.

- එවැනි කණ්ඩායම්/සාමුහිකයන් තුළ, නායකත්වය ගැනීම සඳහා මෙහෙයුම් කමිටුවක් පත් කිරීම වඩාත් සුදුසු ය. එය තුළ දේශපාලන සම්බන්ධතා නියෝජනය කරන අය, සමාජ පැතිකඩ, වයස් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය නියෝජනය කරන්නන් වැනි ප්‍රජාවක විවිධ උප කණ්ඩායම් නියෝජනය විය යුතු ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, වැඩි සහභාගිත්වයක් ඇති වී, රජයේ මර්දනය අඩු වනු ඇත.

- ඉලක්ක ගත ප්‍රජාව සඳහා පරිපූරක මුලපිරීම් ඇතුළත් කරන මැදිහත් වීමක් තිබීම වඩාත් සුදුසු වේ. ඒ මඟින් ඉලක්ක ගත ප්‍රජාව තුළ තෝරාගත් අයුක්තීන්ට එරෙහි මුලපිරීමෙන් ප්‍රතිලාභ නොලබන අයට වඩා විශාල මැදිහත් වීමෙන් වෙනත් ආකාරයකින් ප්‍රතිලාභ ලබාගැනීමට හැකිවනු ඇත.

- සමහර පුද්ගලයින් වෙනස ගැන අසුභවාදී වන බැවින්, ප්‍රජාවන් ලෙස ඔවුන්ට කළ හැකි වෙනස්කම් පිළිබඳව ජනතාව අතර සුභවාදී හැඟීම වැඩි කිරීම ද අවශ්‍ය වේ. ඉලක්කගත ප්‍රජාව දිරිමත් කරන, වෙනස්කම් කිරීමට හැකිවූ ප්‍රජාවන් බැහැ දැකීමට යාම, ඔවුන්ට ඉලක්කගත ප්‍රජාවට කතා කිරීමට සැලැස්වීම, ජනතාවට ලොව පුරා ඇති සාර්ථක සමාජ ව්‍යාපාර ගැන ඇසීමට/දැකීමට සැලැස්වීම යන මේ සියල්ල සිදු කල හැකි වැදගත් ක්‍රියාකාරකම් වේ. දී ඇති ප්‍රජාවක් තුළ ප්‍රචලිත වී ඇති ලඟා කරගත හැකි විසඳුම් සමඟ නිශ්චිත ගැටලු කෙරෙහි අවධානය යොමු කිරීම ද තෙවන-පාර්ශවයක මැදිහත් වීමක් සඳහා ඉතා වැදගත් වේ. තෝරාගත් ගැටලුව විසඳීම මඟින්, ජනතාව විශ්වාසය දිනා ගනු ඇත. එය යම් ප්‍රජාවක මහජන සහභාගිත්වය වැඩි කිරීම සඳහා වන වැදගත් පළමු පියවරකි.

- ජනතාවගේ පළමු ප්‍රමුඛතාවය වනුයේ, බොහෝ විට ඔවුන්ගේ ජීවනෝපායය හා අනෙකුත් ගෘහස්ථ වගකීම් බැවින්, අසාධාරණයන් ගැන ප්‍රශ්න කිරීමට වඩා ඒවා පිළිගැනීමට පෙළඹෙති. මන්දයත්, අයුක්තීන් ගැන ප්‍රශ්න කිරීමට ද කාලය හා සම්පත් වැය වන බැවිනි. එබැවින් ඉලක්ක ගත ප්‍රජාවක් සඳහා පවත්වන ඕනෑම පුහුණු වැඩසටහනක් හෝ ප්‍රජා මට්ටමේ රැස්වීමක්, සහභාගිත්වය සරල කරමින්, පැවැත්විය යුත්තේ ප්‍රාදේශීය මට්ටමින් ය. ස්ථානය, දිනය සහ වේලාව තෝරාගත යුතු වන්නේ ජනතාවගේ පහසුව සිත් තුළ තබාගෙන ය.

- ජනතාවට සටන් කිරීමට අවශ්‍ය වන ගැටලුවෙහි විෂය පථය අවබෝධ කර ගැනීමට ඔවුන්ට උපකාර කිරීම මෙන්ම, ක්‍රියාවලිය, කළ යුතු දේ හා නොකළ යුතු දේ, පීඩාවට පත් ප්‍රජාවගේ අයිතීන්, හා අදාළ නීතිමය පසුබිම පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීම ද වැදගත් වේ. මෙය වැදගත් වන්නේ දැනුවත් සහභාගිත්වය සඳහා පමණක් නොව, දැනුවත් පුරවැසියන් වීමට ඔවුන්ට උපකාරී වන ඉලක්ක ගත ප්‍රජාව තුළ දැනුම කාවැද්දීම සඳහා ද ඉතා වැදගත් වේ.

- අයුක්තියට එරෙහිව සටන් කිරීමේදී තරුණ තරුණියන් හා වැඩිහිටියන් සහභාගි වන ආකාරයන් බොහෝ විට වෙනස් ය. ප්‍රාදේශීය මට්ටමින් වැඩිහිටියන් සහභාගි වී ඇති ආකාරයන් තරුණ තරුණියන්ට ආකර්ෂණය නොවීමට ඉඩ ඇත. එබැවින්, මෙම කණ්ඩායම් සමඟ වැඩ කිරීමට උනන්දුවක් දක්වන පාර්ශවයන්, මෙම වයස් කාණ්ඩ සහභාගි වීමට වැඩි කැමැත්තක් දක්වන්නේ කෙසේද යන්න අනුව, ඔවුන්ගේ පුරවැසිභාවය හැඩ ගැස්වීම සම්බන්ධයෙන් මැදිහත්වීමට ඔවුන් කැමති වන ආකාරය පිළිබඳව නිර්මාණශීලී විය යුතු ය.

- ඕනෑම මුලපිරීමක දී අදාළ සිවිල් සේවකයන්ගේ හා රජයේ නිලධාරීන්ගේ සහභාගිත්වය ලබාගැනීම ද ඉතා වැදගත් වේ. එසේ සහභාගි වීමෙන් ඔවුන්ගේ මැදිහත්වීම තුළින් ඔවුන්ගේ කාර්යය පහසු කිරීම මිස, දුෂ්කර නොකරන බව ඔවුන්ට ඒත්තු ගැන්විය යුතු ය. තවද, මුලපිරීම තුළ ඔවුන්ගේ ප්‍රයත්නය සඳහා ඔවුන්ට නිසි පිළිගැනීමක් සහ අගය කිරීමක් ලැබෙන බවද සහතික කළ යුතු ය.

- මෙම මැදිහත්වීම් සඳහා යම් ප්‍රදේශයක විශ්වවිද්‍යාල සිසුන් ඇතුළත් කර ගැනීම ඉතා වැදගත් වේ. මන්දයත්, ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රයන්හි ඔවුන් යම් පිළිගැනීමක් දිනා ගෙන ක්‍රියාකාරීව සහභාගි වන නිසා ය. අවට ප්‍රදේශ වලින් පැමිණෙන සහ ප්‍රදේශවාසීන්ට උපදෙස් දීමට තරම් ප්‍රමාණවත් දැනුමක් ඇති තරුණ විශ්වවිද්‍යාල සිසුන්ට (අතීත හෝ වර්තමාන) සඳහා වෙනම වැඩසටහන් සකස් කර ගත හැකි වනු ඇත.

- ජනතාවට යමක් ඉටුකර ගැනීමට අවශ්‍ය වූ විට ඔවුහු නිතරම මෙවලමක් ලෙස සමාජ ජාල භාවිතා කරති. ප්‍රාදේශීය මට්ටමින් අයුක්තීන්ට එරෙහිව ජනතාව සටන් කරන විට ද මෙය අදාළ වේ. එබැවින්, ප්‍රාදේශීය ප්‍රජා මූල සංවිධාන වල සමාජ ජාල පුළුල් කිරීම බුද්ධිමත් තීරණයකි. එය මානව හිමිකම් ගැන කටයුතු කරන, නීති ආධාර සපයන, හෝ ප්‍රජා අවකාශය ශක්තිමත් කරන අනෙකුත් සිවිල් සමාජ සංවිධාන වලට ද ව්‍යාප්ත විය හැකිය. නැතහොත්, එය තෝරාගත් ප්‍රජාව මුහුණ දෙන නිශ්චිත ගැටලුව සම්බන්ධයෙන් ක්‍රියා කරන සිවිල් සමාජ සංවිධානය සමග ජාලගත වීම ද විය හැකිය. ව්‍යාපෘතියට සහභාගි වන ප්‍රජාවන් අවශ්‍ය වූ විට සහ අවශ්‍ය වේ නම්, එකිනෙකාට සහාය වීමට හැකිවන ලෙස සම්බන්ධ කිරීම ද ඉතා වැදගත් වේ.

- සුළුතර ප්‍රජාවන් සමඟ කරන මැදිහත්වීම් සඳහා ඉහත විස්තර කර ඇති ඒවායින් ඔබ්බට අමතර පියවර අවශ්‍ය විය හැක. උදාහරණයක් ලෙස, යුද්ධයෙන් පීඩාවට පත් සහ යළි පදිංචි කළ ඇතැම් ප්‍රජාවන් තුළ ප්‍රජා අවකාශයන් වඩා දුර්වල හා අඩුවෙන් ලබාගත හැකි විය හැක. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රජා මූල සංවිධාන ලෙස සහභාගි වීමට සමාජ දිරිමත් කිරීම සහ ප්‍රජා අවකාශය සංවිධානය කිරීමේ දී ඔවුන්ට පවතින බාධක බිඳ හෙලීමට උපකාර කිරීම අවශ්‍ය විය හැකිය.

- තවද, ප්‍රජා අවකාශය තුළ සහභාගි වන විට සුළුතර ප්‍රජාවන් මුහුණ දෙන භාෂා බාධක තේරුම් ගැනීම ද ඉතා වැදගත් ය. එවැනි ප්‍රජා වල ජනතාව සඳහා කෙටි-කාලීන සහ දිගු-කාලීන විසඳුම් යන දෙකම අවශ්‍ය වේ. කෙටි-කාලීනව මුලපිරීම් අතරතුරදී භාෂා සහයෝගය ලබාදිය හැකිය. දිගු-කාලීනව, ඉලක්ක ගත ප්‍රජාවේ තෝරාගත් තරුණ තරුණියන්ට සැලකිය යුතු භාෂා පුහුණුවක් හඳුන්වා දිය හැකිය, නැතහොත්, සිංහල කතා කරන තරුණ තරුණියන් අඛණ්ඩව මුලපිරීම් වලට සම්බන්ධ කර ගැනීම වැඩදායක විය හැක.

- කාන්තා සහභාගිත්වය වැඩි කිරීම සමාජ මට්ටමින් අවශ්‍ය විය හැකි නමුත්, එය ප්‍රවේශමෙන් සහ ක්‍රමයෙන් කළ යුතු ය. මෙහෙයුම් කමිටු සාකච්ඡා වලට කාන්තාවන් සහභාගි කරවා ගැනීම (මීට පෙර යෝජනා කළ පරිදි) හොඳ ආරම්භයක් විය හැකිය. ආරම්භයේදී, කාන්තා සම්පත්දායකයින්, විශ්වවිද්‍යාල සිසුන්, ප්‍රාදේශීය දේශපාලනඥයින්, හෝ ප්‍රජා රජයේ සේවකයින් සම්බන්ධ කර ගැනීම හරහා මුලපිරීම් තුළ කාන්තා සහභාගිත්වය සහතික කළ හැකිය.

## ප්‍රාදේශීය සංවිධාන මගින් අන්තර්-වාර්ගික මුලපිරීම් සඳහා

ඉහත ලබා දුන් නිර්දේශ වලට අමතරව, අන්තර්-වාර්ගික මුලපිරීම් තුළ සමාගමයේ නිදහස සහ පුරවැසි සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමට යම් මැදහත්වීමක් සැලසුම් කරන්නේ නම්, සලකා බැලිය හැකි තවත් නිශ්චිත නිර්දේශ කිහිපයක් ඇත.

- විශ්ලේෂණය කොටසෙහි සාකච්ඡා කළ පරිදි, එදිනෙදා සිදුවන අයුක්තීන්ට එරෙහිව සටන් කිරීමට ප්‍රජා අවකාශය ශක්තිමත් කිරීම සඳහා වන ඉල්ලුමට සාපේක්ෂව, අන්තර්-වාර්ගික මුලපිරීම් සඳහා, සැලකිය යුතු ඉල්ලුමක් නැත. අනෙක් අතට, අන්තර්-වාර්ගික මුලපිරීම් වල නිරතවීම, ඒ හා සමානවම වැදගත් වන්නේ, එය පුරවැසිභාවය ශක්තිමත් කිරීමෙන් ඔබ්බට ගොස් වැඩියෙන් සමස්තය ඇතුළත් කරන ප්‍රජා අවකාශයක් ප්‍රවර්ධනය කිරීම කරා යන බැවිනි. ඒ අනුව, අන්තර් -වාර්ගික ගැටලු සඳහා ඉල්ලුමක් නොමැතිවීම දැකිය යුතු වන්නේ අධෛර්යමත් කිරීමේ මූලාශ්‍රයකට වඩා මැදිහත්වීම සඳහා වන අවස්ථාවක් ලෙස ය.

- මෙම සන්දර්භය තුළ, පොදු අරමුණක් වෙනුවෙන් සටන් කිරීම සඳහා විවිධ ජනවාර්ගික කණ්ඩායම් වල පුද්ගලයින් එකට ගෙන ඒමට මුලපිරීම් සැලසුම් කිරීම, එදිනෙදා අයුක්තීන් සඳහා විසඳුම්

ලබාගැනීමට සහ ප්‍රාදේශීය මට්ටමින් පුරවැසිභාවය පිළිබඳ වැඩියෙන් සමස්තය ඇතුළත් කරන භාවිතාවන් ශක්තිමත් කිරීමට අවස්ථාවක් යන දෙකම ඒකාබද්ධ කිරීමට අවස්ථාවක් ලබාදෙනු ඇත.

- කෙසේවෙතත්, තමන්ගේ අයිතීන් සඳහා එකට එක්ව සටන් කරන විවිධ ජනවාර්ගික කණ්ඩායම් වල ජනතාව අවශ්‍ය වශයෙන්ම අන්තර්-වාර්ගික සමගිය ප්‍රවර්ධනය කිරීම හෝ විදහා දැක්වීම නොකරනු ඇති අතර, එකට සටන් කරන ජනතාව තමන්ගේ අරමුණ සඳහා පමණක් මිස ඊට වැඩි යමක් වෙනුවෙන් සටන් නොකරනු විය හැක. අනෙකුත් පීඩාවට පත් ප්‍රජාවන් සමග තමන්ගේ අයිතීන් වෙනුවෙන් සාමූහිකව සටන් කිරීම හරහා යුක්තිය ඉටුකරගත් පසු, ජනතාව ඔවුන්ගේ පවතින සමාජ ධුරාවලියන් හා එකිනෙකා ගැන ඇති ජනවාර්ගික-ආගමික විශ්වාසයන් කරා ආපසු යාම සිදුවිය හැක.
  සමහර අවස්ථාවලදී ඔවුන්ට බලපාන පොදු අරමුණක් සඳහා වෙනත් ප්‍රජාවක් සමග සටන් කරන අතරතුර පවා, මිනිසුන් මෙම විශ්වාසයන් තුළ එල්බ ගෙන සිටිනවා විය හැක. මේ අනුව, වඩා විශාල මුලපිරීම තුළ අනෙකුත් වාර්ගික කණ්ඩායම් කෙරෙහි විශ්වාසය, දැනුවත්භාවය සහ රිස්සීම වැඩි කිරීමට වඩා විශාල මුලපිරීමක් තුළ පරිපූරක මුලපිරීම් ක්‍රියාත්මක කළ යුතු වේ.

- ප්‍රධාන මුලපිරීම් මඟින් පුරවැසියන් ලෙස ප්‍රජා අවකාශය තුළ එක්ව සටන් කිරීම ජනතාව දිරිමත් කළ හැකි අතර, වඩා කුඩා මුලපිරීම් වලට පෞද්ගලික අවකාශය තුළ මිත්‍රත්වයන් වැනි සබඳතා ශක්තිමත් කිරීමට මැදිහත්වීම් නිර්මාණය කළ හැකි වේ.

මුලපිරීම් වල ප්‍රධාන පරමාර්ථය වනුයේ අන්තර්-වාර්ගික සබඳතා පෝෂ්‍ය කිරීම නම්, පහත සඳහන් යෝජනා ලබාදිය හැකියථ

- බිම් මට්ටමේ අන්තර්-වාර්ගික මුලපිරීම් වල සාර්ථකත්වය සඳහා මෙවලමක් ලෙස බිම් මට්ටමේ පෞද්ගලික ජාල හඳුනාගත් බැවින්, මෙම ජාල පවත්වා ගෙන යාම සඳහා ප්‍රාදේශීය මට්ටමේ මැදිහත්වන්නන්ට උපකාර කිරීම ඉතා වැදගත් වේ. එවැනි ජාල පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය කරන මූල්‍යමය ආධාර සැපයීමෙන්, හෝ නව ජාල තුළ අදාළ පුද්ගලයින් පිළිගැනීමට සහ හඳුනා ගැනීමට වැඩසටහන් සැලසුම් කිරීමේදී මැදිහත් කරුවන්ට උපකාර කිරීමෙන් මෙය සිදුවිය හැක.

- අන්තර්-වාර්ගික සිදුවීම් සඳහා ප්‍රජා අවකාශ ආරක්ෂා කිරීම සහ පුළුල් කිරීම සඳහා අන්තර්-වාර්ගික මුලපිරීම් ප්‍රවර්ධනය කරන මුලපිරීම් වල සැලැස්ම හා ආකාරය ද ප්‍රතිශෝධනය කළ යුතු ය. මැදිහත්වීම් වැඩමුළු වලට සීමා නොවිය යුතු ය. නමුත් ඒ වෙනුවට වෙනත් වාර්ගික කණ්ඩායම් වල පූර්ව නිගමනයන්ට ලක්වූ අගතීන්ට අභියෝග කරන ස්ථානීය මුලපිරීම් කෙරෙහි අවධානය යොමුකළ යුතුය. තවද, සාමකාමී අන්තර්-වාර්ගික සබඳතා සහතික කිරීම කෙරෙහි හානිකර විය හැකි ඉතිහාසය, සංස්කෘතිය යනාදිය පිළිබඳ ජනප්‍රිය කතා වස්තූන් විසංයෝජනය කිරීමට ද අරමුණු කර ගත හැකිය.

- මැදිහත්වීම් වඩා කුඩා කණ්ඩායම් ඉලක්ක ගත කර දීර්ඝ කාලයක් තුළ සහභාගිවන්නන් සම්බන්ධ කරගත යුතු ය. ව්‍යාපෘති වලට වැඩි පිරිසක් කෙරෙහි ළඟාවිය හැකි නම්, තනි විශාල කණ්ඩායමකට වැඩි ජනතාවක් සම්බන්ධ කරනවාට වඩා කණ්ඩායම් සංඛ්‍යාව වැඩි කිරීමට ඔවුන් උත්සාහ කළ යුතු ය. මෙය කණ්ඩායම් සාමාජිකයන් වඩා සමීපව දැනහැඳින ගැනීමට, කණ්ඩායමේ සාමාජිකයන් අතර සමීප සබඳතා පෝෂ්‍ය කිරීමට සහ අන්තර්-වාර්ගික සබඳතා අවකාශය ප්‍රවර්ධනය කරන නියෝජිතයින් ලෙස ඔවුන්ගේ අදාළ සමාජ සමඟ සම්බන්ධ වීමේ දී ඔවුන් මුහුණ දෙන අභියෝග සමීපව අධීක්ෂණය කිරීමට ජනතාවට සහාය වනු ඇත.

- අන්තර්-වාර්ගික වැඩසටහන් වලට සහභාගි වන පුද්ගලයින් තමන්ගේ අදාළ සමාජ වල වැදගත් සහ අවශ්‍ය සාමාජිකයන් බවට පත් කිරීම සඳහා ඔවුන් සන්නද්ධ කිරීම ද ඉතා වැදගත් වේ. මෙය අන්තර්-වාර්ගික සමගියට සෘජුවම සම්බන්ධ නොවනු ඇත. නමුත් එය බිම් මට්ටමේදී වඩා දැනුවත් පුද්ගලයින් ලෙස තමන්ව ස්ථාපිත කර ගැනීමේදී අන්තර්-වාර්ගික සමගිය වෙනුවෙන් පෙනී සිටින (උද්දේශනය කරන) අයට උපකාරී විය හැක. ඔවුන්ගේ සමාජ ජාල පුළුල් කිරීමෙන්, මානව හිමිකම් සහ නීතියේ ආධිපත්‍යය පිළිබඳව මූලික පුහුණුවක් ඔවුන්ට ලබාදීමෙන්, රජයේ ආයතන වෙත ප්‍රවේශ වීමේ ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලි පිළිබඳව ඔවුන් පුහුණු කිරීම යනාදිය මඟින් මෙය ඉටුකර ගත හැකිවේ.

- ප්‍රජාවන් තුළ සිටිය හැකි බාධා කරන්නන් දිනා ගැනීමට හැකිවන පරිදි වැඩසටහන් සැලසුම් කළ යුතු ය. බාධා කරන්නන් බවට හඳුනාගෙන ඇති පුද්ගලයින් බොහෝ විට බාධා කරන්නන් බවට පත්වී ඇත්තේ දැනුවත් භාවය නොමැතිකම සහ සමහර අවස්ථා වලදී නිරාවරණය නොවීම හේතුවෙනි. ඔවුන්ට අවශ්‍ය කරන නිරාවරණය සහ පුහුණුව ඔවුන් ලබාගත යුතු ය. ඔවුන්ගෙන් සමහර දෙනෙක් දේශපාලන මතවාදයෙන් අභිප්‍රේරණය වී ඇති නිසා, එවැනි සෘජු මැදිහත්වීම් සියළුම බාධා කරන්නන් සඳහා ක්‍රියා නොකරනු ඇත. නමුත් සමහරුන්ට එය ක්‍රියා කළ හැකි බව සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

- බාධාකරන්නන් වෙනස් සන්දර්භයකට යටත් කළ විට සහ ගැටලුවෙහි ස්වභාවය ගැන දැනුවත් කළ විට මුලපිරීම් වල ශූරයන් ලෙස කටයුතු කළ හැකි බැවින්, බාධාකරන්නන් ගේ තත්ත්වය අවබෝධ කර ගැනීම ද වැදගත් වේ. නිදසුනක් වශයෙන්, පුරවැසියන්ට බලපෑම් කරන අයුක්තීන්ට එරෙහිව සටන් කිරීමේදී ශූරයෙකු ලෙස සැලකිය හැකි පුද්ගලයෙකු, ඒ සමගම අන්තර්-වාර්ගික සබඳතා ප්‍රගමනය කිරීමේදී බාධා කරන්නෙකු විය හැකිය. එබැවින්, නිශ්චිත ප්‍රජාවක් මුහුණ දිය හැකි අයුක්තියට එරෙහිව සටන් කිරීම සඳහා පමණක් නොව, විවිධත්වයෙන් යුතු සමාජයක වෙනස්කම් අගය කිරීමට ඔවුන්ට ඉගැන්වීම සඳහා ඔවුන් වෙනුවෙන් ආයෝජනය කිරීම ඉතා වැදගත් වේ.

- ජනතාව මුහුණ දෙන ඉදිරියට ඇදෙන ආර්ථික අර්බුද හමුවේ, ද්‍රව්‍යමය ප්‍රතිලාභ සඳහා වන ජනතාවගේ අපේක්ෂාවන් ප්‍රාදේශීය මට්ටමේදී නොතකා හැරීම කළ නොහැක. මේ අනුව, අර්බුද වලට මුහුණ දිය යුත්තේ කෙසේද යන්න පිළිබඳව අදාළ ප්‍රජාවන්ට මඟ පෙන්වීම ලබාදිය හැකි අන්දම ගැන ප්‍රාදේශීය මට්ටමේ අන්තර්-වාර්ගික සම්බන්ධතා ප්‍රවර්ධනය කරන ප්‍රාදේශීය මට්ටමේ නියෝජිතයින් සම්බන්ධ කිරීම ද ඉතා වැදගත් වේ. අර්බුදයෙන් ගොඩ ඒමට උපකාර කිරීම සඳහා ප්‍රජාවන්ට මූල්‍යමය නොවන සහ අස්පෘශ්‍ය (non-tangible) ආකාරයේ ආධාර හෝ පුහුණු ලබාදෙන සංවිධාන වලට මෙම නියෝජිතයින් සම්බන්ධ කිරීම ද කළ හැකිය.

- තවද, ප්‍රජා අවකාශය ආරක්ෂා කිරීම සහ අන්තර්-වාර්ගික සබඳතා ප්‍රවර්ධනය කිරීම සඳහා මැදිහත්වීමේ ක්‍රමෝපායයන් ප්‍රදේශයට අනුව සකස් කළ යුතු බව ද සඳහන් කිරීම වැදගත් වේ. මෙහිදී අන්තර්-වාර්ගික සම්බන්ධතා, බලපෑම් කරන ක්‍රියාකාරීන්ගේ ස්වභාවය, සහ යම් නිශ්චිත ප්‍රදේශයක වාර්ගික සංයුතියට අනුව ජනතාව මුහුණ දෙන ගැටලු ප්‍රදේශයට සුවිශේෂී විය හැකිය.

**නිගමනය**

ජනතාව ප්‍රජා අවකාශය තුළ නිරත වන විට, මහජන සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සහ සමාගමයේ නිදහස තහවුරු කිරීම තීරණාත්මක වේ. විශේෂයෙන් ඔවුන් තමන්ගේ අයිතීන් සහ නිදහස ආරක්ෂා කර ගැනීමට එය භාවිතා කරන විට එසේ වේ. වර්තමාන අධ්‍යයනයෙන් පෙන්නුම් කරන්නේ මිනිසුන්ගේ අයිතීන් උල්ලංඝනය වන විට ඔවුන් යම් ස්ථාවරයක් ගැනීමට කැමති බවයි. මේ ආකාරයේ ප්‍රජා මැදිහත්වීම්, විශේෂයෙන් ප්‍රාදේශීය මට්ටමේදී, ක්‍රමවේදයක වෙනසක් වැනි පුළුල් ඉල්ලීම් වල පුරවැසියන් නිරත වන අවස්ථා වලින් වෙනස් විය හැක. කෙසේ නමුත්, එවැනි සාමූහිකයන් හරහා සංවිධාන ගත වූ ප්‍රයත්නයන් හරහා කරන සෑම ඉල්ලීමක්ම අනිවාර්යයෙන් සාර්ථකත්වයට පත් නොවේ. ප්‍රතිඵලය කුමක් වුවත්, අයිතීන් වෙනුවෙන් සටන් කිරීම ප්‍රජාවක පුරවැසිභාවය තුළ හා ඒ පිළිබඳව කරන පරීක්ෂණයකි. මහජනතාවට නියැලී සිටින පුරවැසියන් බවට පත්වීමේ අවස්ථාවන් වැඩි කිරීම සඳහා, ප්‍රජා අවකාශය ආරක්ෂා කිරීම සහ සමාගමයේ නිදහස සඳහා ඔවුන්ට ඇති අයිතිය සහතික කිරීම තීරණාත්මක වේ.

ජනතාවගේ ඉල්ලීම් වෙනත් පාර්ශව වල අභිලාෂයන් සමග ගැටෙන විට, ඔවුන්ගේ සමාගමයේ නිදහස අභියෝගයට ලක් විය හැකිය. මෙම පාර්ශවයන්ට හමුදාවේ සාමාජිකයන්, නීතිය බලාත්මක කරන්නන්, දේශපාලනඥයන්, පෞද්ගලික ව්‍යාපාර සහ තවත් බොහෝ අය ඇතුළත් විය හැක. ඊට අමතරව, යම් ප්‍රජාවක සියලුම ඉල්ලීම්/අයුක්තීන් එක් විශේෂ සාමූහිකයක් මගින් ආමන්ත්‍රණය කිරීම හෝ නියෝජනය කිරීම සිදු විය නොහැකි බැවින්, අදාළ ප්‍රජාවන්ගේ අනෙකුත් සාමාජිකයන් විසින්ම එයට විරුද්ධ වී සාමූහිකයේ සමාගමයේ නිදහසට බාධා කළ හැකිය. දී ඇති වාතාවරණයන්ට අනුව, අයුක්තියට එරෙහිව සටන් කිරීම සහ ඔවුන්ගේ අයිතීන් දිනා ගැනීම සඳහා වන මුලපිරීමක සඵලතාව රඳා පවතින්නේ යථාර්ථය තුළ මෙම බාධක ජය ගන්නේ කෙසේද යන්න මත ය. සමහරවිට ජනතාවට තනියම මෙම අභියෝග හැසිරවීමට

නොහැකිය. වෙනත් අවස්ථා වලදී ජනතාවට එසේ කිරීමට හැකියාව නොමැත. එබැවින්, සමාගමයේනිදහස ආරක්ෂා කිරීම සඳහා තෙවන පාර්ශවයක් සම්බන්ධ කර ගැනීම තීරණාත්මක වේ. සමහර විට ප්‍රජාව තුළින්ම ආධාර ලැබෙන අතර, අන් අවස්ථාවලදී එය බාහිර මූලාශ්‍ර වලින් ලැබේ. කුමන වාතාවරණයක් යටතේ වුවද, ප්‍රජාවන්ට ඔවුන්ට ලබාගත හැකි තරම් සහයෝගය අවශ්‍ය වේ. එබැවින්, මෙම අභ්‍යන්තර හා බාහිර සහයෝගය තිබීම තීරණාත්මක වේ. මන්දයත්, සමාගමයේ අයිතියට අභියෝග කරන පාර්ශවයන් බලයෙහි වඩා ශක්තිමත් තත්ත්වයක සිටිය හැකි බැවිනි.

සමාගමයේ නිදහසට විරෝධය පාන පාර්ශව සෑමවිටම මහජනයාගේ සතුරෝ නොවෙති. බොහෝ විට යම් පාර්ශවයක් හෝ පාර්ශව ජනතාවට හෝ ඔවුන්ගේ ඉල්ලීම් වලට විරුද්ධ වන්නේ, අයුක්තීන්ගේ සහ කරන ඉල්ලීම් වල ස්වභාවය නිසාය. යම් අවස්ථාවකදී, සමාගමයේ නිදහසට ඇති අයිතියට විරුද්ධ වන පාර්ශවය දේශපාලනඥයින් විය හැකිය. නමුත් අනෙක් අවස්ථාවන්හිදී එම අයිතිය රැක ගැනීමට සටන් කරන පාර්ශවයද ඔවුන්ම විය හැක. එබැවින්, එක් පාර්ශවයක් සමාගමයේ නිදහසෙහි සම්මත සතුරා ලෙස සැලකීම ප්‍රඥාගෝචර නොවේ. බොහෝ අවස්ථා වලදී, ප්‍රජාවක සාමාජිකයින් අයුක්තියට එරෙහි සටනේදී සහාය විය හැකි විභවීය ආධාරකරුවන් ලෙස සලකන පාර්ශවකරුවන්ගෙන් උපකාර ඉල්ලා සිටිය හැක. කෙසේවෙතත්, මෙම නිශ්චිත අයුක්තීන් විසඳීමේදී ප්‍රයෝජනවත් වන පාර්ශවයක් ලෙස පමණක් ප්‍රජාව ඔවුන්ව හඳුනාගනු ඇත. වෙනත් අවස්ථා වලදී, මෙම පාර්ශවයන්ම ප්‍රජාව සමඟ වෙනස් සම්බන්ධතාවක් බෙදාහදා ගැනීම සිදු කළ හැකිය.

බොහෝ ජනතාව සෑමවිටම ප්‍රජා අවකාශය තුළ ක්‍රියාකාරී වීම සහ එහි නිරතවීම නොකරයි. ප්‍රජා අවකාශය තුළ ඔවුන්ගේ මැදිහත්වීම වඩාත් දෘශ්‍යමාන වන්නේ ඔවුන් මුහුණ දෙන අසාධාරණයන්ට විසඳුම් සඳහා සටන් කරන විට ය. සිත්ගන්නා සුළු කරුණ වන්නේ, යම් ප්‍රජාවක නිශ්චිත අවශ්‍යතාවක් සපුරාලීම ඔවුන්ව යළි ප්‍රජා අවකාශය තුළ අක්‍රිය වීමට තල්ලු කළ හැකිය. මන්දයත් අඛණ්ඩව ක්‍රියාකාරීව සිටීමේ සංසන්දනාත්මක වාසියක් ඔවුන් නොදකින බැවිනි. සක්‍රීය සහභාගිත්වය නිසා දේශපාලනික හා ද්‍රව්‍යමය පිරිවැයක් දැරීමට හේතු වන බැවින්, ඔවුන්ගේ කෂණික අවශ්‍යතාවක් ආමන්ත්‍රණය නොකරන්නේ නම්, ක්‍රියාකාරී පුරවැසියෙකු වීමේ ප්‍රතිලාභය ඔවුහු නොදකිති. ඒ අනුව, දෛනික ජීවිතය තුළ මහජන සහභාගිත්වයේ ස්වභාවය මෙය නම්, යහ පාලනය සඳහා අභියෝගයන් වැනි වඩා පුළුල් ගැටලු වෙනුවෙන් නැඟී සිටීමට හා සටන් කිරීමට එම ප්‍රජාවන්ගෙන්ම අපේක්ෂා කිරීම දුෂ්කර විය හැකිය. ප්‍රාදේශීය ප්‍රජාවන් තමන්ගේ එදිනෙදා වාතාවරණයන් හා අරගල වලට සාපේක්ෂව එවැනි පුළුල් සංකල්පයන් තේරුම් ගැනීමට හෝ ඒවාට සම්බන්ධ වීමට අරගල කළ හැකිය.

එසේ වුවද, අසාධාරණයන්ට එරෙහිව පුද්ගලයන්ගේ හුදකලා අරගල පුරවැසිභාවය තියුණු කිරීම සඳහා වන ඔවුන්ගේ දායකත්වය අඩු නොකරයි. මිනිසුන් තමන්ගේ අයිතීන් ගැන, ක්‍රියාවලිය ගැන, ජනතාව ගැන, සහ වඩාත් වැදගත්ව, ප්‍රජා සහභාගිත්වය හරහා යම් අයිතීන් ඔවුන්ට දිනාගත හැකි ආකාරය ගැන ඉගෙන ගනිති. මේවා වඩා හොඳ පාලන ක්‍රමවේදයක් ඇති කරන වඩා විශාල සමාජ ව්‍යාපාරයක් කෙරෙහි තීරණාත්මක පළමු පියවර වේ. මේ අනුව, නිශ්චිත අසාධාරණයන්ට එරෙහිව ජනතාව විසින් ඉදිරිපත් වන විට, ප්‍රජා අවකාශය තුළ සමාගමයේනිදහස හා සහභාගිත්වය වෙනුවෙන් ආයෝජනය කිරීම දිගුකාලීන පද්ධති වෙනසක් සඳහා ඉතා වැදගත් වේ.

අනෙක් අතට, අන්තර් වාර්ගික සබඳතා ප්‍රාදේශීයව ආමන්ත්‍රණය කිරීම රඳාපවතින්නේ ප්‍රාදේශීය සන්දර්භය තුළ ආරක්ෂා කළ යුතු අරමුණක් ලෙස එය කෙතරම් අර්ථවත් වේද යන්න මත ය. ප්‍රාදේශීය පෙදෙස් වල කොන් කිරීමට ලක්වූ ජනවාර්ගික-ආගමික ප්‍රජාවන් මෙවැනි මුලපිරීම් ගැන උනන්දුවක් දක්වන්නේ, සන්දර්භය ඉල්ලා සිටින විට, දැනටමත් ඔවුන්ගේ අයිතීන් හා සමාගමයේ නිදහස සීමාවී ඇති විට ය. කෙසේවෙතත්, දී ඇති ප්‍රදේශයක බහුතර ජනවාර්ගික-ආගමික කණ්ඩායම් වල සාමාජිකයින් එවැනි මුලපිරීම් වලට සහභාගි වීමට අඩු නැඹුරුවක් දක්වන බව පෙනේ. මන්දයත්, ඔවුන්ගේ කණ්ඩායම දී ඇති ඉසව්වේ ජනගහනය තුළ නියෝජනය වන බැවින් ප්‍රජා මට්ටමේ තර්ජනයකට ඔවුන් මුහුණ නොදෙන බැවිනි. යම් ප්‍රදේශයක ජනවාර්ගික-ආගමික සුළුතර කණ්ඩායමකින්/කණ්ඩායම් වලින් ඉල්ලුමක් තිබීම හා ජනවාර්ගික-ආගමික බහුතර කණ්ඩායමකින්/කණ්ඩායම් වලින් ඉල්ලුමක් නොතිබීම ද අන්තර් ප්‍රජා සම්බන්ධතා සාකච්ඡා කිරීමට ප්‍රාදේශීය මට්ටමින් හිතකර ප්‍රජා අවකාශයක් නිර්මාණය කිරීමේ වැදගත්කම අවධාරණය කරයි. අන්තර්-වාර්ගික මුලපිරීම් සඳහා සම්බන්ධ වන පාර්ශවයන්, ආධාරකරුවන් සහ විරුද්ධවාදීන්, ප්‍රාදේශීය මට්ටමින් එදිනෙදා සිදුවන අසාධාරණයන් වෙනුවෙන් සටන් කරන ඓන්ද්‍රියව පිහිටුවා ගත් සාමූහිකයන්ට සම්බන්ධ අයට සමාන නොවිය හැකි බව සඳහන් කිරීම වැදගත් වේ.

මීට අමතරව, විවිධ කණ්ඩායම් අතර, විශේෂයෙන්ම දී ඇති ප්‍රාදේශීය පෙදෙස් වල බහුතර ජනවාර්ගික-ආගමික කණ්ඩායමක්/කණ්ඩායම් අතර, එවැනි මුලපිරීම් සඳහා ඉල්ලුම උත්පාදනය කිරීමට වැඩිදුර

ක්‍රියාමාර්ග අවශ්‍ය විය හැකිය. එක් විකල්පයක් වනුයේ, එදිනෙදා ජීවිතයේ අසාධාරණයන් ආමන්ත්‍රණය කිරීමට උත්සාහ දරන මෙම අන්තර් වාර්ගික මුලපිරීම් ප්‍රාදේශීය මට්ටමින් කරන ලද වෙනත් ඉල්ලීම් සමඟ ඒකාබද්ධ කිරීමයි. කෙසේවෙතත්, ඒවා ඒකාබද්ධ කිරීම මගින් පමණක් හුදෙක් ප්‍රජාවන් එක්සත් කිරීම නොකෙරෙනු ඇත. ජනතාවට තමන්ගේ සෘණාත්මක මතවාද, සිරිත් විරිත්, සහ වෙනත් ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායම් ගැන පූර්ව නිගමන තවදුරටත් පවත්වා ගෙන යන අතරම පොදු අරමුණක් සඳහා එක් විය හැක.

අවසාන කොට, අන්තර්වාර්ගික සමගිය ප්‍රවර්ධනය කරන අතරම, ප්‍රාදේශීය මට්ටමින් සැමදා සිදුවන අසාධාරණයන්ට එරෙහිව සටන් කිරීමට ප්‍රජා අවකාශය ශක්තිමත් කිරීම අවශ්‍ය වශයෙන්ම අත්වැල් බැඳගෙන නොයන බව සඳහන් කිරීම වැදගත් ය. එහෙත් මෙම අරමුණු දෙකෙහි උත්සාහයන් ඒකාබද්ධ කිරීම වැඩියෙන් සමස්තයම ඇතුළත් කරගන්නා පුරවැසිභාවයෙන් අභිමතාර්ථයන් ඉටුකර ගැනීමේ සම්භාවිතාව වැඩි කළ හැකිය.